228 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 228 - இல. 8
**Volume 228 - No. 8**

**2014** අගෝස්තු 22 වන සිකුරාදා
2014 ஓகஸ்ட் 22, வெள்ளிக்கிழமை
**Friday, 22nd August, 2014**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
"බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයින්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
සේවක අර්ථසාධක අරමුදල් අයථා පරිහරණය

**ශෝක ප්‍රකාශය :**
ගරු (මහාචාර්ය) ඒ.වී. සුරවීර මහතා

**කල්තැබීමේ යෝජනාව:**
උමාඔය බහුකාර්ය යෝජනා ක්‍රමය

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
நிலைக்குழு 'பி' : மேலதிக உறுப்பினர்கள்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
ஊழியர் சேமலாப நிதியத்தின் தவறான கையாளுகை

**அனுதாபத் தீர்மானம்:**
மாண்புமிகு (பேராசிரியர்) ஏ.வி. சுரவீர

**ஒத்திவைப்புப் பிரேரணை:**
உமா ஓயா பன்னோக்குத் திட்டம்.

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Standing Committee "B": Additional Members

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Misappropriation of Employees' Provident Fund

VOTE OF CONDOLENCE:
Hon. (Prof.) A.V. Suraweera

ADJOURNMENT MOTION:
Uma Oya Multi-Purpose Project

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2014 අගෝස්තු 22 වන සිකුරාදා***
*2014 ஓகஸ்ட் 22, வெள்ளிக்கிழமை*
*Friday, 22nd August, 2014*

**අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.**
*பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.*
*பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.30 p.m.,*
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I
### "බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
நிலைக்குழு "பி" : மேலதிக உறுப்பினர்கள்
STANDING COMMITTEE "B": ADDITIONAL MEMBERS

### සෙරෙට්සෙ ඛාමා පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
செரெட்சே காமா மன்றம் நம்பிக்கைப்பொறுப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்
THE SERETSE KHAMA FOUNDATION TRUST (INCORPORATION) BILL

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

"සෙරෙට්සෙ ඛාමා පදනම් භාරය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්දිම වීරක්කොඩි මහතා, 139වැනි ස්ථාවර නියෝගය යටතේ ගරු කථානායකතුමා විසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තව ද, එම පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීන් අතිරේක සාමාජිකයින් වශයෙන් ගරු කථානායකතුමා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු පී. දයාරත්න
ගරු සී. ඒ. සූරියආරච්චි මහතා
ගරු සනත් ජයසූරිය මහතා
ගරු වයි.ජී. පද්මසිරි මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු එස්. විනෝ මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු කනක හේරත් මහතා

### II
### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2014 අගෝස්තු මස 22 වන සිකුරාදා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2013 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තා තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය : මූල්‍ය ප්‍රතිපාදන
### ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம் : நிதி ஏற்பாடுகள்
### UNIVERSITY OF SRI JAYEWARDENEPURA : FINANCIAL PROVISION

2689/'12

1. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;
(ii) මෙම විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;
(iii) 2012 වර්ෂය සඳහා එම විශ්වවිද්‍යාලයට වෙන් කළ මුළු ප්‍රතිපාදනවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පවතින ඌනතාවයන් හා අඩු පාඩුකම් සම්පූර්ණ කිරීම සඳහා ඉහත වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් වූයේද;
(ii) එම විශ්වවිද්‍යාලයේ දියුණුව උදෙසා සකස් කළ සංවර්ධන සැලැස්මක් තිබේද;
(iii) එසේ නම්, එම සැලැස්මට අයත් වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக் கழகத்தில் பணியாற்றுகின்ற கல்விசார் பணியாட்டொகுதியினரின் எண்ணிக்கை யாதென்பதையும்;
(ii) இப்பல்கலைக்கழகத்தில் கல்வி கற்கின்ற மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;
(iii) 2012 ஆம் ஆண்டிற்காக இப்பல்கலைக் கழகத்திற்கு ஒதுக்கப்பட்ட மொத்த நிதி ஏற்பாடுகளின் பெறுமதி எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகத்தில் நிலவும் பற்றாக்குறைகள் மற்றும் குறைபாடுகளை நிவர்த்திசெய்வதற்கு மேலே குறிப்பிட்டுள்ளவாறு ஒதுக்கப்பட்டுள்ள நிதி ஏற்பாடுகள் போதுமானதா என்பதையும்;
(ii) மேற்படி பல்கலைக்கழகத்தின் அபிவிருத்திக்காக தயாரிக்கப்பட்ட அபிவிருத்தித் திட்டமொன்று உள்ளதா என்பதையும்;
(iii) ஆமெனில், இத்திட்டத்திற்குரிய வேலைத்திட்டம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he state -
(i) the number of members of the academic staff who serve in the University of Sri Jayewardenepura, at present;
(ii) the number of students who study in this university at present; and
(iii) the value of the total provisions allocated for the aforesaid university for the year 2012?

(b) Will he inform this House -
(i) whether the provisions allocated as mentioned above are sufficient to address the shortages and the deficiencies that exist in the university;
(ii) whether there is a development plan, formulated for the development of the said university; and
(iii) if so, of the programmes incorporated in the plan?

(c) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) 539කි.

(ii) ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 11,084කි.

පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 2,196කි.

බාහිර උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 125,206කි.

මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 138,486කි.

(iii) රුපියල් බිලියන 1.66කි.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) 2011-2015 සංයුක්ත සැලැස්මේ අඩංගු අරමුණු හා කරුණු

| | |
|---|---|
| උසස් ගණයේ මානව සම්පත් ඇති කිරීම | |
| 1 | උපාධි අපේක්ෂක හා පශ්චාද් උපාධි අපේක්ෂකයින්ගේ සහ අනිකුත් වැඩසටහන්වල ගුණාත්මකභාවය ඊට අදාළ තත්ත්වයෙන් වැඩිදියුණු කිරීම. |
| 2 | ඉගෙනීම සඳහා උපකාරී වන මිත්‍රශීලී වාතාවරණයක් ඇති කිරීම. |
| 3 | උසස් අධ්‍යාපන සඳහා අවස්ථා සහ මිත්‍රශීලී වාතාවරණයක් ක්‍රියාත්මක කිරීම. |
| 4 | ශිෂ්‍ය ඉගෙනීමේ පහසුකම් සැලසීම. |
| 5 | ඉගෙනීමේ කටයුතුවලින් බැහැරව අන් කටයුතුවල නිරතවීම උනන්දු කරවීම. |
| පර්යේෂණ හා ප්‍රකාශන මාර්ගයෙන් දායකත්වය වැඩිදියුණු කිරීම | |
| 1 | පර්යේෂණ හා ප්‍රකාශන වැඩිදියුණු කිරීම. |
| 2 | අවශ්‍ය ආකල්ප දැනුම හා නිපුණතාව සඳහා කාර්ය මණ්ඩලය පර්යේෂණ හා විද්‍යාත්මක සන්නිවේදනය ශක්තිමත් කරවීම. |
| 3 | පර්යේෂණ ආධාර තරගකාරී ලෙස ලබා ගැනීම සඳහා අනිකුත් මූලාශ්‍ර මඟින් ලබා ගැනීමේ යන්ත්‍රණයක් බිහි කිරීම. |
| 4 | සිසුන් පර්යේෂණ හා ප්‍රකාශන සඳහා සහභාගිත්වය වැඩි කිරීම. |
| 5 | පර්යේෂණ හා ප්‍රකාශන සඳහා නවීන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. |
| ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා දායකත්වය | |
| 1 | ප්‍රජා සංවර්ධනය සඳහා සුවිශේෂී නියෝජිතයකුගේ ස්වභාවය දැරීම. |
| 2 | අසල්වැසි ග්‍රාමීය ප්‍රජා හා සමාජ කටයුතු සම්බන්ධයෙන් මනා සංවර්ධනයක් ඇති කිරීම. |
| සම්පත් කළමනාකරණය සහ පරිපාලන පද්ධති යාවත්කාලීනව සංවර්ධනය කිරීම | |
| 1 | උසස් ගණයේ මානව සම්පත් ආකර්ෂණය වන පරිදි පවත්වා ගෙන යාම හා සංවර්ධනය කිරීම. |
| 2 | අරමුණු සාර්ථක කර ගැනීම සඳහා වෙනත් සම්පත් නිසි පරිදි ලබා ගැනීම. |
| 3 | සෞන්දර්ය ක්‍රියාත්මක වන සහ ආරක්ෂිත ප්‍රමිතියන්ගෙන් යුත් නිශ්චිත ඉගෙනීමේ හා ක්‍රියාකාරී වාතාවරණයක් ඇති කිරීම. |
| 4 | මනා ඵලදායී නිෂ්පාදනයක් සඳහා පරිපාලන පද්ධතියක් ගොඩ නැඟීම හඳුන්වා දීම. |
| 5 | නව පීඨ හා පවත්නා පීඨ වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම් ගොඩ නැඟීම හඳුන්වා දීම. |
| 6 | පීඨ සහ එක් එක් අධ්‍යනාංශ සංවර්ධනය සඳහා මූල්‍ය උත්පාදන සඳහා උනන්දු කරවීම. |
| 7 | සංයුක්ත සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක වීම සිදු වන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා යන්ත්‍රණයක් සකස් කිරීම. |

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පළමුවෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ හිතවත් ගරු ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක් අහනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ලොකු ජීවයක්, ශක්තියක් ලබා දෙන්න ඉදිරිපත් වුණු ඇමතිවරයෙක්ය කියලා කියනවා. ඔබතුමා කී වතාවක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංචාරය කරලා එහි ඇති අඩු පාඩුකම් සොයා බලා තිබෙනවාද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට මම ඊයේත් ගියා. සාමාන්‍යයෙන් මාසයකට දවසක් විතර මා එහි යනවා. බොහෝ වෙලාවට රෑටයි යන්නේ. ගිහිල්ලා මම බොහොම සතුටෙන් ඉඳලා එනවා. මට කිසි ගැටලුවක් නැහැ. ඒක මගේ විශ්වවිද්‍යාලය; මම ඉගෙන ගත් විශ්වවිද්‍යාලය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මම අහපු ප්‍රශ්නයට නොවෙයි නේ උත්තර දුන්නේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට කී වතාවක් ගිහිල්ලා තිබෙනවාද කියලායි මම ඇහුවේ.

ගරු ඇමතිතුමනි, සුපුරුදු පරිදි මට ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බරපතළ ඌනතා රැසක් තිබෙනවා. ඔබතුමාට මෙයට පිළිතුර එළිපිට කියන්න බැරි බව මා දන්නවා. ඇත්තටම නිදහස් අධ්‍යාපනයෙන් බිහි වුණු දරුවකු හැටියට ඔබතුමාගේ හෘදය සාක්ෂියත් දන්නවා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් යොමු වෙලා නැහැ කියන එක.

විශේෂයෙන්ම මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, දැන් මඟ නැඟුම, මඟ ගැලුම, මඟ ලැගුම, ගම නැඟුම, දැයට කිරුළ වැනි කෝටි ගණන් මුදල් වෙන් කරන ව්‍යාපෘති තිබෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපනයට වාර්ෂිකව මුදල් කැපෙන යුගයක, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ගොඩනැඟීමටත්, විශ්වවිද්‍යාල සිසු පරපුරේ උන්නතිය උදෙසාත් යම් වැඩි මුදලක් ලබා ගන්න ඔබතුමාට බැරි ඇයි?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පසු ගිය අවුරුදු 20 දිහා බැලුවාම අපට පෙනෙනවා මුදල් කැපුවේ අවුරුදු දෙකකදී බව. ඒ 2002 - 2003 අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේදීයි. වෙන කිසිම කාලයක එහෙම මුදල් කැපුවේ නැහැ. අනික් හැම කාලයකම වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩි වුණා. මේ කාලයේ දිගටම අපට දෙන මුදල් ප්‍රමාණය වැඩි වුණා.

[ගරු එස්.බී. දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අලුත්ම අලුත් වෛද්‍ය පීඨය හැදෙනවා. විද්‍යා පීඨයේ වැඩ සියයට 90ක් අවසානයි. පරිපාලන විද්‍යා පීඨය හදලා පසු ගිය දිනවල විවෘත වුණා. අද විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ප්‍රධාන දේශන ශාලා හැදෙනවා. පිට්ටනිය අංග සම්පූර්ණ විධියට හැදෙනවා. පසු ගිය දිනවල අතිගරු ජනාධිපතිතුමාම එම විශ්වවිද්‍යාලයට ගිහින් ජාත්‍යන්තර මට්ටමේ swimming pool එකක් විවෘත කළා. එහි ඉතාම නවීන පුස්තකාලයක් හදලා තිබෙනවා. භාෂාගාර හදා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට කියන්න කැමැතියි, අද ලංකාවේ විශ්වවිද්‍යාල අතර ඉතාම වේගයෙන්ම දියුණු වන සහ වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින විශ්වවිද්‍යාලය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බව.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නයක් අහනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කොයි විධියට රජය සනසන්නට පිළිතුරු ඉදිරිපත් කළත්, ඔබතුමාගේ නායකත්වයෙන් ක්‍රියා කරන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව සිසු පරපුරේ කිසිම තෘප්තියක් නැහැ. මම පුන පුනාම මේ කාරණය අහන්න කැමැතියි. නිදහස් අධ්‍යාපනයේ දරුවෙකු හැටියට, නිදහස් අධ්‍යාපනයෙන් බිහි වී පුංචි තැනේ ඉඳලා ඉහළ තැනකට ආපු පුද්ගලයෙකු හැටියට ඔබතුමාට නිකමටවත් හිතෙන්නේ නැද්ද ජනාධිපතිතුමාට අභියෝගයක් කරලා මේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයටත්, අධ්‍යාපනය ක්ෂේත්‍රයටත් වැඩි මුදලක් වෙන් කරවා ගන්න? දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට වාර්ෂිකව උසස් අධ්‍යාපනයට මුදල් කපන යුගයක ඔබතුමාට ජනාධිපතිතුමාට අභියෝග කරලා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට වැඩි මුදලක් ලබා ගන්න බැරි ඇයි?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔබතුමා මේ කාරණය හොඳට මතක තියා ගන්න. ඇත්තටම විශ්වවිද්‍යාලයට වෙන් කරන මුදල්වලින් අඩුම වශයෙන් සියයට 75ක්වත් මේ වසර තුළ වියදම් කිරීමේ අරගලයකයි අපි ඉන්නේ. අපට වියදම් කරන්න බැහැ. මේ කාරණයත් මතක තියා ගන්න. 1977 ඉඳලා 1994 වෙනකල් එක hostel එකක්වත් එක්සත් ජාතික පක්ෂය හදපු නැති එකේ සාපය අපි අද විඳිනවා. ඒ නිසා අද අපි hostels 64ක් හදනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හාරසිය දෙනෙකුට ඉන්න පුළුවන් තට්ටු හතරේ ඉතාම ඉහළ මට්ටමේ සුඛෝපභෝගී නේවාසිකාගාර 64ක් හදනවා. ඔබතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. විශ්වවිද්‍යාලවලට, උසස් අධ්‍යාපනයට මුදල් කිසිසේත් අඩු කරලා නැහැ. මුදල් එන්න එන්න වැඩි කරනවා. ඒ වාගේම අපට වෙන් කරන මුදල් ප්‍රමාණය සම්පූර්ණයෙන් වියදම් කර ගැනීම අභියෝගයක් වෙලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2-3307/'12-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස හයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 3-3959/'13-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. මා විෂය භාර ඇමතිතුමාගෙන්ම ඒ පිළිතුර ලබා ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලය : වැටුප්
### பல்கலைக்கழக கல்விசாரா பதவியணி : சம்பளம்
### NON-ACADEMIC STAFF IN UNIVERSITIES: SALARIES

4174/'13

4. **ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2013 ජූලි මාසය අවසන් වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල සේවයේ නියුතුව සිටි එක් එක් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින්ගේ බඳවා ගැනීම්වලට අදාළ අවම වැටුප් ප්‍රමාණය කවරේද;

(iii) එම අනධ්‍යයන සේවකයින්ගේ වැටුප් වර්ධක නිර්මාණය වී ඇති ආකාරය කවරේද;

(iv) අනධ්‍යයන සේවකයින්ගේ විවිධ වැටුප් තලයන්ට අදාළ දීමනා කවරේද;

(v) මේ වන විට අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013 யூலை மாத இறுதியளவில் அரச பல்கலைக்கழகங்களில் சேவையில் ஈடுபட்டிருந்த ஒவ்வொரு கல்விசாரா பதவியணியையும் சேர்ந்த ஊழியர் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு;

(ii) பல்கலைக்கழக கல்விசாரா பதவியணி ஊழியர்களின் ஆட்சேர்ப்புடன் தொடர்புடைய ஆகக்குறைந்த சம்பள அளவு யாது;

(iii) மேற்படி கல்விசாரா ஊழியர்களின் சம்பள ஏற்றங்கள் அமைந்துள்ள விதம் யாது;

(iv) கல்விசாரா ஊழியர்களின் பல்வேறு சம்பளப் படிநிலைகளுடன் தொடர்புடைய கொடுப்பனவுகள் யாவை;

(v) தற்போது கல்விசாராப் பதவியணிகளில் நிலவுகின்ற வெற்றிடங்களின் எண்ணிக்கை யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he inform this House of -

(i) the number of employees belonging to each non-academic staff working at the State universities by the end of July 2013, separately;

(ii) the minimum salaries pertaining to the recruitment of employees to the non-academic staffs of universities;

(iii) the manner in which the salary increments of the non-academic employees have been formed;

(iv) the different amounts paid as allowances pertaining to the non-academic employees of different levels; and

(v) the number of vacancies prevailing in the non-academic staff at present?

(b) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க )
(The Hon. S.B. Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

මෙය දීර්ඝ පිළිතුරක්.

(අ) (i) ඇමුණුම I මඟින් ඉදිරිපත් කරමි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු ඇමතිතුමනි, මුළු සංඛ්‍යාව පමණක් කියන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
කොළඹ විශ්වවිද්‍යාලයේ විධායක ශ්‍රේණියේ නිලධාරින් 34යි. ලිපිකරු ශ්‍රේණිවල අය 152යි. තාක්ෂණික සේවයේ 15යි. සහායක හා කම්කරු මට්ටමේ අය 125යි. ඒ විධියට එක් එක් විශ්වවිද්‍යාලවල විස්තර වෙන වෙනම තිබෙනවා.

(ii) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරුවල බඳවා ගැනීම්වලට අදාළ වැටුප් පරිමාණයන් ඇමුණුම IIහි සඳහන් වේ. එහි දක්වා ඇති මූලික වැටුප්වලට අමතරව ඇමුණුම IIIහි දක්වා ඇති දීමනා ද ගෙවනු ලැබේ. ඇමුණුම III මම කියවන්නම්:

| විශ්වවිද්‍යාල සේවකයින් හට හිමි දීමනා | මුදල (මාසිකව රු.) |
|---|---|
| ජීවන වියදම් දීමනාව - සියලුම විශ්වවිද්‍යාල සේවකයින් හට | 7800/- |
| 2012 අයවැය යෝජනා අනුව සියලුම විශ්වවිද්‍යාල සේවකයින් හට ගෙවනු ලබන දීමනාව | මූලික වැටුපෙන් 15% හා 5% ක් |
| 2011/2012 වසරේ විශ්වවිද්‍යාල වලට බඳවා ගනු ලැබූ අතිරේක ශිෂ්‍ය කන්ඩායම වෙනුවෙන් විශ්වවිද්‍යාල වල සියලුම සේවකයින් හට ගෙවනු ලබන දීමනාව | මූලික වැටුපෙන් 20% ක් |
| පූර්ණ කාලීන උප ශාලාධිපතිවරුන්ට | • මූලික වැටුපෙන් 10% ක්<br>• නිල නිවාස හිමි නොවන පූර්ණ කාලීන උප ශාලාධිපතිවරුන්ට ඉහත දීමනාවට අමතරව මූලික වැටුපෙන් 5% ක නිවාස දීමනාව |
| පර්යේෂණ දීමනාව | මූලික වැටුපෙන් 35%<br>• U-AC 3, U-AC 4, U-AC 5. වැටුප් කේතයන්ට අයත් වන අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නොවන නිලධාරින්<br>• විශ්වවිද්‍යාල වල වෛද්‍ය මධ්‍යස්ථාන වල සේවයේ නියුතු වෛද්‍ය/ දන්ත වෛද්‍යවරුන්<br>• U-EX 2, U-EX 2a, U-EX 3 වැටුප් කේතයන්හි සේවය කරන මධ්‍ය මට්ටම හා ඉන් ඉහල විධායක ශ්‍රේණියේ නිලධාරින් |

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අවම වැටුප කීයද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, අවම වැටුපයි අහන්නේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අවම වැටුප මටත් සොයා ගන්න බැහැ. ඊළඟ ප්‍රශ්නයට පිළිතුර බලමු. මෙකේ codes දීලා තිබෙන්නේ. මටත් තේරෙන්නේ නැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

(අ) (iii)ට පිළිතුර කියන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම මඟින් නිර්දේශිත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත වැටුප් හා වැටුප් වර්ධක ප්‍රමාණයක් ඇමුණුම IIහි වේ.

(iv) ඇමුණුම III හි දක්වා ඇත.

(v) ඇමුණුම IV හි දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

ඇමුණුම් I, II සහ IV **සභාගත*** කරමි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, එකම තනතුරකට වැටුප් තල දෙකකින් මූලික වැටුප තිබෙන්න පුළුවන්ද? එහෙම තිබෙනවාද කියලා ඔබතුමා මට කියන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මට තේරුණේ නැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

එකම තනතුරක ඉන්නා විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයින්ගෙන් එක කණ්ඩායමකට එක වැටුප් තලයකුත්, තව කණ්ඩායමකට තව වැටුප් තලයකුත් තිබෙනවා. ඒ නිසා මේ වන කොට ඒ සම්බන්ධයෙන් විශාල අර්බුදයක් තිබෙනවා. ඔබතුමා දන්නවා ඒ අර්බුදය ගැන. ජනාධිපතිතුමා පත් කළ කොමිෂන් සභාවක් විසින් මූලික වැටුපේ වැඩිවීමක් කරනවාය කියලා, කලින් වැටුපටම ගියා. නමුත් පසු ගිය අවුරුද්දේ ජූලි මාසයට කලින් උද්ඝෝෂණය කළ කට්ටියට රුපියල් 15,000 දක්වා වැඩි කළා. ජූලි මාසයෙන් පස්සේ එම තනතුරටම බඳවා ගත්ත අයගේ මූලික වැටුප නැවත රුපියල් 14,150ට ගිහින් තිබෙනවා. දැන් මේ එකම තනතුරේ මූලික වැටුප, වැටුප් දෙකක්. එක කාණ්ඩයකට රුපියල් 15,470යි. අනෙක් කාණ්ඩයට -ඊට පස්සේ ගන්න අයට- රුපියල් 14,150යි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු මන්ත්‍රීතුමිය, ඒක වෙන්න පුළුවන්. විශ්වවිද්‍යාලය තීන්දු කරනවා නම්- [බාධා කිරීමක්]

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

එකම තනතුරට?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඔව්. සුදුසුකම් වෙනස් කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට කිව්වොත්, අපි අටවන ශ්‍රේණිය සමත් අය තමයි රියැදුරන් හැටියට ගත්තේ. දැන් අපි රියැදුරන් හැටියට ගන්නේ අ.පො.ස. (සාමාන්‍ය) පෙළ සමත් අය. එතකොට ඒ අයව වෙන වැටුප් තලයක තියන්න පුළුවන්. කාර්මික නිලධාරින් හැටියට ගන්න කොට -[බාධා කිරීමක්]

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු ඇමතිතුමා,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක නිවැරදි කර ගැනීමක්. මොකද, එතුමා -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමිය, ප්‍රශ්න වැල් අහන්න බැහැ. ගරු ඇමතිතුමා කියන දේ තමයි උත්තරය. ඔබතුමිය දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වැඩි සුදුසුකම් සහිතව පසුව ගන්නා රියැදුරන්ට වැඩි වැටුපක් දෙනවා කියලා. නමුත් මෙහිදී සිදු වෙලා තිබෙන්නේ, කලින් ගත්ත අයට වැටුප රුපියල් 15, 150යි, අලුතෙන් ගන්නා අයට වැටුප රුපියල් 14,150යි. මේ තමයි වෙනස. අලුතින් ගන්නා අයට ලබා දෙන වැඩි වැටුපක් ගැන නොවෙයි, කලින් ගත්ත අයට දෙන වැඩි වැටුපක් ගැනයි කථා කරන්නේ. මේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීමක්] පරස්පර විරෝධී වැටුපක්. මම අහන්නේ ජනාධිපතිතුමා පත් කළ, කොමිෂන් සභාවට එරෙහිව ඔබතුමාට කථා කිරීමට බැරිද, තමුන් යටතේ සේවය කරන අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින් වෙනුවෙන්?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඔය කියන කාරණයට අදාළ සේවක වෘත්තීය සමිතිය සහ අපි අතර ඉතාම හොඳ සංවාදයක් තිබෙනවා. දැනට සුමානයකට කලින් එක -[බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමිය, ගරු ඇමතිතුමාට පිළිතුරු දීමට අවස්ථාව දෙන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

දැනට සුමානයකට කලිනුත් අපි මේ වෘත්තීය සමිති ඒකාබද්ධ බලමණ්ඩලයත් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡාවක් කළා. වැටුප් සහ තනතුරු පිළිබඳ කොමිෂන් සභාවේ සමහර නිර්දේශ පිළිබඳව පරස්පරතා තිබෙනවා. ඒ අයගේ නිර්දේශ පිළිබඳව යම් යම් විවේචන තිබෙනවා. අපි දැන් ඒ අයත් සමඟ සාකච්ඡා කරමින් ඉන්නවා. වැටුප් විෂමතා අවම කරන්න කියලා හැදූ වැඩ පිළිවෙළ තුළින් ඒ විෂමතාවන් බොහෝ දුරට අඩු කරලා තිබෙන අතර, තව සමහර තැන්වලදී සේවකයෝ කාරණා මතු කරනවා. උදාහරණයක් හැටියට technical officersලා ගනිමු. Technical officersලාගේ වැටුප් තලය සාමාන්‍යයෙන් අනෙකුත් රාජ්‍ය ආයතනවල technical officersලාගේ වැටුප් තලයට වඩා ටිකක් අඩුවෙන් තිබුණේ. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යෝජනා කළා මේ අයගේ සුදුසුකම් වැඩි කරන්න කියලා. මේ අයගේ සුදුසුකම GCE O/L නොවෙයි, GCE A/L කරන්න. ඒ වාගේම, science විෂයන් 3ක් සමත් වුණු සුදුසුකම මත මේ අය බඳවා ගන්න.

සිංහල, ඉංග්‍රීසි හා ගණිතය කියන තුනටම සම්මාන ඉල්ලන්න කියලායි යෝජනා කළේ. මේ වාගේ ඒවා කළාම ඒ අයගේ වැටුප්- [බාධා කිරීමක්]

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ඒ අයගේ තනතුර එකම ද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඔව්, ඔව්. තනතුර එකමයි. හැබැයි ඒ අය පරණ සේවකයෝ. අලුත් සේවකයන් වශයෙන් ගන්නේ ඊට වඩා ඉහළ සුදුසුකම් තිබෙන අය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා, මා මේ අවස්ථාවේ මේ ප්‍රශ්නය නහන්න එකම හේතුව මේකයි. මේ වන කොට ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් පවා පෙන්නුම් කරනවා හතර දෙනකුගෙන් යුක්ත පවුලක අවම වියදම රුපියල් 49,000යි කියලා. නමුත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ අනධ්‍යයන සේවකයකුට ලැබෙන මූලික වැටුප රුපියල් 14,150යි. ඔබතුමා කිව්වා දීමනා රුපියල් 7,800යි කියලා. දීමනා රුපියල් 7,800 නම්, රුපියල් 22,000ක් තමයි මාසෙකට ලැබෙන්නේ. මෙවැනි තත්ත්වයක් උඩ දෙවන භාෂා දීමනාව අනධ්‍යයන සේවකයන්ට නොලැබීම සාධාරණද? කැබිනට් මණ්ඩලයෙන් තීරණයක් අරගෙන එම දීමනාව නවත්තලා තිබෙනවා. මේක සාධාරණද? මේකට හේතුව මොකක්ද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

අපි ඒ පිළිබඳව සාකච්ඡා කරමින් යනවා. සාමාන්‍යයෙන් රාජ්‍ය සේවයේ අනෙකුත් ආයතනවල, දෙපාර්තමේන්තුවල සේවකයන්ට වඩා විශ්වවිද්‍යාලවල වැටුප් තල ඉහළින් තිබෙන්නේ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ඉහළයි කියන්නේ කොහොමද ඇමතිතුමා-

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

රජයේ ලිපිකරුවකුට වඩා විශ්වවිද්‍යාල ලිපිකරුවකුගේ වැටුප ඉහළින් තිබෙන්නේ. රජයේ කම්කරුවකුට වඩා විශ්වවිද්‍යාල කම්කරුවකුගේ වැටුප ඉහළින් තිබෙන්නේ. රජයේ කාර්මික නිලධාරියකුට වඩා විශ්වවිද්‍යාල කාර්මික නිලධාරියකුගේ වැටුප ඉහළින් තිබෙන්නේ. රජයේ සහකාර ලේකම්වරයකුට වඩා විශ්වවිද්‍යාල ලේකම්වරයකුගේ වැටුප ඉහළින් තිබෙන්නේ. ඒකයි කියන්නේ.

## රුසියානු තානාපති කාර්යාලය සඳහා ඉඩම් පවරාගැනීම : විස්තර

ரஷ்ய தூதரகத்துக்காகச் சுவீகரிக்கப்பட்ட காணி : விபரம்

ACQUISITION OF LANDS FOR RUSSIAN EMBASSY : DETAILS

4623/'13

6. **ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රුසියානු තානාපති කාර්යාලයට ලබා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික ඉඩමක් පවරා ගෙන තිබේද;

(ii) එම පවරා ගැනීම සිදු කර ඇති පදනම කවරේද;

(iii) රුසියානු තානාපති කාර්යාලය සඳහා ලබා දීමට නියමිත ඉඩමේ මුළු බිම් ප්‍රමාණය කොපමණද;

(iv) පෞද්ගලික ඉඩම් පවරා ගෙන වෙනත් ආයතන සඳහා විකිණීම සදාචාරාත්මක කටයුත්තක් වන්නේද;

(v) පවරා ගන්නා ලද ඉඩම්, පවතින නීතිය යටතේ පොදු කටයුත්තක් සඳහා හැර වෙනත් කාර්යයකට භාවිත කිරීමට හැකියාව තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ඉඩම් පවරා ගැනීමෙන් පසු එම ඉඩම්වල සිටි පදිංචිකරුවන්ට ලබා දී ඇති වන්දි මුදල කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ரஷ்ய தூதரகத்துக்கு பெற்றுக்கொடுப்பதற்காக நகர அபிவிருத்தி அதிகாரசபை தனியார் காணியொன்றைச் சுவீகரித்துள்ளதா என்பதையும்;

(ii) மேற்படி சுவீகரிப்பு மேற்கொள்ளப்பட்டுள்ள அடிப்படை யாதென்பதையும்;

(iii) ரஷ்ய தூதரகத்துக்குப் பெற்றுக்கொடுக் கப்படவுள்ள காணியின் மொத்தப் பரப்பளவு எவ்வளவென்பதையும்;

[ගරු සුජීව සේනසිංහ මහතා]

(iv) தனியார் காணியொன்றைச் சுவீகரித்து வேறொரு நிறுவனத்திற்கு விற்பனை செய்தலானது நாகரிகமானதொரு செயலாகுமா என்பதையும்;

(v) சுவீகரிக்கப்பட்ட காணிகளை, நடைமுறையிலுள்ள சட்டத்தின்கீழ் பொதுப் பணியொன்றுக்காகவன்றி வேறொரு பணிக்காகப் பயன்படுத்துவதற்கான இயலுமை காணப்படுகின்றதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி காணி சுவீகரிக்கப்பட்டதன் பின்னர் இக்காணிகளில் வசித்தவர்களுக்கு பெற்றுக் கொடுக்கப்பட்ட இழப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) whether a private land has been taken over by the Urban Development Authority, to be provided to the Russian Embassy;

(ii) the basis on which the said taking over has been done;

(iii) the total extent of the land to be provided for the Russian Embassy;

(iv) whether it is ethical to take over private lands and sell the same to other institutions; and

(v) whether it is possible under the current law to utilize the lands taken over, for some other purpose than a public purpose?

(b) Will he also state the amount paid as compensation to the former residents of the said lands after taking over the same?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත. රජයේ ඉඩම් කොටසක් පවරා ගැනීමට කටයුතු කෙරේ.

(ii) පවරා ගැනීමට කටයුතු කරන ඉඩම් කොටස රජයේ ඉඩමක් බැවින් රජයේ ඉඩම් ආඥාපනතේ 6(1) වගන්තියේ විධිවිධාන යටතේ පවරා ගැනීමේ කටයුතු කෙරමින් පවතී.

(iii) අක්කර 5යි, රූඩ් 3යි, පර්චස් 34.68

(iv) පෞද්ගලික ඉඩම් පවරා ගැනීමක් මෙහිදී සිදු වී නොමැත.

(v) රාජ්‍ය තාන්ත්‍රික අවශ්‍යතාවක් මත රජයේ ඉඩමක් වෙන් කිරීම පොදු කටයුත්තක් ලෙස සැලකිය යුතු අවශ්‍යතාවකි.

(ආ) පදිංචිකරුවන්ට විකල්ප නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. ඔවුන්ට ඉඩම්වල අයිතියක් නොමැති බැවින්, වන්දි ගෙවීමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

(ඇ) අදාළ නැත.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ ඉඩම්වලට අදාළ සේවා දායකයෝ මගේ ළඟට ආවා සියලු ඔප්පු තිරප්පු සහිතව. මේක පෞද්ගලික ඉඩමක් බව ඒ සින්නක්කර ඔප්පුවලින් නිරාකරණය වනවා. මගේ නීතිඥ දැනුම අනුව, මේක පෞද්ගලික ඉඩමක් බවයි මට දැනුණේ. මේ ඉඩමට අදාළ ඔප්පු තිරප්පු ටික කොතැනකට හෝ ඉදිරිපත් කරන්න ඔබතුමා මට අවස්ථාවක් ලබා දෙනවාද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඇත්ත වශයෙන්ම ඔබතුමා කියනවා නම් ඒක පෞද්ගලික ඉඩමක් කියලා, ඒ පිළිබඳ විස්තර රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන්න. මා එතුමාට දන්වන්නම් ඔබතුමා එතුමාට ඒවා ඉදිරිපත් කරයි කියලා. එතකොට මේ ප්‍රශ්නයට දීපු පිළිතුරේ වැරැද්දක් තිබෙනවා නම් ඒකත් අපට විසඳා ගන්න පුළුවන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමනි. මගේ දෙවන අතුරු ප්‍රශ්නයට ඔබතුමාගේ දැනුමෙන් උත්තරයක් බලාපොරොත්තු වනවා. විශේෂයෙන් නීතිඥවරයකු හැටියට ඔබතුමාත් මේ කාරණය දන්නවා. ආණ්ඩුවට පෞද්ගලික දේපොළක් පවරා ගන්න පුළුවන් පොදු කාර්යයක් සඳහා විතරයි. හැබැයි ගරු ඇමතිතුමනි, මේ "පොදු කාර්ය" කියන නිර්වචනය දැන් වෙනස් වෙලා, "මේ ප්‍රදේශය අවලස්සණයි, මේ ප්‍රදේශයේ වෙනසක් වෙන්න ඕනෑ" කියලා මෙවැනි පවරා ගැනීම් කරනවා. පොදු කාර්යයකට පවරා ගැනීමේදී, ඒ ඉඩම පමණයි ඒ පොදු කාර්යය සඳහා පවරා ගන්න පුළුවන්. ඒ කාර්යයට අවශ්‍ය වන්නේ ඒ ඉඩම පමණයි කියන එක ආණ්ඩුව ඔප්පු කරන්න ඕනෑ.

හැබැයි, දැන් එහෙම නැතිව කොළඹ ප්‍රදේශයේ ගොඩක් ස්ථානවල පෞද්ගලික ඉඩම් "පොදු කාර්යය" යටතේ පවරාගෙන යනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමාට අලුතින් පැහැදිලි කිරීමක් දෙන්න පුළුවන්ද? ඒ වාගේම, පොදු කාර්යයක් වනකොට අයිතිකාරයන්ට -ඒ පෞද්ගලික ඉඩම අයිති පුද්ගලයාට- අවස්ථාව තිබෙන්න ඕනෑ, මේ ඉඩමට වෙනුවට මෙන්න මේ ඉඩම ගන්න පුළුවන් කියලා Section 2 notice එකෙන් සඳහන් කරන්න. ගරු ඇමතිතුමනි, මේ හේතුව නිසා පුද්ගලයන්ගේ පෞද්ගලික ඉඩම්වල අයිතිය නැති වෙලා යනවා. විශේෂයෙන්ම කොම්පඤ්ඤ විදියේත් මේක සිදු වුණා. බොරැල්ලේත් එවැනි ස්ථානයකට මම ගියා. ඒවාත් පෞද්ගලික ඉඩම්. ගරු ඇමතිතුමනි, අපේ රටේ, "පොදු කාර්යය" කියන එකේ නිර්වචනය වෙනස් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ නීතිඥ දැනුමත් එක්ක මට සහයෝගයක් දෙන්න ඒ සම්බන්ධයෙන් නිර්වචනයක් කරගන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් නීතිඥයෙක්. මෙහි අවසාන නිර්වචනය දෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. The final interpretation lies with the Supreme Court. කෙනෙකුගේ ඉඩමක් පවරා ගැනීම සඳහා අයිතිවාසිකමක් රජයට නැත්නම් යම් කෙනෙකුට ඒ පිළිබඳව challenge කරන්න පුළුවන්; අභියෝගයට ලක් කරන්න පුළුවන්. ඒ ප්‍රතිපාදන ඒ පනතේම තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එවැනි අභියෝගයක් කරලා ඒ නිර්වචනය ලබා ගන්න එක තමයි නිවැරදි වෙන්නේ. එහෙම නැතිව, මගේ නිර්වචනය පිළිගන්න පුළුවන්කමක් නැහැ. අවසානයේදී අපි සියලු දෙනාම ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්වචනයෙන් බැඳී ඉන්නවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිතුරට ගාස්තු ගෙවනවාද? තුන් වන අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගාස්තුත් ගෙවනවා. තුන්වන ප්‍රශ්නයත් අහනවා.

ගරු ඇමතිතුමනි, ඇත්තෙන්ම ඔබතුමාගේ ප්‍රතිචාර ගොඩක් හොඳයි. ඔබතුමාගේ ප්‍රදේශයේ ජනතාව ඔබතුමාට ගොඩක් ආදරෙයි. ගරු ඇමතිතුමනි, ඇත්තෙන්ම කියන්නත් කනගාටුයි. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් මිනිසුන්ට ඔය කාරණය කියා ගන්නවත්, වෙන ඉඩමක් ගැන සඳහන් කරන්නවත් අවස්ථාවක් ලැබුණේ නැහැ. මම මේ ශ්‍රේෂ්ඨාධිකරණය විවේචනය කරනවා නොවෙයි. රටේ නීති පද්ධතිය අනුව, Public Purpose කියන කාරණය යටතේ ජනතාවගේ අවශ්‍යතාවක් සඳහා කාගේ හරි පෞද්ගලික ඉඩමක් පවරා ගන්න පුළුවන්.

හැබැයි එහෙම නැතුව, "මේ ප්‍රදේශය දියුණු වෙන්න ඕනෑ.", මේ ප්‍රදේශයේ තිබෙන ගෙවල් කැතයි." කියලා, එහෙම පවරා ගන්න පිළිවෙතක් නැහැ, ඇමතිතුමනි. සංවර්ධනය වෙන්නත් ඕනෑ. අපි එය පිළිගන්නවා. හැබැයි මීට වැඩිය ක්‍රමානුකූලව මේ කාර්ය භාරය සිදු වෙන්න ඔබතුමන්ලාගේ සහායත් අපි බලාපොරොත්තු වෙනවා. මොකද, අපට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මේ සහාය ලබා ගන්න බැහැ. අප ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තැම්බිලා, පොඩිවෙලා, පහරකාලා ඉන්න පිරිසක්.

ඔබතුමාගේ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුරයත්, ඒ වාගේම ඔබතුමාට තිබෙන වගකීම් සම්භාරයත් එකතු කරලා ජනතාවට ආදරය කරන ඇමතිවරයෙක් වශයෙන් ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ "පොදු කාර්යය" කියන වචනය මීට වඩා පොඩ්ඩක් පැහැදිලි කරලා ජනතාවගේ පෞද්ගලික ඉඩම් රජයට පවරා ගැනීමේදී මීට වඩා සැලකිලිමත් වෙන්න කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු කාර්යය පිළිබඳව මම කිව්වේ ඒකයි. ගරු මන්ත්‍රීතුමනි, 'පොදු කාර්යය' යන්නෙහි ඔබතුමන්ලාගේ නිර්වචනයත්, රජය යම් සංවර්ධන කාර්යයක් කිරීම සඳහා ගන්නා නිර්වචනයත් අතර යම් පරස්පර විරෝධීතාවක් තිබෙන්නට පුළුවන්. නමුත් රජය මේ සියල්ල කරන්නේ සද්භාවයෙන්; මේ රටේ යටිතල පහසුකම්වල දියුණුව හා ප්‍රදේශවල දියුණුව සඳහායි. ඔබතුමා දැන් දන්නවා, ඔබතුමා ජීවත් වන මේ ප්‍රදේශය ඉතා අලංකාර හා සනීපාරක්ෂාව අතින් හිතකර ප්‍රදේශයක් බවට පත් කරන්න රජය මොන තරම් කටයුතු කර තිබෙනවාද කියලා. එහෙම කටයුතු කරන කොට යම් යම් ගැටලු සහ ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. We have to look at it from a broader perspective.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
පොදු කාර්යයක් සඳහා දෙන්නේ පෞද්ගලික ආයතනවලට; 'ටාටා' ආයතනය වැනි වෙනත් පෞද්ගලික ආයතනවලට.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8, 4761/'14 - (1). ගරු අශෝක් අබේසිංහ මහතා

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මීට අදාළ ගරු ඇමතිවරයා සිටින වෙලාවක ඇසීමට මා කැමැතියි. මොකද, ඒ ප්‍රදේශයේ කුකුළු ව්‍යාපාරය තිබෙන නිසා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු සූදානම්. නමුත් ගරු මන්ත්‍රීතුමනි, අදාළ අමාත්‍යවරයා සිටින වෙලාවක මෙම ප්‍රශ්නය අහන්න. ඔබතුමා ඉල්ලන ආකාරයට කටයුතු කිරීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි සති දෙකක කාලයක් ලබා දෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10 - 4907/'14- (1), ගරු තිස්ස අත්තනායක මහතා.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති 4ක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පෝෂණවේදීන් : විස්තර
### சத்துணவு வல்லுநர்கள் : விபரம்
### NUTRITIONISTS : DETAILS

5028/'14

11. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේදී පෝෂණවේදියකු විසින් ඉටු කරනු ලබන කාර්ය භාරය කවරේද;

(ii) සෞඛ්‍ය සේවය තුළ සිටිය යුතු පෝෂණවේදීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට රජයේ රෝහල්වල සේවය කරනු ලබන පෝෂණවේදීන් සංඛ්‍යාව කොපමණද;

(iv) රජයේ රෝහල් සඳහා අවශ්‍ය පෝෂණවේදීන් සංඛ්‍යාව මෙතෙක් බඳවා නොගැනීමට හේතු කවරේද;

(v) රෝගීන්ට වඩා හොඳ ප්‍රතිකාර සේවාවක් ලබාදීම සඳහා අවශ්‍ය පෝෂණවේදීන් සංඛ්‍යාව කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மருத்துவ சிகிச்சை வழங்கப்படுகின்றபோது சத்துணவு வல்லுநர் ஒருவரால் ஆற்றப்படுகின்ற பணிகள் யாவை என்பதையும்;

(ii) சுகாதார சேவையினுள் இருக்க வேண்டிய சத்துணவு வல்லுநர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) தற்போது அரசாங்க மருத்துவமனைகளில் சேவையாற்றுகின்ற சத்துணவு வல்லுநர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) அரசாங்க மருத்துவமனைகளுக்குத் தேவையான அளவு சத்துணவு வல்லுநர்களை இதுவரை ஆட்சேர்க்காதுள்ளமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) நோயாளர்களுக்கு மிகச் சிறந்ததொரு மருத்துவ சேவையை வழங்கும்பொருட்டு தேவையான அளவு சத்துணவு வல்லுநர்களை துரிதமாக ஆட்சேர்ப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state -

(i) the nature of the role of a nutritionist in provision of medical treatments;

(ii) the number of nutritionists that must be in service in the field of healthcare;

(iii) the number of nutritionists working in government hospitals at present;

(iv) the reason for not recruiting nutritionists to fulfill the requirement at the government hospitals to date; and

(v) whether action will be taken to recruit immediately the number of nutritionists required to provide better service to the patients?

(b) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කැමැතිද අදාළ අමාත්‍යතුමා ඉන්න අවස්ථාවකදී මේ ප්‍රශ්නය අහන්න?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

කමක් නැහැ, ඔබතුමා හිටපු සෞඛ්‍ය ඇමතිනේ. ඔබතුමා උත්තර දෙන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) · රෝහල්වල නේවාසික රෝගීන් හා බාහිර රෝගීන් සඳහා විශේෂ ආහාර සැලසුම් කිරීම සහ උපදෙස් දීම.

· මුළුතැන් ගෙයි සෞඛ්‍ය හා ආහාර පිළිබඳව කටයුතු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමින් එහි කාර්ය මණ්ඩලයට පූර්ව සේවා සහ සේවාස්ථ පුහුණුවක් ලබා දීම.

· ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන විෂයයට අදාළ අනෙකුත් රාජකාරි.

(ii) අනුමත සේවක සංඛ්‍යාව 45කි.

(iii) දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 4කි.

(iv) මෙම තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 06/2006 අනුව නව බඳවා ගැනීම් පටිපාටිය අනුමත වී ඇති අතර, ඒ අනුව බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

(v) ඔව්. එම බඳවා ගැනීමේ තරග විභාගය 2014 අගෝස්තු මස 16වැනි දින පවත්වන ලදී.

(ආ) පැන නොනඟී.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු සෞඛ්‍ය ඇමතිතුමාටත් මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. විශේෂයෙන් මට පෙන්වා දෙන්න ඕනෑ වුණේ මේකයි. අපේ රටේ කෝටි දෙකකට වැඩි ජනගහනයක් ඉන්නවා. පෝෂණවේදීන්ගේ අවශ්‍යතාව දැඩිව තිබෙනවා. ගරු ඇමතිතුමාම දැන් ප්‍රකාශ කළ පරිදි රජයේ සියලුම රෝහල්වල පෝෂණවේදීන් 4දෙනයි ඉන්නේ. Cadre එකට අනුව සෞඛ්‍ය සේවය තුළ සිටිය යුතු පෝෂණවේදීන් සංඛ්‍යාව 45යි කියා ඔබතුමා දැන් ප්‍රකාශ කළා. අප විශ්වාස කරනවා, ඉතා ඉක්මනින් -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඉතා ඉක්මනින් පුරප්පාඩු පිරවීමට කටයුතු කරනවා. ඔබතුමා මේ ප්‍රශ්නය ඇසීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, රිකිල්ලගස්කඩ කාන්තාවක් මිය ගියා, එබෝලා වෛරසය ශරීරගත වීමෙන්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක අපේ Consultative Committee එකේදි අහන්න.

## මොරටුව විශ්වවිද්‍යාලය : විස්තර
## மொரட்டுவைப் பல்கலைக்கழகம் : விபரம்
## UNIVERSITY OF MORATUWA : DETAILS

2690/'12

12.**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොරටුව විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම විශ්වවිද්‍යාලයේ නිර්මාතෘවරුන් කවුරුන්ද;

(iii) මේ වන විට එම විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල එකී විශ්වවිද්‍යාලයට 2011 වර්ෂයේදී වෙන්කළ මුදලට සාපේක්ෂව අඩු වී හෝ වැඩිවී ඇති ප්‍රමාණය කොපමණද;

(iii) මොරටුව විශ්වවිද්‍යාලයේ සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කර දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொரட்டுவைப் பல்கலைக்கழகம் ஆரம்பிக்கப் பட்ட ஆண்டு யாதென்பதையும்;

(ii) இப்பல்கலைக்கழகத்தின் ஸ்தாபகர்கள் யாவரென்பதையும்;

(iii) தற்போது இப்பல்கலைக்கழகத்தில் கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2 0 1 2ஆம் ஆண்டுக்காக மொரட்டுவைப் பல்கலைக்கழகத்திற்கு ஒதுக்கப்பட்ட பணத் தொகை யாதென்பதையும்;

(ii) மேற்படி பல்கலைக்கழகத்திற்கு 2011ஆம் ஆண்டு ஒதுக்கப்பட்ட பணத்தொகைக்கு ஒப்பீட்டளவில் இப்பணத்தொகை அதிகரித் துள்ள அல்லது குறைவடைந்துள்ள அளவு எவ்வளவு என்பதையும்;

(iii) மொரட்டுவைப் பல்கலைக்கழகத்தின் மாணவர்களுக்கு தரம்வாய்ந்த வகையில் கல்வி புகட்டுவதற்கு போதியளவு நிதி ஒதுக்கப் பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he state -

(i) the year in which the University of Moratuwa was founded;

(ii) the founders of the aforesaid university; and

(iii) the number of students who study in the aforesaid university at present ?

(b) Will he inform this House -

(i) the amount of money allocated for the University of Moratuwa for the year 2012;

(ii) the amount by which the aforesaid allocations have been increased or reduced in comparison to the allocation made for the aforesaid university in the year 2011; and

(iii) whether sufficient allocations have been made to provide a qualitative education for the students of the University of Moratuwa ?

(c) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1972 පෙබරවාරි 15 වන දින ආරම්භ කළ කටුබැද්ද මණ්ඩපය 1979 ජනවාරි 01 වන දින මොරටුව විශ්වවිද්‍යාලය ලෙස නම් කර ඇත.

[ගරු එස්.බී. දිසානායක මහතා]

(ii)

| නම | තනතුර |
|---|---|
| එල්.එච්.සුමනදාස මහතා | සභාපති, කටුබැද්ද මණ්ඩපය. |
| ටී. ධර්මරාජා මහතා | වැඩබලන නියෝජ්‍ය ලේඛකාධිකාරි, කටුබැද්ද මණ්ඩපය. |
| මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්ලිව්. පෙරේරා මහතා | පීඨාධිපති, ඉංජිනේරු හා වාස්තු විද්‍යා පීඨය, කටුබැද්ද මණ්ඩපය. |
| ආතර් සී. ක්ලාක් මහතා | කුලපති, මොරටුව විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය යූ.එස්. කුරුප්පු මහතා | උපකුලපති, මොරටුව විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය සී. පටුවතවිතාන මහතා | පීඨාධිපති, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය කේ.ආර්.එස්. පීරිස් මහතා | පීඨාධිපති, වාස්තුවිද්‍යා, නගර හා ග්‍රාම නිර්මාණ පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය පී.ඩී. ගුණතිලක මහතා | පීඨාධිපති, භෞතික හා ව්‍යවහාරික විද්‍යා පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය. |

(iii) ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යාව 5,974කි.

පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යාව 2,446කි.

බාහිර උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යාව 368කි.

මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 8,788කි.

(ආ) (i) රුපියල් බිලියන 1.232කි.

(ii) පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 60කින් වැඩි වී ඇති අතර, ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 86කින් අඩු වී ඇත.

(iii) ඔව්.

(ඇ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේම පිළිතුර අනුව සඳහන් වුණා, ප්‍රාග්ධන වියදම් කප්පාදුවක් සිදු වෙලා තිබෙන බව. මම හිතන විධියට ලෝකයේම විශිෂ්ටතම විශ්වවිද්‍යාලයක් හැටියට සලකන්නට පුළුවන් එකක් තමයි මොරටුව විශ්වවිද්‍යාලය. ආශ්චර්යමත් රජය දැනුමේ කේන්ද්‍රස්ථානයක් ගොඩනඟන්නට කටයුතු කරන්නේ මුදල් කප්පාදුව තුළින්ද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධ තාක්ෂණ විශ්වවිද්‍යාලයක් රුපියල් බිලියන 17.3ක වියදමින් ගොඩනැඟෙමින් තිබෙනවා. දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තමයි මේක ගොඩනැඟෙන්නේ. ඒක අපි කටුබැද්ද විශ්වවිද්‍යාලයට භාර දෙනවා. ඒ නිසා තමයි අනෙකුත් ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය අඩු කළේ. මොකද, රුපියල් බිලියන 17.3ක වියදමෙන් ගොඩනැඟෙන තාක්ෂණ විශ්වවිද්‍යාලය කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කරලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඉංජිනේරු පාඨමාලාව හදාරණ ශිෂ්‍යයන්ට මාස 06ක බාහිර පුහුණුවක් ලබා දෙනවා. එම පුහුණුව සඳහා ඒ අය රට වටේම යනවා. හැබැයි ඒ අයට මහපොළ ශිෂ්‍යත්වය ලබා ගන්නට campus එකටම පැමිණෙන්නට ඕනෑ.

විශ්වවිද්‍යාලයට ඇවිල්ලා අත්සන් කරලා තමයි ඒ මුදල ලබා ගන්නට සිද්ධ වෙන්නේ. දැන් මේ අය ප්‍රායෝගික පුහුණුවකට යාපනය වාගේ ප්‍රදේශයකට ගියොත්, ඒ අය ආපසු මොරටුව විශ්වවිද්‍යාල පරිශ්‍රයට එන්න ඕනෑ, ශිෂ්‍යත්ව අරමුදල ලබා ගන්න. බොහොම අසාධාරණ ක්‍රමවේදයක්. මේ අසාධාරණ ක්‍රමවේදය නිවැරදි කරන්නට ඔබතුමා කටයුතු කරන්නේ කවදා ද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඔය කියන කාරණාව පිළිබඳව මා හිතන්නේ, දැනට විශ්වවිද්‍යාලය වෙනසක් කර තිබෙනවා. ඒ අදාළ පීඨාධිපතිවරයා එසේ නැත්නම් ඒ අදාළ field එක භාරව ඉන්න ආචාර්යවරයා විශ්වවිද්‍යාලයට සහතික කළොත් ඒ ශිෂ්‍යයා ඒ කටයුත්තේ යෙදී ඉන්නවාය කියා, ඒ ශිෂ්‍යයාගේ බැංකු ගිණුමට මේ මුදල් වෙන් කරන ක්‍රමයක් තිබෙනවා. බැංකු ගිණුමක් දීලා නැත්නම් ඒ ශිෂ්‍යයාට ඇවිල්ලා ගන්න වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමා, ඔබතුමා මේ ගැන සොයා බලා-[බාධා කිරීමක්]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඇත්තටම මා මේ ගැන සොයා බලනවා. ඔබතුමා කිව්ව කාරණාව ගැන. ඒ ශිෂ්‍යයාගේ බැංකු ගිණුමක් තිබෙනවා නම්, ඒ අදාළ field එක භාර ගුරුවරයා සහතික කරනවා නම්, ඒ බැංකු ගිණුමට සල්ලි වැටෙනවා. බැංකු ගිණුමක් නැත්නම් ඇවිල්ලා ගන්න ඕනෑ. ඔබතුමා කියන කාරණය ඇත්ත. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ තුන් වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පෙරළියක් කරාවිය කියා අපේ විශ්වාසයක් තිබෙනවා. නමුත් මේ පෙරළිය සිද්ධ වෙන්නේ අනෙක් පැත්තට. මොකද? මොරටුව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන්, මහාචාර්යවරුන් විශාල ප්‍රමාණයක් දැන් රැකියාවෙන් ඉවත් වෙලා පිට රටවලට ගිහින් තිබෙනවා. මේ බුද්ධිගලනය කියන ප්‍රශ්නය ඔබතුමා දන්නවා. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ, ඒ ආචාර්යවරුන්, මහාචාර්යවරුන්, කථිකාචාර්යවරුන් හට සාධාරණ වැටුපක්, වේතනයක් ලබා දී මේ බුද්ධිගලනය නතර කරන්නට ඔබතුමන්ලා කටයුතු නොකරන්නේ ඇයි?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ වැටුප ගිය මාසයේත් සියයට 20කින් වැඩි

කළා. ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලය වනතුරු ලංකාවේ වැඩිම වැටුප් ගත්තේ අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්. නමුත් අද විශ්වවිද්‍යාල මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු ඊට වඩා හුඟක් ඉහළ වැටුප් තලයක ඉන්නවා.

මේ අයට සියයට 35ක පරීක්ෂණ දීමනාවක් දෙනවා. ඇත්තටම ඔබතුමා කිව්ව ආචාර්යවරුන්ගේ ප්‍රශ්නය කටුබැද්ද විශ්වවිද්‍යාලයටවත්, කොළඹ විශ්වවිද්‍යාලයටවත්, කැලණිය විශ්වවිද්‍යාලයටවත්, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයටවත්, පේරාදෙනිය විශ්වවිද්‍යාලයටවත් නැහැ. නමුත් රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්ගේ, ඉංජිනේරුවන්ගේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ වෛද්‍ය විශේෂඥයින්ගේ, මහාචාර්යවරුන්ගේ ගැටලුවක් රජරට විශ්වවිද්‍යාලයට, මඩකලපුව හා යාපනය විශ්වවිද්‍යාලවලට තිබෙනවා. අපි අලුතින් ඉංජිනේරු පීඨ දෙකක් පටන් ගත්තා. එකක්, යාපනය විශ්වවිද්‍යාලයේ. අනික, අග්නිදිග විශ්වවිද්‍යාලයේ. ඒ විශ්වවිද්‍යාල දෙකටත් අපිට ආචාර්යවරුන්ගේ ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම අපේ උගත් වෘත්තිකයින් - වෛද්‍යවරු, ඉංජිනේරුවරු - ලංකාවෙන් ඉගෙන ගෙන පිට රට යන එක - බුද්ධි ගලනය - නවත්වන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ පිට රට යන ප්‍රමාණයට අපි අලුතින් වෛද්‍යවරු, ඉංජිනේරුවරු හදන කාර්යය කරනවා. නමුත් අද ඈත විශ්වවිද්‍යාලවලට මහාචාර්යවරුන් යවා ගන්න, අපි ඒ අයට වැටුපට අමතරව තවත් රුපියල් ලක්ෂයක් දෙනවා. ඒ වාගේම විශේෂ දීමනා ගෙවලා visiting lecturersලා හැටියට ඒ අයව යවන ක්‍රමයක් සකස් කර තිබෙනවා. ඈත විශ්වවිද්‍යාලවලට ඒ ගැටලුව තිබුණාට කොළඹ විශ්වවිද්‍යාලයට හෝ පේරාදෙනිය විශ්වවිද්‍යාලයට ඒ ගැටලුව නැහැ.

## දේශපාලනඥයන්ගේ/රජයේ සේවකයන්ගේ විදේශ ගමන් : ශ්‍රී ලංකා තානාපති කාර්යාල වැය කළ මුදල
## அரசியல்வாதிகள்/அரசாங்க அலுவலர்களின் வெளிநாட்டுப் பயணங்கள் : இலங்கைத் தூதரகங்கள் செலவிட்ட நிதி
## FOREIGN TRIPS OF POLITICIANS/PUBLIC SERVANTS : MONEY SPENT BY SRI LANKAN EMBASSIES

3308/'12

**13.ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දේශපාලනඥයින් හෝ රජයේ සේවකයින් විදේශගත අවස්ථාවලදී ඔවුන්ගේ වියදම් පියවීම සඳහා අදාළ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල සතු අරමුදල්වලින් මුදල් වියදම් කිරීමට සිදු වන්නේද;

(ii) එසේ නම්, එම වියදම් පියවීම සඳහා පසු ගිය වර්ෂ හය ඇතුළත අදාළ තානාපති කාර්යාල විසින් වැය කරන ලද මුළු මුදල වාර්ෂික පදනමින් කොපමණද;

(iii) උක්ත ගෙවීම් සිදු කරන ලද කාර්යයන් මොනවාද;

(iv) එම වියදම් දැරීමට සිදු වූ හේතු පෞද්ගලික හේතුන්ද; නැතහොත්, රාජකාරීමය හේතුන්ද;

(v) එකී වියදම් දරන ලද්දේ පෞද්ගලික හේතු මත නම්, එම ගෙවීම් සිදු කරන ලැබුවේ කවර අය සඳහාද;

(vi) එම ගෙවීම් සිදු කරන ලද දිනයන් සහ ගෙවීම්වලට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசியல்வாதிகள் அல்லது அரசாங்க அலுவலர்கள் வெளிநாடுகளுக்குச் செல்லும் போது அவர்களுக்கான செலவினங்களை இலங்கைத் தூதரகங்கள் தூதரக நிதியிலிருந்து மேற்கொள்ள வேண்டியுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின், அத்தகைய செலவுகளுக்காக சம்பந்தப்பட்ட தூதரகங்களினால் கடந்த ஆறு வருடங்களுக்கு செலவு செய்யப்பட்ட மொத்தத் தொகையை வருடாந்த அடிப்படையிலும்;

(iii) மேற்கூறிய கொடுப்பனவுகளை மேற்கொண் டதற்கான நோக்கத்தையும்;;

(iv) அத்தகைய கொடுப்பனவுகளுக்கான காரணங்கள் தனிப்பட்டவையா அல்லது உத்தியோகபூர்வமானவையா என்பதையும்;

(v) அவை தனிப்பட்ட காரணங்களுக்காகவெனின், கொடுப்பனவுகள் மேற்கொள்ளப்பட்ட நபர் களையும்;

(vi) அத்தகைய கொடுப்பனவுகள் மேற்கொள்ளப் பட்ட திகதியையும் கொடுப்பனவுகளுக்கான காரணத்தையும்

அவர் கூறுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he state -

(i) whether Sri Lankan Embassies have to spend money out of Embassy funds to cover up the expenses of politicians or Public servants, when they go overseas;

(ii) if so, the total amount spent by the relevant Embassies for such expenses for the last six years annually;

(iii) the purpose of making the aforesaid payments;

(iv) whether reasons for such payments are personal or official;

(v) if those are on personal reasons, the persons to whom the payments were made; and

(vi) the dates on which such payments were made and the reasons for payments?

(b) If not, why?

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)

Sir, on behalf of the Minister of External Affairs, I answer the Question.

(a) (i) No. The Ministry had issued circular instructions to all Missions not to incur any expenditure to cover the expenses of politicians or Public servants.

(ii) Not applicable.

(iii) Not applicable.

(iv) Not applicable.

(v) Not applicable.

(vi) Not applicable.

(b) Does not arise.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, I am astonished that you gave such an answer. I do not want to reveal the names of our Colleagues in Parliament, whose expenses had been covered up. But, I can say with authority that your Mission in Washington has spent more than US Dollars 2 million, reimbursing expenses of Members of Parliament who had been there. The Mission in Thailand, has spent over US Dollars 200,000. I am wondering whether there is a concealment of information in this House. If you saying such a thing, you have to name it. This is what is called misrepresentation to Parliament. I would greatly appreciate if a more truthful answer is given before we come up with names. At that time, it would be embarrassing for you for saying that expenditure was not incurred.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

The Ministry had issued circulars instructing all Missions not to incur any expenditure to cover up the expenses of politicians or Public servants. Still, if there are any exigencies, the embassies do pay. But, those have to be reimbursed by the relevant Ministries or departments. We have not allocated any funds for the payment of expenses of Ministers or Public servants. But, we make advances in cases of exigencies and those are reimbursed on a case-by-case basis.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, my intention to raise the question is this. There is no such allocation for the Ministry to get reimbursed in any area, not on a permanent basis, but to be reimbursed. I did not say that you absorb it into your Ministry. There should be an allocation to do so. But, there have been such instances.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Hon. Member, whether it is from the Ministry of External Affairs, the Ministry of Health or Parliament, when you all go to a country and if there is any exigency, we advance money and then get it reimbursed on the instructions of the relevant Ministry or department. We do not allocate money as such and we have not done it for such reasons.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, in that case, I have to ask from the Hon. Deputy Minister my third Supplementary Question, this way. To the United Kingdom, two Ministers had gone and their entertainment expenditure was borne by the Embassy and that particular Ambassador was unable to take clients out for the simple reason that that had happened. I know it is an ongoing situation. I cannot understand why the Hon. Deputy Minister is saying that it is not happening when an Ambassador does not have US Dollars 1,000 for entertainment of clients in the country that he represents.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Hon. Member, it cannot be so because if it is for the Ministry of External Affairs, we allocate money from Colombo if there is any emergency or any exigencies. But, if it is for any other Ministry, we get prior approval and collect the money from the relevant Ministries. But, they do not use their own funds. If they use their funds, it is up to them. Otherwise, they can get prior approval and spend the funds.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I will not reveal the names of my Colleagues. But, owing to the misuse of funds, I will ensure that those are sent to you on a confidential note and I would like an honest answer. If you do not do that, it will be publicized in Parliament.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14 - 3960/'13 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු වික්ටර් ඈන්ටනි මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விக்டர் அன்டனி - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon.Victor Antony - Deputy Minister of Coconut Development and Janatha Estate Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අධ්‍යාපන විද්‍යා පීඨවලට සිසුන් බඳවා ගැනීම : ගැසට් නිවේදන
## கல்வியியல் கல்லூரிகளுக்கு மாணவர் சேர்ப்பு : வர்த்தமானி அறிவித்தல்
## ENROLMENT OF STUDENTS TO COLLEGES OF EDUCATION : GAZETTE NOTIFICATIONS

4178/'13

15.**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2011 වර්ෂයේ ඇති වූ z-score අර්බුදය හේතුවෙන් අධ්‍යාපන විද්‍යා පීඨවලට සිසුන් ඉල්ලුම් පත් යොමු කිරීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වූ බව දන්නේද;

(ii) අධ්‍යාපන විද්‍යා පීඨවලට සිසුන් බඳවා ගැනීම්වලට අදාළව ගැසට් නිවේදන නිකුත් කර තිබේද;

(iii) එම ගැසට් නිවේදනයන්ගේ අංක හා දිනයන් කවරේද;

(iv) එම ගැසට් නිවේදනයන්හි සඳහන් කරුණු කවරේද;

(v) මේ වන විට අධ්‍යාපන විද්‍යා පීඨ වෙනුවෙන් ලැබී තිබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව කොපමණද;

(vi) ඒ අතරින් සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලැබූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டில் ஏற்பட்ட z-score பிரச்சினை காரணமாக கல்வியியல் கல்லூரிகளுக்கு மாண வர்கள் விண்ணப்பிக்கும்போது சிக்கலான நிலை தோன்றியமையை அறிவாரா என்பதையும்;

(ii) கல்வியியல் கல்லூரிகளுக்கான மாணவர் சேர்ப்பு தொடர்பாக வர்த்தமானி அறிவித்தல்கள் வெளியிடப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) மேற்படி வர்த்தமானி அறிவித்தல்களின் இலக் கங்கள் மற்றும் திகதிகள் யாவையென்பதையும்;

(iv) மேற்படி வர்த்தமானி அறிவித்தல்களில் குறிப்பி டப்பட்டுள்ள விடயங்கள் யாவையென்பதையும்;

(v) தற்போது கல்வியியல் கல்லூரிகளுக்காக கிடைக்கப்பெற்றுள்ள விண்ணப்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(vi) அவற்றில் நேர்முகப் பரீட்சைக்காக அழைக்கப் பட்டவர்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) whether he is aware of the problematic situation that arose in applying to the Colleges of Education due to the Z-score crisis in the year 2011;

(ii) whether gazette notifications have been issued with regard to the enrolment of students to Colleges of Education;

(iii) the numbers and the dates of the aforesaid gazette notifications;

(iv) the content of the aforesaid gazette notifications;

(v) the number of applications received for the Colleges of Education by now; and

(vi) the number of applicants who have been called for interviews out of the aforesaid number of applicants?

(b) If not, why?

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ගැටලුවක් ඇති වුයේ නැත. එම වර්ෂයේදී විශ්වවිද්‍යාලවලට ළමුන් ඇතුළත් කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය වන පැරණි හා නව නිර්දේශ වශයෙන් වෙන් කර තෝරා ගැනීමේ ක්‍රමය විද්‍යා පීඨ සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී ද යොදා ගන්නා ලදී.

(ii) ගැසට් නිවේදනයක් පළ කර ඇත.

(iii) 1764 අංක දරන 2012.06.22 දිනැති ගැසට් නිවේදනය හා 1799 අංක දරන 2013.02.22 දිනැති ගැසට් නිවේදනය.

(2011 වර්ෂයේදී උසස් පෙළ ප්‍රතිඵල නැවත පැරණි හා නව නිර්දේශ වශයෙන් වෙන් කර දැක්වීමට කටයුතු කළ නිසා 2012.06.22 ගැසට් පත්‍රය අවලංගු කර එයට අනුගාමීව 2013.02.22 ගැසට් පත්‍රය නැවත පළ කරන ලදී.)

(iv) 01. යෝග්‍යතාව

02. එක් එක් පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්

[ගරු මොහාන් ලාල් ග්‍රේරූ මහතා]

03. පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය හා එහි අංකය

04. තෝරා ගැනීමේ පදනම

05. දුෂ්කර දිස්ත්‍රික්ක පදනම

06. තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු

07. පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන්

08. පුහුණුව සඳහා අදාළ කොන්දේසි

09. අයදුම් කරන ආකාරය

10. අයදුම්පතේ ආදර්ශ ආකෘතිය

අදාළ ගැසට් නිවේදනය ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

දිවයින පුරා විසිරී ඇති ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ 18ක පවත්වනු ලබන පාඨමාලා 28ක් සඳහා (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය වශයෙන්) අයදුම්පත් කැඳවන අතර, රජයේ ප්‍රතිපත්තිය අනුව බඳවා ගන්නා සංඛ්‍යාවට වඩා තුන් ගුණයක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ. ඒ අනුව එක් එක් පාඨමාලාවන් සඳහා ගැසට් නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ z - ලකුණු ප්‍රමුඛතාව අනුව මෙම පාඨමාලා හැදෑරීම සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙය තුන් අවුරුදු පුහුණු පාඨමාලාවක් වන අතර, වසර දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, එක් වසරක සීමාවාසික පුහුණුවකින් ද සමන්විත වේ. පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරන අතර, වසර තුන අවසානයේ විභාගයක් පවත්වා ගුරු පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

(v) 40,230යි.

(vi) 11,865කි.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙකයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පළමුවෙනි ගැසට් නිවේදනය අවලංගු කළා කියලා ඔබතුමා කිව්වා. අවලංගු කරපු දිනය, අවලංගු කරපු ක්‍රමවේදය පිළිබඳව සඳහන් කරන්න පුළුවන්ද? මොකද, පළමුවෙනි ගැසට් නිවේදනය අවලංගු කළේ නැහැ කියන එක සමස්ත ශ්‍රී ලාංකික ජනතාවම සහ ඒ සිසු සිසුවියනුත් දන්නා දෙයක්. පළමුවෙනි ගැසට් නිවේදනය අවලංගු නොකර තමයි, 2013.02.22 වෙනි දා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයෙන් පස්සේ දෙවෙනි ගැසට් නිවේදනය දැම්මේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන පුවත් පත්වල මේවා පළ වුණේ නැහැ.

දින 14ක් ඇතුළත කැඳවලා, පළමුවෙනි වතාවේ ඉල්ලපු ශිෂ්‍යයන්ව අතරමං කර තිබෙනවා. පළමු වතාවේ සිසුන් 40,000ක් විද්‍යා පීඨවලට ඉල්ලුම් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ පළමුවෙනි ගැසට් පත්‍රය අවලංගු නොකරපු නිසා, විද්‍යා පීඨවලට ඇතුළු වෙන්න බලාපොරොත්තුවෙන් සිටි ගම්වල අහිංසක දුප්පත් දරුවෝ මේ වන විට විශාල අර්බුදයකට මුහුණ දී සිටිනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පළමුවෙනි ගැසට් පත්‍රය අවලංගු කළාය කියලා ඔබතුමා දැන් කිව්වා නේ. එය අවලංගු කරපු දිනය කියන්න.

**ගරු මොහාන් ලාල් ග්‍රේරූ මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ගරු මන්ත්‍රීතුමියනි, "පළමු ගැසට් පත්‍රය අවලංගු කර ඊට අනුගාමීව නව ගැසට් නිවේදනය නිකුත් කළා"ය කියලා පිළිතුරේ තිබෙනවා. එය නිකුත් කළ දිනය මම සොයා බලලා දැනුම් දෙන්නම්. ඒ විස්තර අපට ලැබිලා නැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ හේතුව නිසා දරුවන් 20,000කට වඩා අතරමං වී සිටිනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ අසාධාරණයට එරෙහිව මේ දරුවන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න යම් ක්‍රමවේදයක් තිබෙනවාද?

**ගරු මොහාන් ලාල් ග්‍රේරූ මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
මේ විධියේ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා නම් ඒ ගැන සොයා බලා ඊට ප්‍රතිකර්ම යෙදිය යුතුයි. අපි ඒ ගැන සොයා බලන්නම්.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මෙවැනි දේවලුත් තරුණ අසහනයට ප්‍රධාන වශයෙන් හේතු වෙනවා. දින 14ක් ඇතුළත ප්‍රධාන පුවත් පතක පළ නොකර, ගැසට් කරලා, පරීක්ෂණයක් තියලා සිසුන් බඳවා ගන්න හේතුව මොකක්ද කියලායි මම අහන්නේ. ලහිලහියේ මේ විධියට සිසුන් බඳවා ගන්න හේතුව මොකක්ද? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ක්‍රමය අසාධාරණයි කියලා ඔබතුමාට හිතෙන්නේ නැද්ද?

**ගරු මොහාන් ලාල් ග්‍රේරූ මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඒ පිළිබඳ ගැසට් නිවේදනයක් පළ කර තිබෙනවා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නමුත් එය ප්‍රධාන පුවත් පත්වල පළ වුණේ නැහැ. ඉතින් දරුවන් කොහොමද දැන ගන්නේ? පළමුවෙනි වතාවේ ගැසට් කළාම, සියලු දෙනාම හිතුවේ එය හරියි කියලායි. ආයෙත් තව ගැසට් නිවේදනයක් නිකුත් වෙයි කියලා ඔවුන් බලාපොරොත්තු වුණේ නැහැ. ගොඩක් අය ගැසට්

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

බලන්නේ නැහැ නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කරන්නේ යෝජනාවක්. ගැසට් නිවේදනයක් නිකුත් කරන්න පෙර ජනතාව දැනුවත් කර තිබුණා නම්,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, තව සුළු වෙලාවකින් අධ්‍යාපන උපදේශක කාරක සභාව පැවැත්වෙනවා. ඔබතුමිය එයට සහභාගී වෙන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනට යන්න ඕනෑ නැහැ. මම මේ අහන්නේ ජනතාවට බලපාන ප්‍රශ්නයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනා ඉදිරිපත් කරන්නේ අධ්‍යාපන උපදේශක කාරක සභාවේදීයි. මේ ගරු සභාවේදී ප්‍රශ්න විතරයි අහන්න පුළුවන්.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, "මෙහෙම ගැසට් කරනවා ඒ ගැසට් එක බලන්න" කියලා ජනතාව දැනුවත් කරන්න.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
හොඳයි. අප එයට ප්‍රතිකර්ම යොදන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය ඒ ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න. දෙවන වටය.

## එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා හේජර්ස් ස්ට්‍රැටජීස් සමාගම: ගනුදෙනු
ஐக்கிய அமெரிக்க இலங்கைத் தூதரகம் மற்றும் ஹெட்ஜெஸ் ஸ்ரற்ரஜீஸ் கம்பனி : கொடுக்கல்வாங்கல்
SRI LANKAN EMBASSY IN UNITED STATES AND HEDGES STRATEGIES COMPANY: TRANSACTIONS

4466/'13

5. **ගරු විජිත හේරත් මහතා (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு விஜித ஹேரத் - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
The Hon. Vijitha Herath on behalf of the Hon. Anura Dissanayake)
ගරු අනුර දිසානායක මහතා, විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) 2010, 2011 සහ 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Hedges Strategies නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටුකර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹී ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010, 2011 மற்றும் 2012ஆம் ஆண்டுகளில் ஐக்கிய அமெரிக்காவிலுள்ள இலங்கைத் தூதரகம் Hedges Strategies எனும் கம்பனியுடன் கொடுக்கல்வாங்கல் மேற்கொண்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கொடுக்கல்வாங்கல் இடம்பெற்றுள்ள காலப்பகுதி யாதென்பதையும்;

(iii) மேற்படி கொடுக்கல்வாங்கல் மூலமாக நிறைவேற்றப்பட்டுள்ள பணி அல்லது பணிகள் யாவையென்பதையும்;

(iv) அதன்மூலம் கிடைத்துள்ள நன்மைகள் யாவை யென்பதையும்;

(v) மேற்படி பணிகளுக்காக மேற்கொள்ளப் பட்டுள்ள கொடுப்பனவுகளின் பெறுமதி யாதென்பதையும்;

(vi) அதற்காக நிதி ஒதுக்கப்பட்ட செலவுத் தலைப்பு யாதென்பதையும்;

(vii) மேற்படி கம்பனிகளுடன் உடன்படிக்கைகள் கைசாத்திடப்பட்டிருப்பின், அந்த உடன்படிக்கைகளை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he inform this House -

(i) whether the Sri Lankan Embassy in the United States had dealings with the company named Hedges Strategies in the years 2010, 2011and 2012;

(ii) if so, the period during which such transactions have taken place;

(iii) the task or tasks accomplished through such transactions;

(iv) the benefits derived from them;

[ගරු විජිත හේරත් මහතා]

(v) the value of the payments made for the said transactions;

(vi) the expenditure Head under which funds were allocated for this purpose; and

(vii) if agreements have been entered into with that company, whether such agreements will be tabled?

(b) If not, why?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

**Answer tabled:*

(අ) (i) එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2010, 2011 හෝ 2012 වසරවලදී "හෙජර්ස් ස්ට්‍රැටජීස්" නමැති වෙළෙඳ සමාගමක් සමඟ කිසිදු ගනුදෙනුවක නියැළී නොමැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(vi) පැන නොනඟී.

(vii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

## සහල් අපනයනය : බිත්තර වී
## அரிசி ஏற்றுமதி : விதை நெல்
## EXPORT OF RICE : SEED PADDY

4634/'13

**7. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු පී. හැරිසන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு பீ. ஹரிசன் சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. P. Harrison)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාව ඉදිරියේදී විදේශ රටවලට සහල් අපනයනය කිරීමට බලාපොරොත්තු වන්නේද;

(ii) එසේ නම්, විදේශීය වෙළෙඳ පොළට අවශ්‍ය සහල් නිපදවීමට අවශ්‍ය බිත්තර වී මේ වන විට රට තුළ නිෂ්පාදනය කරනු ලබන්නේද;

(iii) එසේ නම්, එම බිත්තර වී නිපදවනු ලබන ගොවිපළවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කර ඇති බාස්මතී වර්ග දේශීය වෙළෙඳ පොළට ඉදිරිපත් කර තිබේද;

(ii) බාස්මතී වර්ග වගා කරනු ලබන ගොවීන්ගේ නිෂ්පාදන සඳහා වැඩි මිලක් ලබා දීමට කටයුතු කර තිබේද;

(iii) එසේ නම්, බාස්මතී සඳහා ගෙවනු ලබන මිල කොපමණද;

(iv) එසේ නිෂ්පාදනය කරනු ලබන බාස්මතී වර්ග මිලදී ගැනීම සඳහා රජයේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை எதிர்காலத்தில் வெளிநாடுகளுக்கு அரிசி ஏற்றுமதி செய்வதற்கு எதிர்பார்க்கின்றதா என்பதையும்;

(ii) ஆமெனில், வெளிநாட்டுச் சந்தைக்குத் தேவையான அரிசியை உற்பத்தி செய்வதற்குத் தேவைப்படும் விதை நெல் தற்போது இந்நாட்டில் உற்பத்தி செய்யப்படுகின்றதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி விதை நெல் உற்பத்தி செய்யப்படுகின்ற பண்ணைகள் யாவையென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையில் உற்பத்தி செய்யப்படும் பாஸ்மதி வகைகள் உள்நாட்டு சந்தைக்கு விநியோகிக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) பாஸ்மதி வகைகளைப் பயிரிடும் விவசாயிகளின் உற்பத்திகளுக்கு அதிக விலையைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், பாஸ்மதிக்காகச் செலுத்தப்படுகின்ற விலை யாதென்பதையும்;

(iv) அவ்வாறு உற்பத்தி செய்யப்படும் பாஸ்மதி வகைகளைக் கொள்வனவு செய்வதற்காக அரசாங்க நிலையமொன்று தாபிக்கப் பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) whether Sri Lanka expects to export rice to foreign countries in future;

(ii) if so, whether the seed paddy which is needed to produce the rice required by the foreign market is produced in the country at present; and

(iii) if so, the names of the farms which produce that seed paddy?

(b) Will he also inform this House -

(i) whether the varieties of Basmathi produced in Sri Lanka have been tendered to the local market;

(ii) whether action has been taken to provide a higher price to the produce of the farmers who cultivate varieties of Basmathi;

(iii) if so, the price paid for the Basmathi variety of rice; and

(vi) whether a government centre has been established to purchase the varieties of Basmathi so produced?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙහිඅත්තකණ්ඩිය ටෝඩා ගොවිපළ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අරලගන්විල ගොවිපළ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි මල්වත්ත ගොවිපළ

(ආ) (i) නැත.

බාස්මතී සහල් වර්ග නිෂ්පාදනය කරනු ලබන්නේ ඉන්දියාවේ හා පාකිස්තානයේ පමණි. බාස්මතී ලෙස නම් කළ හැකි වර්ග කීපයක් පේටන්ට් කර ඇති අතර, භූගෝලීය දර්ශක අනුව ඒවායේ වගා භූමි ලෙස ඉන්දියාව හා පාකිස්තානය නම් කර ඇත.

බාස්මතී සහල්වල ප්‍රධාන ගුණාංගයක් වන්නේ, පිසීමේදී;

සහල්වල දිග දෙගුණයක් වීම.

කෙසෙල් ගෙඩියක හැඩයකින් යුක්ත වීම.

ආවේණික සුවඳකින් යුක්ත වීම.

මෙම ගුණාංගය ඇතිවීම සඳහා විශේෂ භූගෝලීය සහ කෘෂි දේශගුණික පරිසරයක් පැවතිය යුතු අතර ශ්‍රී ලංකාවේ එම සිසිල් තත්ත්වයන් සහ උෂ්ණත්ව පරාසයන් නොමැත.

එහෙත් ශ්‍රී ලංකාවේ පිසීමේදී සුවඳ හමන සහල් වර්ග දෙකක් (AT 405, AT 306) නිෂ්පාදනය කර ඇත. මෙයින් AT 405 ඇලෙනසුළු බව නිසා ජනප්‍රිය නොවූ අතර, AT 306 මාස තුනේ ප්‍රභේදය අස්වැන්නේ අඩුවීම නිසා ජනප්‍රිය වී නොමැත.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(iv) අදාළ නැත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 9-4817/'14-(1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### සේවක අර්ථ සාධක අරමුදල් අයථා පරිහරණය
### ஊழியர் சேமலாப நிதியத்தின் தவறான கையாளுகை
### MISAPPROPRIATION OF EMPLOYEES' PROVIDENT FUND

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික අංශයේ සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන් ලක්ෂ 15කට පමණ බලපාන ප්‍රශ්නයක් මේ වන විට ඉස්මතු වී තිබෙනවා.

2012 පෙබරවාරි මස 09වැනි දින සහතික කරන ලද, 2012 අංක 2 දරන සේවක අර්ථ සාධක අරමුදල පනත සම්බන්ධ සංශෝධන ඉදිරිපත් කරන ලද අවස්ථාවේ ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් සියලු දෙනාගේම ඒකමතිකත්වයෙන් මෙම පනත සම්මත කර ගත්තා. එහි අරමුණ වූයේ මේ සාමාජිකයන් හට ඉස්මතු වන හදිසි අවශ්‍යතාවක්, බරපතළ රෝගාබාධයක්, තම දරුවන්ගේ අවශ්‍යතාවක් හෝ නිවසක් තනා ගැනීම ආදී අවස්ථාවකදී මෙම අරමුදලින් යම් කිසි සහනයක් ලබා ගැනීමට හැකියාව ලබා දීමයි. නමුත් වර්තමානයේ ඉහත අවශ්‍යතා සපුරා ගැනීමට අරමුදලේ සාමාජිකයන්ට මුදල් පොලී කරන්නන්ට ණය වීමට සිදු වී තිබෙනවා. රජය විසින් සාමාජිකයන් වෙත ලබා නොදෙන මුදල් නාස්තිකාර හා බංකොලොත් ව්‍යාපාර වෙනුවෙන් යොදවනවා.

වැඩ කරන ජනතාවගේ උද්ඝෝෂණ හා ඉල්ලීම්වල ප්‍රතිඵලයක් ලෙස දායක මුදලින් උපරිමය සියයට 30ක ප්‍රමාණයක් නිදහස් කිරීමට හැකි වන පරිදි පනතේ 23(අ) වගන්තිය ඇතුළත් කළා. ඒ අනුව, අවුරුදු 10ක සේවා කාලයක් ඉක්මවා සේවයේ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

යෙදී සිටින සාමාජිකයෙකුට උපරිම වශයෙන් ලක්ෂ 20ක් ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.

මීට අදාළ රෙගුලාසි සකස් කර පාර්ලිමේන්තුවේ අගෝස්තු මස 21වැනි දින න්‍යාය පත්‍රයේ අංක 7 යටතේ සඳහන් වී තිබෙනවා.

ඒ අනුව පහත විමසීම්වලට ගරු ඇමතිතුමාගෙන් පිළිතුරු අපේක්ෂා කරනවා.

01. මේ රෙගුලාසි සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා න්‍යාය පත්‍රයේ ඇතුළත් කර තිබියදීත් රජය මෙම කරුණ සාකච්ඡාවට ගෙන සම්මත කිරීමට පියවර නොගන්නේ මන්ද?

    මොකද, ඒක හදිසියේ සම්මත කර ගන්න තිබෙන රීතියක්. රජය මේක ඉදිරියට ගේනවාද නැත්නම් අත හරිනවාද? මාධ්‍යවලින් වාර්තා කරලා තිබුණා, මේ රජයට මුදල් හිඟයක් තිබෙනවා, ඒ නිසා මේ මුදල් ගෙවන්න අපහසුයි කියලා. ඉතින් මම දෙවැනි ප්‍රශ්නය හැටියට මේ කාරණය අහන්න කැමතියි.

02. සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන් හට ඔවුන්ට හිමි ප්‍රතිලාභයන් ලබා නොදීමට කටයුතු කරන්නේ රජයට මුදල් නොමැතිකම නිසාද?

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කොටස් දෙකකින් ප්‍රශ්නය අහලා තිබෙනවා. මම පළමුවෙන්ම දෙවැනි කොටසට උත්තර දෙනවා.

සේවක අර්ථ සාධක අරමුදලේ පරිපාලන කටයුතු කාර්යක්ෂම කරමින් එම අරමුදල් එක්රැස් කිරීමට කම්කරු හා කම්කරු අමාත්‍යාංශය ගනු ලැබූ උපාය මාර්ගයන්හි ප්‍රතිඵලයක් ලෙසත්, එසේ එක්රැස් කරන ලද අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විචක්ෂණශීලී ලෙස අරමුදලේ සාමාජිකයන්ට වඩා වැඩි ප්‍රතිලාභ ලබා දිය හැකි ආකාරයට කළමනාකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසත් සේවක අර්ථසාධක අරමුදල රුපියල් ට්‍රිලියනය ඉක්මවා එනම් රුපියල් බිලියන 1,300ක් පමණ දක්වා වර්ධනය කර ගැනීමට හැකි වී ඇත.

2009 වසරේ අරමුදලේ සමස්ත වටිනාකම රුපියල් බිලියන 770ක් වූ අතර, 2012 වසර අවසාන වන විට එය රුපියල් බිලියන 1144 දක්වා සියයට 48කින් පමණ වර්ධනය වී ඇත.

මේ ආකාරයට සේවක අර්ථ සාධක අරමුදල ශක්තිමත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අඛණ්ඩවම වෙළෙඳ පොළේ පවත්නා ස්ථාවර තැන්පතු සඳහා වන පොලී අනුපාතය ඉක්මවා ගිය පොලී අනුපාතිකයක් (සියයට 11.5 සිට සියයට 13.75 දක්වා) යටතේ සාමාජිකයන්ගේ ගිණුම්වලට ප්‍රතිලාභ බැර කිරීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධිත පනත මඟින් යෝජිත සියයට 30 ප්‍රතිලාභය ලබා දීම සේවක අර්ථසාධක අරමුදල මඟින් සිදු කරනු ලබන අතර ඒ සඳහා ප්‍රමාණවත් මුදල් අරමුදල සතුව පවතී. එබැවින් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් හට ප්‍රතිලාභ ලබා දීම සඳහා රජයට මුදල් පවතීද නැද්ද යන්න අදාළ නොවේ.

පළමුවන කොටසට පිළිතුර මේකයි. දැනට ක්‍රියාත්මක වන සාමාජිකයාගේ අර්ථ සාධක අරමුදලේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා දෙන ක්‍රමය අනුව ප්‍රතිලාභ ලබා ගත් සාමාජිකයන්ගෙන් විශාල ප්‍රමාණයක් ලබා ගත් ණය ක්‍රමවත්ව නොගෙවීම හේතුවෙන් හිඟ ණය වාරික, පොලී හා දඩ මුදල් සියල්ල ඒ ඒ බැංකුවලට සාමාජිකයන්ගේ ශේෂවලින් කපා හැර ඉතිරිය පමණක් සාමාජිකයන්ට ප්‍රේෂණය කරනු ලබයි. මේ හේතුවෙන් විශ්‍රාම යන අවස්ථාව වන විට ණය ලබා ගත් සාමාජිකයන් වැඩි ප්‍රමාණයකගේ විශ්‍රාම ජීවිතය සඳහා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභයක් හිමි නොවන අතර ඒ තත්ත්වය පාලනය කර ගනිමින් සාමාජිකයන්ගේ විශ්‍රාම ජීවිතය සුරක්ෂිත කිරීම සඳහා නව ක්‍රමය යෝජනා කරන ලදී.

ඒ අනුව නව ක්‍රමය සම්බන්ධයෙන් රෙගුලාසි සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත. කෙසේ වෙතත් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී සාමාජික ගිණුම් හා සම්බන්ධ ප්‍රායෝගික සහ පරිපාලනමය ගැටලු පැන නැඟී ඇත. නිදසුනක් ලෙස එකම සාමාජිකයාගේ නමින් ගිණුම් කිහිපයක් පවතින අතර ඒවා ඒකාබද්ධ නොකළහොත් මෙම යෝජිත ක්‍රමය මඟින් සාමාජිකයාට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගත නොහැකිය. මෙම ගැටලුව විසඳා ගැනීම සඳහා සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය සාමාජික ගිණුම් අංකය බවට පත් කිරීමේ හා සාමාජිකයන්ගේ ඇඟිලි සලකුණු විද්‍යුත් ක්‍රමයට රැස් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම කාර්යය සඳහා සාමාජිකයන්ගෙන් සහ සේවා යෝජකයන්ගෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොමැති වීම අදාළ ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට බාධාවක් වී ඇත. කෙසේ වෙතත් මෙම කටයුතු ඉතා ඉක්මනින් අවසන් කොට එක් සාමාජිකයකුට හිමි විවිධ ගිණුම්වල හිමිකාරත්වය තහවුරු කර ගැනීම සඳහා අදාළ කටයුතු කඩිනමින් සිදු කරන අතර එතෙක් මෙම යෝජනාව සම්මත කර ගැනීම ප්‍රමාද කරන ලෙස අපි පාර්ලිමේන්තුවෙන් ඉල්ලා ඇත.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක Party Leaders' Meeting එකේ කථා කළ දෙයක්. ගරු කථානායකතුමාත් දන්නවා, ඔබතුමාත් දන්නවා දවස් කිහිපයක් සාකච්ඡා කරලා කිව්වේ මේක රජයේ වැඩක් කියලායි. නමුත් හදිසි වැඩක් කියලා තමයි මේ සංශෝධනය ගෙනාවේ. මම මේක මතු කරන්නේ ඉතා වැදගත් කාරණයක් නිසායි.

මමත් Party Leaders' Meeting එකට සහභාගි වුණා. සාමාන්‍යයෙන් දින තුනක්, දින හතරක් මා මේ ප්‍රශ්නය මතු කළා. එය වාර්තාවේත් සඳහන් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම කම්කරු ජනතාව මෙය දිහා බලා ගෙන ඉන්නවා. ඔබතුමන්ලා පිළිගත්ත නිසායි අපි මේ වෙනස කළේ. එම නිසායි රෙගුලාසි හැදුවේ. එම නිසායි න්‍යාය පුස්තකයට ගෙනාවේ. අද මෙය සම්මත කරන්නේ නැතුව ඉන්නවා. අපට Party Leaders' Meeting එකට සහභාගි වන්න පුළුවන්. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පක්ෂ නායක රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කරමු.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

පක්ෂ නායක රැස්වීමේදී මේ සම්බන්ධයෙන් කථා කළා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂය භාර ඇමතිතුමා මේ පිළිබඳ ස්ථාවරය අද පාර්ලිමේන්තුවට දන්වා තිබෙනවා. එම ස්ථාවරයට මෙතුමන්ලා එකඟ වන්නේ නැත්නම් අපට ඒ පිළිබඳ විවාදයකට යන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඊ ළඟට, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) ඒ.වී සුරවීර මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව.

Order, please! The Hon. Deputy Chairman of Committees willl now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා*** **[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]** ***මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்* [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

*Whereupon MR.* DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

## ශෝක ප්‍රකාශය : ගරු (මහාචාර්ය) ඒ.වී. සුරවීර මහතා
## அனுதாபத் தீர்மானம் : மாண்புமிகு (பேராசிரியர்) ஏ.வி. சுரவீர
## VOTE OF CONDOLENCE : HON. (PROF.) A.V. SURAWEERA

[අ.භා. 2.24]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හා නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ ප්‍රවීණ අධ්‍යාපනඥයකු වූ මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරමි.

ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ කොරස නම් සුන්දර ගම් පියසේ විසූ එච්.ඒ. පියදාස මහතාගේත්, එච්.ඒ. ලීලාවතී මහත්මියගේත් දයාබර පුත්‍ර රත්නයක් ලෙස අලංකාරගේ වික්ටර් සුරවීර මහතා 1930 ඔක්තෝබර් මස 12 වැනි දින මෙලොව එළිය දුටුවේය. කොරස රණසිංහ බෞද්ධ පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ එතුමා ගම්පහ රජයේ ඉංග්‍රීසි පාසලෙන් සහ කොළඹ රාජකීය විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ලබා ගත්තේ කාගේත් ආදරය නොමඳවම දිනා ගත් දීප්තිමත් සිසුවකු වශයෙනි.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත්ව සිංහල ගෞරව උපාධියක් ලබා ගත් සුරවීර මහතා 1954 පටන් සිය ජීවිකා වෘත්තිය වශයෙන් ගුරු සේවය තෝරා ගනිමින් කටුගස්තොට ශ්‍රී රාහුල විද්‍යාලයේත්, කොළඹ ආනන්ද විද්‍යාලයේත් ආචාර්යවරයකු ලෙස සේවය කළේය. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයෙන්ම 1957 වසරේදී ශාස්ත්‍රපති උපාධියත්, 1964 වසරේදී ආචාර්ය උපාධියත් හිමි කර ගැනීමට තරම් දක්ෂයකු වූ එතුමා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරයකු වශයෙන්ද, කුසලතා මත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සහාය මහාචාර්ය, මහාචාර්ය සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු පවා ලබා ගනිමින් උසස් අධ්‍යාපනයේ නිරත වන දූ දරුවන් වෙනුවෙන් ඉමහත් සේවාවක් සැලසුවේය.

උසස් අධ්‍යාපනයේ නියැලෙන දරුවන් වෙනුවෙන් තම සේවා කාලය කැප කළ මෙම අධ්‍යාපනඥයා සිංහල අධ්‍යයනාංශ ප්‍රධාන, ශිෂ්‍යෝපදේශක, ශාස්ත්‍ර පීඨාධිපති, ලේඛකත්ව සහ සන්නිවේදන පාඨමාලා සමාරම්භක අධ්‍යක්ෂ, වැඩ බලන උපකුලපති හා කැළණිය විශ්වවිද්‍යාලයානුබද්ධ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ යනාදී විවිධ තනතුරු හොබවමින් තම උපරිම සේවාව එම ක්ෂේත්‍ර වෙත ලබා දුන්නේය.

සීලා සුරවීර මහත්මිය සමඟින් යුග දිවිය ගත කළ එතුමා ප්‍රියදර්ශිකා හෙට්ටිආරච්චි, අනුර සුරවීර, කීර්තිනී සුරවීර සහ ජයසංඛ සුරවීර නමින් රට දැයට වැඩදායී දරුවන් සිව් දෙනෙකු මෙලොවට දායාද කළේය. ඔවුන් මේ වන විට සහාය මහාචාර්ය, වෛද්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ වැනි විවිධ තනතුරු හොබවමින් ජාතික සේවාවන්හි නියැලෙමින් එතුමාට ගෞරවයක් හිමි කර දෙයි.

පාසල් අවධියේදීම ලේඛන කලාවට පිවිසුණු සුරවීර මහතා 1957 දී තම මුල්ම කෘතිය වූ "විචාර විලාසය" එළි දැක්වූයේය. එතැන් පටන් එතුමා අතින් සම්භාව්‍ය සාහිත්‍යය, ශිලාලේඛන, සංස්කෘතිය, ඉතිහාසය, පෙරදිග හා අපරදිග සාහිත්‍ය විචාරය, නූතන සාහිත්‍යය යනාදී විවිධ විෂයයන් යටතේ ලියූ කෘතීන්ද, සම්භාව්‍ය ග්‍රන්ථ, ශාස්ත්‍රීය සංස්කරණ, නව කතා, කෙටි කතා, ළමා කෘති ආදී වශයෙන් සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම සම්පාදනය වූ ග්‍රන්ථ සංඛ්‍යාව හැට ඉක්මවා ඇත. ඊට අමතරව ශාස්ත්‍රීය හා පර්යේෂණාත්මක ලිපි ගණනාවක්ද එතුමා අතින් ලියැවී ඇත.

සම්මානනීය ගත් කතුවරයෙකු වූ ඒ.වී. සුරවීර මහතා අධ්‍යාපනයේ ගුණාත්මක භාවය රැකගනිමින් වෘත්තීය ජීවිතයේ අවසානය දක්වා දශක හතරකට ආසන්න කාලයක් සිය බුද්ධිමය මෙහෙවර රටට දායාද කළේය. එතුමා රචනා කළ සෑම ග්‍රන්ථයකින්ම පාහේ 1956 පෙරළියේ සංස්කෘතික සාරයන්, දේශපාලන හරයන් අනාගත පරපුර වෙත දායාද කිරීමටද වග බලා ගෙන තිබීම විශේෂත්වයකි.

විශ්වවිද්‍යාල සේවාවේ නියැලෙද්දී තමන්ට හිමිවන සප්ත වාර්ෂික නිවාඩු කල් දමමින් සිටි සුරවීර මහැදුරුතුමා 1968 - 1969 අධ්‍යයන වර්ෂයේදී ආසියානු පදනම මඟින් පිරිනැමූ ශිෂ්‍යත්වයක් ලැබ ඇමෙරිකාවේ අයෝවා සරසවියෙන් ජාත්‍යන්තර නිර්මාණ පාඨමාලාව සඳහා Fellow in Writing ඩිප්ලෝමාව ලබා ගත්තේය. පෙරළා සිය රටට පැමිණි එතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සාහිත්‍ය නිර්මාණ පාඨමාලාවක් ආරම්භ කළේ මෙරට එම ක්ෂේත්‍රයෙන් ප්‍රථම වතාවට ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් පිරිනැමීමට අවස්ථාව සලසමිනි.

පොදු රාජ්‍ය මණ්ඩලීය අධිශිෂ්‍යත්වයක් යටතේ එක්සත් රාජධානියේ කෙන්ට් විශ්වවිද්‍යාලයේ සමාජයීය සාහිත්‍යය අධ්‍යයන ක්ෂේත්‍රයේ පර්යේෂණවල නිරත වූ සුරවීර මහතා ලන්ඩන් සරසවියේ පෙරදිග හා අප්‍රිකානු අධ්‍යයන ආයතනයේ සිංහල පිළිබඳ ආරාධිත මහාචාර්යවරයා ලෙස බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පෙරදිග ලේඛන පුස්තකාලයේ පුස් කොළ පොත් අධ්‍යයනයක යෙදීමට ද වාසනාව හිමි කර ගත්තේය. මේ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සෑම අවස්ථාවකින්ම ලද දැනුමින් එතුමා තම රටේ දූ දරුවන්ගේ දැනුම වඩා වර්ධනය කරලීමට ඉමහත් වෙහෙසක් දැරූ බව නොරහසකි.

වාමාංශික මත දැරූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකයකු වූ එතුමා 1994 වසරේදී අනපේක්ෂිත අයුරින් සරසවි සේවාවෙන් ඉවත් විය. එම වසරේ පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයට ගම්පහ දිස්ත්‍රික්කයෙන් පොදුජන එක්සත් පෙරමුණ යටතේ තරග කළ සුරවීර මහතා ඉන් ජය ලබා මෙම උත්තරීතර සභාවේ අසුන් ගැනීමට වාසනාවන්තයකු විය. බලයට පැමිණි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග රජයේ සංස්කෘතික හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු භාරගත් එතුමා එම තනතුර තුළින් විශාල කාර්යභාරයක් ඉටු කරමින් අනාගත පරපුර වෙනුවෙන් අපේ සංස්කෘතිය රැක ගැනීමට අනුපමේය දායකත්වයක් ලබා දුන්නේය.

එම කාල වකවානුව තුළ හෙළ සංස්කෘතියේ උන්නතිය වෙනුවෙන් කැප වන කලාකරුවන් 150 දෙනෙකු වෙත සමාදාන විනිශ්චයකාර තනතුරු පිරිනැමීම, කෞතුකාගාර පුස්තකාල සංරක්ෂණ ව්‍යාපෘතිය ආරම්භ කිරීම, රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම, ප්‍රාදේශීය මට්ටමින් සාහිත්‍ය කලා ප්‍රසාදිනී උත්සවය සංවිධානය කිරීම, හටන් කාව්‍ය ව්‍යාපෘතියක් ආරම්භ කිරීම, සංඛ සහරාව ක්‍රමවත් හා විධිමත් ස්වරූපයෙන් පවත්වාගෙන යාම හා දිවයින පුරා සංස්කෘතික මධ්‍යස්ථාන ආරම්භ කිරීම වැනි කාර්යයන් රැසක් ඉටු කිරීමට එතුමාට හැකි විය.

2000 වර්ෂයේදී මන්ත්‍රී ධුරයෙන් ඉවත් වීමෙන් පසු මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති වැනි තනතුරු හෙබවූ සුරවීර මහතා රජරට විශ්වවිද්‍යාලයේ කුලපති වශයෙන් ද ගෞරවනීය තනතුරක් හෙබවූයේය. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයටත්, පොදුවේ සාහිත්‍ය කලාවටත් එතුමා අතින් ඉටු වූ අමිල මෙහෙවර උදෙසා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් 'සේවාර්ජිත මහාචාර්ය' නම් වූ විශිෂ්ට සම්මානයත්, 'සාහිත්‍ය සූරී' සම්මාන උපාධියත් පිරිනමනු ලැබිණි.

එක් එක් වර්ෂය තුළ සම්පාදනය කරන ලද විවිධ සාහිත්‍ය කෘති වෙනුවෙන් පිරිනමන ලද සම්මානවලින් වැඩිම ගණනක් හිමි කර ගැනීමට සමත්කම් දැක්වූ සුරවීර මහතාගේ, අගැයීමට පාත්‍රවූ ලේඛන අතර "අනුරාධපුර සංස්කෘතිය සහ රාජාවලී සංස්කරණය", "හෙයියම්මාරුව", "සදා මෙලෙස පුර දෙරණේ", "පැදි දියට බොර දිය" සහ "ගොදුරු ලොබ" වැනි ග්‍රන්ථ ඉහළින්ම කැපී පෙනෙයි.

එතුමාගෙන් සාහිත්‍ය ක්ෂේත්‍රයට සිදු වූ උසස් මෙහෙවර අගය කරමින් 1980 දී හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා අතින් "කලා කීර්ති" ජාතික සම්මානය පිරිනමන ලදී. එසේම සාහිත්‍ය උන්නතිය උදෙසා කරන ලද විශිෂ්ට මෙහෙවර අගය කරනු වස් 2008 වර්ෂයේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් "සාහිත්‍ය රත්න" සම්මානය ද ලැබීමට එතුමා වාසනාවන්ත විය.

තම ජීවිත කාලයෙන් වැඩි කොටසක් විශ්වවිද්‍යාල කටයුතු වෙනුවෙනුත්, සාහිත්‍ය වෙනුවෙනුත් කැප කරමින් ක්‍රියා කළ මහාචාර්ය සුරවීරයන්ගෙන් එකී ක්ෂේත්‍රයන් වෙත ප්‍රශංසනීය සේවාවක් ලැබුණි. තමන්ගෙන් අධ්‍යාපනය ලද සිසු පරපුරට පමණක් නොව, අනාගත සිසු පරපුර වෙනුවෙන් ද ග්‍රන්ථ සම්පාදනය කරමින් එතුමා කළ මෙහෙවර සදානුස්මරණීය වේ. එපමණකින් නොනැවතී සංස්කෘතික නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන්ද, දේශපාලනඥයකු වශයෙන්ද සුරවීර මැතිතුමා අතින් ඉටු වූ අනභිභවනීය සේවාව කිසි දිනක අමතක කළ නොහැකි තරම්ය.

මෙවැනි උදාර මෙහෙවරක් වත්මන් පරපුරටත්, මතු පරපුරටත් ඉටු කළ ඒ උදාර සාහිත්‍යධරයා, විචාරකයා, ප්‍රවීන දේශපාලනඥයා පවුලේ ඥාතීන්ට පමණක් නොව, උගත් දරු පිරිසට ද, රටවාසීනට ද දැඩි වේදනාවක් ගෙන දෙමින් අවුරුදු 84ක් ආයු වළඳා 2014 ජනවාරි මස 14වන දින මෙලොවින් සමු ගත්තේය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධ්‍යාපනය හා සාහිත්‍ය කෙරෙහි සෑම විටම තම සේවය කැප කළ සැබෑ මානව හිතවාදියකු වූ හිටපු සංස්කෘතික සහ ආගමික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය සහ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනය කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි. බොහොම ස්තුතියි.

[අ.භා. 2.34]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු සභානායකතුමා ඉදිරිපත් කළ කරුණු අනුමත කරන අතර, මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමා අපේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට පැමිණ නියෝජ්‍ය ඇමති ධුර දෙකක් දරමින් කලා ක්ෂේත්‍රයටත්, අධ්‍යාපන ක්ෂේත්‍රයටත් ඒ යුගයේ සුවිශේෂ සේවාවක් කළායි කියන එක අපි කවුරුත් පිළිගන්නවා.

එතුමා ගැන කථා කරන කොට බොහෝ දෙනකු එවකට සහ ඔහුගේ ඒ පාර්ලිමේන්තු කාල සීමාවෙන් පසුව සඳහන් කළේ, සිංහල සාහිත්‍ය බැබළවූ, කලා සාහිත්‍ය පෝෂණය කළ දීප්තිමත් විද්වතකු හැටියටයි. ඒ හා විශාල සේවාවක් එතුමාගෙන් ඉටු වුණා.

එතුමා හොඳ අධ්‍යාපනයක් ලබා විශ්වවිද්‍යාල උපාධිය, එම්ඒ උපාධිය, ආචාර්ය උපාධිය ආදී උපාධි ලබා ගෙන ගුරුවරයකු වශයෙන් වෘත්තීය ජීවිතය ආරම්භ කළා. එතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විවිධ තනතුරු දරමින් පීඨාධිපති හා වැඩබලන උපකුලපති වශයෙන්ද කටයුතු කළා. ඒ වාගේම දෙස් විදෙස් විශ්වවිද්‍යාලවලට එතුමාගේ සේවය, දැනුම ලබා ගන්න අවස්ථාවක් ලැබුණා.

එතුමා අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල සේවාවක් කළා පමණක් නොවෙයි, ග්‍රන්ථ නිර්මාණයේද යෙදුණා. විශ්වවිද්‍යාල වෘත්තියෙන් සමු ගෙන දේශපාලනයට පිවිසි එතුමා විවිධ තනතුරු ලබා ගෙන, ඒ තනතුරුවලින් බලාපොරොත්තු වුණේ නිදහස් අධ්‍යාපනයේ මහඟු ඵල සියල්ලන්ටම සම සේ බෙදී යන නව අධ්‍යාපන ක්‍රමයක් සඳහා සැලැස්මක් ඉදිරිපත් කරන්නයි. එතුමා එවැනි සැලැස්මක් ඉදිරිපත් කළාය කියන එක මට මතකයි. නමුත් අවාසනාවකට ඒ ආණ්ඩුවේ හිටපු මැති ඇමතිවරු කොටසක් එතුමාගේ ඒ සැලැස්ම ක්‍රියාත්මක කරන්න ඉඩ දුන්නේ නැහැ. එය අඩපණ කරලා දැම්මා. එතුමාට ඕනෑ කර තිබුණේ දේශපාලන භේදයෙන්, පන්ති භේදයෙන් තොරව අපේ සියලු තරුණ තරුණියන්ට සාධාරණ අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ බිහි කිරීමයි. ඒක තමයි අද අවශ්‍ය වෙලා තිබෙන්නේ. අද ඒ දැක්ම අපේ රජයේ සිටින මැති ඇමතිවරුන් තුළ නොතිබීම නිසා විශ්වවිද්‍යාලවල, විද්‍යාලවල විවිධ ප්‍රශ්න පැන නැඟී තිබෙනවා. ඒක අපේ කනගාටුවට කාරණයක්.

ඒ කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සාහිත්‍ය කලා ක්ෂේත්‍රය පෝෂණය කළ මේ මහා විද්වතාගේ ජීවිතය දෙස බැලුවාම, එතුමාගේ ක්‍රියා කලාපය දෙස බැලුවාම සාහිත්‍ය සහ කලා ක්ෂේත්‍රය තුළ අමරණීය සිහිවටන රැසක් තබමින්, ඒ යුගයේ සිටි

පක්ෂ විපක්ෂ සියලු දේශපාලනඥයන්ගේ ගෞරවයට ලක් වුණාය කියන එක අපට කියන්න පුළුවන්.

මම දන්නවා, සුරවීර ඇමතිතුමා - මාත් ඒ කාලයේ පාර්ලිමේන්තුවේ හිටියා- බොහොම සාධාරණව, නිශ්ශබ්දව, කිසි කෙනෙකුට චෝදනාවක් නොකර එතුමාගේ කාර්යභාරය ඉටු කළ ආදර්ශවත් දේශපාලනඥයකු බව. ඒ නිසා අපි කනගාටු වෙනවා, එතුමා අද අප අතරේ නොසිටීම ගැන.

එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ සියලු දෙනාටම විපක්ෂය වෙනුවෙන් අපගේ කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. එතුමාගේ සේවාව අදටත් අමරණීයයි කියන එක මතක් කරමින්, එතුමාට නිවන් සැප ලැබේවා! යි කියා මා ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 2.38]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ කනගාටුව ප්‍රකාශ කරමින් සිහිපත් කරන්නේ ලංකාවේ උගතුන් අතර ඉතා ඉහළ තැනක වැජඹුණ ශ්‍රේෂ්ඨ පුද්ගලයකු ගැනයි. ඒ තමයි මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමා. ඒ.වී. සුරවීර මහාචාර්යතුමා සහ මම ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළු වුණේ එකම කාලයේදී. අපි දෙන්නා වාඩි වෙලා සිටියේත් එක ළඟින්. මුළු අවුරුද්දක්ම අපි දෙන්නා සිංහල අංශයේ සිටිමින් සිංහල භාෂාව හැදෑරුවා. ඊට අවුරුදු දෙකකට පස්සේ විශ්වවිද්‍යාලය පේරාදෙනියට අරගෙන ගියා. එතුමාත් අපිත් එක්ක ගියා. ඊට පස්සේ එතුමා අධ්‍යාපනයට ජීවිතය පූජා කරලා රට වෙනුවෙන් සාහිත්‍යමය සේවයක් කළා. ඒකට මුළු ලංකාවම සාක්ෂි දරනවා.

පුද්ගලයකු වශයෙන් ගත්තොත්, ඒ.වී. සුරවීර මැතිතුමා තරම් නිහතමානී, කුලුණුබර, ඒ වාගේම, හැදිච්චබව, භක්තිවන්ත බව නිතරම පෙන්නුම් කරපු උගතෙක් මම විශ්වවිද්‍යාල කාලයේදීවත් දැක්කේ නැහැ. එතුමා කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙන ගෙන ඉතාම ඉහළින් විභාගය සමත් වෙලා තමයි විශ්වවිද්‍යාලයට ආවේ. එතුමා විශ්වවිද්‍යාලයට ආපු දා ඉඳලාම ප්‍රසාදය දිනා ගත්තා. එතුමා ඉතාම දක්ෂ ලෙස සිංහල විෂය අධ්‍යයනය කරලා ඉහළම උපාධියක් ලබාගෙන ඉහළම තනතුරක රාජකාරි කරන්න සුදුසුකම් ලැබුවා.

ගරු සභානායකතුමාත්, විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඒ.වී. සුරවීර මහත්මයාගේ ඉතිහාස කථාව තුළින් එතුමා සාහිත්‍යයට හා සමාජයට කළ සේවාව පිළිබඳව ප්‍රකාශ කළා. ඒ නිසා මම නැවත ඒ පිළිබඳව කියන්න යන්නේ නැහැ. නමුත් දැන ගත යුතු දෙයක් තිබෙනවා. 1942 දී පිහිටුවන ලද ලංකා විශ්වවිද්‍යාලය මහා අභියෝගයකට මුහුණ දුන්නා. අවුරුදු 5කින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව ලංකාව අත්හැරලා යන්න ගියා. සුදු නිලධාරීන් ඔක්කෝම ලංකාව අත්හැරලා එංගලන්තයට යන්න ගියා. එතකොට ගරු ඩී.එස්. සේනානායක මහත්මයා ලංකා විශ්වවිද්‍යාලයෙන් ආයාචනයක් කළා, "මට මේ රට ගෙන යන්න වහාම උගතුන් දෙන්න, මට මේ රට ගෙන යන්න යුද්ධ හමුදාවකට අවශ්‍ය නිලධාරීන් සපයන්න, සියලු දෙනාම දැන් ගිහින් හුදෙකලා නිසා මේ ආණ්ඩුව ගෙන යන්න මේ විධියේ ඉල්ලීමක් කරන්න මට සිද්ධ වෙලා" කියලා. ඉතාම ආඩම්බරයෙන් කියන්න ඕනෑ, අවුරුදු 6ක් ගතවෙන්න ඉස්සෙල්ලා ලංකා විශ්වවිද්‍යාලය -එවකට ඒක කොළඹ තිබුණේ- ඉතාම විශිෂ්ඨ ශිෂ්‍ය පරම්පරාවක් බිහි කළා. බිහි කරලා කථිකාචාර්ය පදවි, මහාචාර්ය පදවි, පීඨාධිපති පදවි ඇතුළු ඒ සියලුම අංශ භාර ගන්න පුළුවන් ඉහළම පෙළේ අය සමත් කරලා ඒ අයට තනතුරු දුන්නා. ඒ උතුම් තනතුරකට පත් වුණු ඉතාම තරුණ හා දක්ෂ පුද්ගලයෙක් තමයි ඒ.වී. සුරවීර මහත්මයා කියන්නේ. එතුමා ගැන තමයි අපි අද ශෝකය පළ කරන්නේ.

මේ කාරණය වැදගත්ම දෙයක්. මේ ගරු සභාවට පය තැබූ, මේ ගරු සභාවට ඇවිල්ලා වාඩි වුණු මහත්වරු අතරින්, වැජඹුණු මහත්වරු කිහිප දෙනා අතරින් ඉහළම තැනක ඉන්න, හදවතේ මහත්මා ගතිය තිබුණු උතුම් කෙනෙකු හැටියට මා සලකන්නේ, විශ්වවිද්‍යාල වියේ සිට මරණය දක්වා කාලය තුළ මා අතිසහෝදරත්වයෙන් සලකපු, ආශ්‍රය කරපු ඒ.වී. සුරවීර මැතිතුමායි.

මෙතුමා ගැන මා දීර්ඝ විස්තරයක් කළ යුතුයි. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අය සහ මහජනතාව එකතුවෙලා සිංහල සාහිත්‍යය යටතේ එතුමා වෙනුවෙන් දිනයක් වෙන් කරලා උත්සවයක් පවත්වලා එතුමා සිහිපත් කළ යුතුයි. එතුමා නිකම් හිටියේ නැහැ. අවුරුදු 50කට වැඩි කාලයක් තිස්සේ සාහිත්‍යයට ඇප කැප වුණු නිහඬ, නිහතමානී චරිතයක් එතුමා. සාහිත්‍ය, කලා, සංස්කෘතික ආදී සෑම අංශවලම සුරවීර මහත්මයාගේ නම සඳහන් වෙලා තිබෙනවා.

ඊටත් වඩා මගේ ආඩම්බරයට හේතුවන කාරණයක් තිබෙනවා. 1956 දී බණ්ඩාරනායක මැතිතුමාගේ විප්ලවය සිදු වෙන කාලයේ සුරවීර මහත්මයා ඇතුළු අප සියලුම දෙනා විශ්වවිද්‍යාලය අධ්‍යාපනය හමාර කරලා සමාජයට බැහැලා හිටියේ. ඒ වෙලාවේ අපට අභියෝගයක් තිබුණා, උගත්කම ප්‍රදර්ශනය කිරීම සඳහා ඒ ඒ ක්ෂේත්‍රවල කටයුතු කරන්න. එතුමා අධ්‍යාපන කටයුතු භාර ගත්තා. ඒ කාලයේ අපේ මහාචාර්යවරයෙක් හිටියා. සුරවීර මහත්මයාටත් මටත් එතුමා නිතරම කිව්වා, "නුඹ විශ්වවිද්‍යාලයේ පන්තියකට ගිහින් පැයක පාඩමක් කරනවා නම්, දේශනයක් කරනවා නම්, පැය තුනක් සූදානම් වෙලා මිසක් පන්තියට යන්න එපා. එහෙම කළොත් ඒක විශ්වවිද්‍යාලයකට සුදුසු නැහැ. උගත් ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාලයකට එන්නේ දිනපතා දැනුම් පොකුරක් අරගෙන එළියට යන්න. මේ ශිෂ්‍යයන්ගේ ඔළුව පුරවන්න දැනුමෙන්. මේ ශිෂ්‍යයන්ගේ ඔළුව පුරවන්න අභිලාෂයක් ඇති කරලා. මේ ශිෂ්‍යයන් තුළ අභිමානයක් ඇති කරන්න. අනාගතය පිළිබඳ ආඩම්බරයක් ඇති කරන්න" කියලා.

අද වාගේ නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වයස අවුරුදු 23 කියන්නේ විශ්වවිද්‍යාල කාලයේ ඉතාම ආඩම්බර වයසක්. ඉතාම දක්ෂ ළමයි පවා වයස අවුරුදු 22 ඉවර වෙන්න ඉස්සර සිවිල් සේවාවට ඇතුළත් වෙන්න ඕනෑ. සිවිල් සේවා විභාගය ශිෂ්‍යයන්ගේ වයස අවුරුදු 22 ඉවර වෙන්න ඉස්සර පැවැත්වූවා. එදා වයස අවුරුදු 17දී තමයි විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණේ.

ඒ කාලය තුළදී කෙනෙක් අංග සම්පූර්ණ උගතෙක් බවට පත් වෙලා, වයස අවුරුදු 22දී සිවිල් සේවා විභාගයෙන් සමත්වෙලා ලංකාවේ ඉතාම උසස් පදවි භාර ගන්න පුළුවන් තත්ත්වයට හැඩගැහෙනවා. ඒ අය අවුරුදු 2ක්, 3ක් කච්චේරියේ clerk මට්ටමේ ඉඳලා ඒජන්ත මට්ටම දක්වාත්, පොඩි පොඩි තැන්වල ඉඳලා, පොලීසියේ ASP මට්ටමේ ඉඳලා, අමාත්‍යාංශයක ලේකම් මට්ටම දක්වාත් මාස හයෙන් හයට පුහුණු කරනවා. එහෙම පුහුණු කරලා අංග සම්පූර්ණ වුණු සිවිල් සේවකයන් බිහි කරලා තමයි එදා ලංකාව භාර දුන්නේ. එදා ලංකාවට පළාත් නවයයි තිබුණේ. ඒ පළාත් නවයට නව දෙනෙකු පත් කළා. ඊළඟ වර්ෂයේ දී ඒ නව දෙනා උගතුන් කරලා, නව දෙනාට සුදුසු අනාගතවාදී අධ්‍යාපනයක් ලබා දීලා කටයුතු කිරීම තමයි විශ්වවිද්‍යාලයේ පරම යුතුකම වෙලා තිබුණේ. ඒ කටයුත්ත හදවතෙන් හා හිසෙන් භාර ගෙන කටයුතු කරපු, සදාකාලික නමක් තබපු උගත් මහාචාර්යවරයෙක් තමයි අපේ ඒ.වී. සුරවීර මැතිතුමා.

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

එතුමා විශ්වවිද්‍යාලයේ දේශන ඉවර වුණු හැටියේ බොහොම සෙමින් ගිහින් පුස්තකාලයේ වාඩි වෙනවා. ආපසු නැඟිටින්නේ සමහර වෙලාවට සවස පහ, හය වන තුරු තොරතුරු අරගෙනයි. මමත් හුඟාක් වෙලාවට කල්පනා කර කර ඉඳලා වටපිට බලනවා, එතුමා යනවාද කියලා. නැහැ, සූරවීර මැතිතුමා තවම පාඩම් කරනවා. මමත් තව ටිකක් වෙලා ඉන්නවා. එතුමා අධ්‍යාපනයට බොහොම ලැදි වුණු කෙනෙක්. සිංහල සාහිත්‍යයට විතරක් නොවෙයි, සිංහල ඉතිහාසයට ලැදි වුණු උතුම් කෙනෙක්. එතුමාගෙන් ලබා ගත් ආදර්ශ මට හරි බලපෑමක් වුණා. එතුමාගේ ශිෂ්‍යයෝ ඉන්නවා. එතුමා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ උගතෙකු දැරිය යුතු සියලුම උසස් සම්මානනීය පදවි දැරුවා. එතුමා සංස්කෘතික අංශයේ දැරිය යුතු පදවි දැරුවා. ඒ වාගේම සමාජයට ලැබිය යුතු, උගතුන්ට ලැබිය යුතු, උගත් ප්‍රකාශන එතුමාගේ පෑනෙන් ගලාගෙන ආවා. එතුමා අභාවප්‍රාප්ත වුණේ මේ වර්ෂයේ ජනවාරි මාසයේ යි. මේ ශෝක ප්‍රකාශය විතරක් නොවෙයි, අපි එතුමා වෙනුවෙන් වඩාත් විශිෂ්ට උත්සවයක් පැවැත්විය යුතුයි. සාහිත්‍ය කලා අම්බරේ පියෙක් විධියට ජනතාව වෙනුවෙන් කැපවුණු මේ උතුම් මහාචාර්යවරයා වෙනුවෙන් අපි මීට වඩා විශිෂ්ට දෙයක් කළ යුතුයි.

එතුමාගේ දරුවෝ ඉන්නවා. අධ්‍යාපනයට යොමු වුණු වැදගත් විනීත දරු කැලක් ඉන්නවා. ගරු බණ්ඩාරනායක මැතිනිය මුල් අවස්ථාවේ ඉඳලාම එතුමා ගැන සැලකිල්ලක් දැක්වුවා. සැලකිල්ලක් දක්වා විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට එතුමාව පත් කළා. ගරු බණ්ඩාරනායක මැතිනිය කථා කරනකොට සෑම වෙලේම කිව්වේ, "ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයට අප සමබර නියෝජනයක් දිය යුතුය "කියායි. ඔහොම කිය කියා ඉඳලා තමයි, එතුමියගේ තීන්දුවක් උඩ ඒ.වී. සූරවීර මහත්මයා ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්, පසුව ඇමතිවරයෙක් වශයෙන් පත් කරන්නට යෙදුණේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බණ්ඩාරනායකලා ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ලංකාව පුරාම මේ රටේ ජනතාවට සමබරව, සාධාරණව සලකනවාය කියන පණිවුඩය දීම සඳහා තමයි ලංකාවට ආඩම්බරයක් වුණු සූරවීර මහත්මයාව ඔසවා අරගෙන පාර්ලිමේන්තුවේ තියලා ගෞරවය දැක්වුයේ. මම ඒක දන්නවා. මම සූරවීර මහත්මයාට සුභ පතන්නටත් ආවා. ඇවිල්ලා මම කිව්වා, "ඒ.වී. පුදුම ගමනක් ඔබ ආවේ. ඔබට සලකා තිබෙන්නේ ලංකාවේ කිසිම කෙනෙකුට සැලකුව ආකාරයට නොවෙයි, ඊට වඩා උසස් ලෙසයි"යි කියා. හොරගොල්ලෙන් ඔහොම සැලකුව කෙනෙක් මුළු ගම්පහ දිස්ත්‍රික්කයේම නැහැ. ඒ සැලකිල්ල උඩ තමයි අභාවප්‍රාප්ත වන මොහොත දක්වා ඒ.වී. සූරවීර මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උතුම් මැණික් ගලක් හැටියට අප කවුරුත් සලකාගෙන හිටියේ කියන කාරණය මම මේ ගරු සභාවේදී කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට හරිම සන්තෝෂයි එතුමාගේ ජීවිතය ගැන. එතුමාගේ චරිතය ඉතාම මෘදු චරිතයක්. ඒ වාගේම එතුමා පැන බිම තිබ්බෙ නැහැ; නිකම් හිටියේ නැහැ. එතුමා පර්යේෂණාත්මකව තොරතුරු සොයමින්, ඒවා ජනතාවට දෙමින්, දේශන පවත්වමින් කටයුතු කළා. ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වුණාට, සිංහල සාහිත්‍යය, සිංහල ඉතිහාසය සහ සංස්කෘතිය ගෙනියන්න - අත්වැල ගෙනියන්න - ගුරුවරු ඕනෑ. ඒ විධියේ කවදාවත් නම අමතක නොවන ගුරුතුමෙක් තමයි ඒ.වී. සූරවීර මහත්මයා. ළමයින්, ගෙදර ඇත්තෝ ඒ මහත්මයාට සෑම උදෑසනකම පින් දීලා මිසක් නැඟිටින්නට එපා. මේ තරම් සෞම්‍ය හිතකින්, සාධාරණ හිතකින් ලංකාවට, ලංකා සමාජයට, දේශපාලනයට, අපේ පක්ෂයට සේවය කරපු උත්තමයෙක් නැහැයි කියා මම ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගේ ජීවිතයේ සියලුම පැති මම දන්නවා. අපි දෙදෙනා හැදී වැඩී තිබුණේ මේ සමාජයේ නොවෙයි මීට වඩා දරුණු සමාජයක. අපි දෙදෙනා විශ්වවිද්‍යාලයට යනකොට විශ්වවිද්‍යාලයේ සිටි ශිෂ්‍ය සංඛ්‍යාව අට සියයයි. දැන් ඒක ඉතා විශාල සංඛ්‍යාවක් බවට පත් වෙලා තිබෙනවා. අපේ faculties වල තිහ හතළිහකට වඩා සිසුන් සිටියේ නැහැ. ඔහොම තමයි අප ඉගෙන ගත්තේ. අප වැඩි කාලයක් ගත කළේ පුස්තකාලයේයි. පොත් කියෙව්වා. අපේ මහාචාර්ය ගුරුතුමා අප ඔක්කොටම දුන් පාඩම, 'නුඹලා පැයක දේශනයක් කිරීම සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළු වෙනවා නම්, පැය තුනක් සූදානම් වෙලා මිසක් විශ්වවිද්‍යාලයට යන්න එපා. දේශනයකට එහෙම සූදානම් වෙලා නොයනවා නම් ඒක ළමයින්ට කරන අසාධාරණයක්.' කියන එකයි. පාසලක වේවා, විශ්වවිද්‍යාලයක වේවා, ගුරුවරයෙකුගේ යුතුකම වන්නේ පැයක දේශනයක් කරනවා නම් පැය තුනක් දිනපතා සූදානම් වෙලා ගිහින්, ළමයින් කලින් දිනයට වඩා දැනුමෙන් බඹයක් දෙකක් ඉදිරියට ගෙන යාමයි. ඒක තමයි අප කළේ. ඊට පස්සේ සූරවීර මහත්මයාත් ගුරුවරයෙක් වුණා. මාත් ගුරුවරයෙක් වුණා. මා විශ්වවිද්‍යාලයේ ඉගැන්නුවා. ඊට පසුව ආනන්ද විද්‍යාලයේ ඉගැන්නුවා.

මගේ මුළු හදවතේම රැව් පිළිරැව් දුන්නේ, සූරවීර මහත්මයාටයි, මටයි. අපේ මහාචාර්යතුමා දුන් ඒ පඬිවදනයි. "පැයක දේශනයක් කරනවා නම්, පැය තුනක් සූදානම් වෙලා මිසක් පන්තියට ඇතුළු වෙන්න එපා. උගතෙකු බිහි කරන්න බැහැ. නුඹ උගතෙකු නම්, ඒ උගත්කම ළමයින්ට දීම සඳහා අන්න ඒ මාවත තෝරා ගන්න" කියලා එතුමා අපට කිව්වා.

මෙවැනි ශ්‍රේෂ්ඨ ගුරු පරම්පරාවක් නැවත ඇති වෙයිද කියලා මම දන්නේ නැහැ. නමුත්, මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා, ලංකාවේ අද සිටින වයස අවුරුදු 25 පරම්පරාව අතිවිශිෂ්ට පරම්පරාවක් වෙයි කියලා. ඔවුන් තුළ අඩු පාඩුකම් තිබෙනවා. නමුත්, ලංකා සමාජයේ ඉතාම ඉහළ වගකීම් දරන්න පුළුවන්, විසිඑක්වැනි ශතවර්ෂයට යා හැකි පුරෝගාමී පරම්පරාවක් දැන් පහළ වෙලා තිබෙනවා. එලෙස පහළ වුණු ඒ පරම්පරාවට පුස්තකාල පමණක් මදි. ඒගොල්ලන් දැන් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙනුත් හිතනවා; තොරතුරු ගන්නවා. මේ සියල්ලෙන්ම ගිහිල්ලා අපි දැන් නියම බුද්ධිමතුන් පහළ කළ යුතුව තිබෙනවා. මේ විසිඑක්වැනි ශතවර්ෂයේදී ලංකාවට ගරු මහාචාර්ය ඒ.වී. සූරවීර මහත්වරු වාගේ විශාල පිරිසක් අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්වවිද්‍යාල ගුරුවරයෙකු අංග සම්පූර්ණ ලෙස තමන්ගේ යුතුකම ඉෂ්ට කරලා තමන්ට අයිති පීඨයේ වැජඹෙනවා නම්, ඒ විශ්වවිද්‍යාලයේ නම ප්‍රසිද්ධ වන්නේ විශ්වවිද්‍යාලයේ බෝඩ් ලෑල්ලෙන් නොවෙයි, ඒ අදාළ ගුරුවරයාගෙන්. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ සරත්චන්ද්‍ර කෙනෙකු හිටියා. එතුමා සිටි යුගයට "සරත්චන්ද්‍ර යුගය" කියලා කියන්න පටන් ගත්තා. ඒ ඇයි? සරත්චන්ද්‍ර මහත්මයා, එතුමාගේ පෞරුෂත්වය, හැකියාව, දක්ෂකම, නිර්මාණ සමාජයට පිළිබිඹු කරලා දුන්නා, ප්‍රක්ෂේපණය කළා.

එංගලන්තයේ ප්‍රධාන විශ්වවිද්‍යාලයක් තිබෙනවා, London School of Economics and Political Science කියලා. London School of Economics and Political Science කියලා කිව්වාට ඒ විශ්වවිද්‍යාලය කවුරුවත් දන්නේ නැහැ. ඒ විශ්වවිද්‍යාලය හඳුනන්නේ "හැරල්ඩ් ජේ. ලැස්කි මහතාගේ පාසල" කියලායි. එතුමා ප්‍රසිද්ධ උගතෙක්. ආසියාවේ සිටින සියලුම උගතුන්ට උගත්කම රන් කිරි කට ගාපු ශ්‍රේෂ්ඨයෙක් තමයි, හැරල්ඩ් ජේ. ලැස්කි කියන්නේ. විශ්වවිද්‍යාලයක නම යන්නේ බෝඩ් ලෑල්ලෙන් නොවෙයි, ඒ විශ්වවිද්‍යාලයේ facultiesවල උගන්වන උසස්, කීර්තිමත් ගුරුවරුන්ගේ නමින්. විද්‍යා අංශවල, ඉංජිනේරු අංශවල ආදී අංශවල එහෙම කීප දෙනෙකු ලංකාවේත් සිටියා. මම ආඩම්බරයෙන් කියනවා, සිංහල සාහිත්‍යයේ නැඟීමේදී 1956 වර්ෂයේ ඉඳලා අපට එවැනි හත්, අට දෙනෙකු උදවු වුණු බව. සිංහල ඉතිහාසය විෂයයක් හැටියට අරගෙන ලංකාවට කැවීමට උනන්දු වුණු හත්, අට දෙනෙකු සිටියා. ඒ අය අතර සිටි කවදාවත්

නම නොමැකෙන ශ්‍රේෂ්ඨයෙකු තමයි, මහාචාර්ය ඒ.වී. සුරවීර මහත්මයා.

ඒ එක්කම අපත් එක්ක විශ්වවිද්‍යාලයේ හිටපු තව උගතෙකු පිළිබඳව මම මතක් කරන්න ඕනෑ. ඒ නොබෝ දා අභාවප්‍රාප්ත වුණු, මහාචාර්ය මැන්දිස් රෝහණධීර වියතා. අපට නැති වුණු ඉතිහාස පොතක් හැටියටයි මම එතුමාව සලකන්නේ. ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මහත්මයා අපට නැති වුණු සාහිත්‍යයක් පොතක් හැටියටයි මම සලකන්නේ. මේ වාගේ පුද්ගලයින් අපට අත්‍යවශ්‍යයි. අපේ facultiesවල ගෞරවය, නම්බුව හා තේජස රඳා පවතින්නේ මහාචාර්යවරුන්ගේ කීර්තිය, දක්ෂකම හා නිර්මාණය උඩයි.

මිත්‍රයෙකු හැටියට මම දවසක්, දෙකක් නොවෙයි, අවුරුදු 50කට වඩා දිගු කාලයක් ආශ්‍රය කරපු, එකට වැඩුණු, අපට මහා නිර්මාණයක් සපයා දුන් මේ උතුම් පුද්ගලයා; මේ උතුම් මහත්මයා ගැන මේ අවස්ථාවේදී මගේ ශෝකය පළ කරනවා.

එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ විශ්වාසය දිනා ගෙන, එතුමියගේ හදවතින්ම ඒ කීර්තිමත් පදවියට පත් කරන ලද කෙනෙක්. ලංකාවේ කිසි කෙනෙකුට ළඟා විය නොහැකි උසස් තැනකට ළඟා වූ මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බරපතළ ශක්තියක් ලෙස සෑම කල්හිම නැඟී සිටියා.

එතුමාගේ චරිතාපදානය පිළිබඳව ගරු සභානායකතුමා දීර්ඝ විස්තරයක් කළා. ඒ සියල්ලම අනුමත කරමින්, මම මේ ගරු සභාවෙන් සහ ජනතාවගෙන්, සාහිත්‍යධරයන්ගෙන්, සිංහල ජාතියට, භාෂාවට, සංස්කෘතියට ආදරය කරන අයගෙන් ඉල්ලීමක් කරනවා. අප සුරවීරයන්ට සලකන්නේ කෙසේ දැයි සාකච්ඡා කරලා, ඉදිරි කාලයකදී බොහොම තැන්පත්ව එතුමා වෙනුවෙන් ලංකාවේ ජනතාවගෙන් ඉටු විය යුතු කටයුත්ත පිළිබඳ මහා ජාතික උත්සවයක් පැවැත්විය යුතුයි කියලා වග කිව යුත්තන්ට මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ අපත් සමඟ එකට හැදිලා වැඩිලා, එකට ජීවත් වුණු, දේශපාලනයේදී කිසි දාක කෝප මුහුණක් නොපෙන්වපු, කෝප වෙනවාද කියලා දන්නෙත් නැති උත්තම පුරුෂයෙක් නැති වෙලා ගියා. මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් ලෙස එතුමාට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සාමාජිකත්වය ලැබී තිබුණා. ඒ සියල්ලම වෙනුවෙන් එතුමාට මගේ ගෞරවය හා ආදරය පිරිනමමින්, එතුමාගේ අභාවය පිළිබඳව එම පවුලේ සියලු දෙනාටම අපේ ශෝකය පළ කරමින්, මගේ කථාව සමාප්ත කරනවා.

[අ.භා. 3.01]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිවංගත මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක යෝජනාව ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේ එතුමාගේ චරිතය පිළිබඳව වචන කීපයක් කථා කිරීමට මටත් අවස්ථාවක් ලැබීම පිළිබඳව සතුටු වෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා සහ මට පෙර කථා කළ පක්ෂ, විපක්ෂ සියලුම කථිකයන් විසින් ඒ.වී. සුරවීර මැතිතුමා පිළිබඳව දීර්ඝ වශයෙන් ගුණ කථන කරන්න යෙදුණා. එතුමා අපේ සමස්ත රටටත්, සංස්කෘතියටත්, කලාවටත් කරන ලද සේවය කියා නිම කරන්න පුළුවන්කමක් නැහැ. අපට ඒ ගැන කියන්න බැහැ; අප දන්නේ නැහැ. ගත් කතුවරයෙකු ලෙසත්, තවත් විවිධ භූමිකාත් දරමින් එතුමා මේ රටට, සමාජයට, ප්‍රදේශයට එතරම්ම සේවයක් ඉටු කරපු කෙනෙක් කියන එක අපට ඉතාම නිර්භයව ප්‍රකාශ කරන්න පුළුවන්.

විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළ මහජන නියෝජිතයෙක් වූ එතුමා වැනි චරිත නිසා අපේ දිස්ත්‍රික්කයටත්, සියනෑ කෝරළයටත් විශාල ආලෝකයක් ලැබුණා. අප එතුමාව ඇසුරු කළා. මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සභිකයෙක්. යම් යම් දේශපාලන පක්ෂවල සාමාජිකයන් ලක්ෂ ගණන් ඉන්නවා. නමුත් පක්ෂයක මධ්‍යම කාරක සභාවට ඉන්නේ පනස් දෙනෙකුටත් වඩා අඩු ප්‍රමාණයක්. ලක්ෂ 50ක්, 60ක් වැනි නිල සාමාජිකත්වයක් තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැනි දේශපාලන පක්ෂයක මධ්‍යම කාරක සභිකයෙකු විධියට එතුමා අවසාන මොහොත වෙන තුරුම කටයුතු කළා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට එතුමාව පත් කළේ, එවැනි අය පක්ෂයේ මධ්‍යම කාරක සභාව තුළ සිටීමෙන් පක්ෂයටත් විශාල ගරුත්වයක්, වලංගුතාවක් ලැබෙන නිසායි. එවැනි උගත්, බුද්ධිමත් පුද්ගලයන් නියෝජනය කරන දේශපාලන පක්ෂයක් විධියට පක්ෂයටත් විශාල ගරුත්වයක් ලබා ගැනීමේ අරමුණ ඇතිව තමයි අපේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවටත් එතුමාව පත් කරනු ලැබුවේ.

එතුමා ගම්පහ දිස්ත්‍රික්කයෙන් මැතිවරණයට ඉදිරිපත් වෙලා විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. සංස්කෘතික සහ ආගමික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට දිවංගත ලක්ෂ්මන් ජයකොඩි අමාත්‍යවරයා සමඟ එකතු වෙලා ඒ අමාත්‍යාංශය තුළිනුත් විශාල සේවයක් ඉටු කළා කියන එක අපි කෘතවේදීව සිහිපත් කළ යුතුයි. අපේ ප්‍රදේශය නියෝජනය කළ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වූ එතුමාගෙන් අප වැනි දේශපාලනයට පිවිසුණු නවකයින් විශාල පාඩමක් ඉගෙන ගත්තා. උගතෙකු, බුද්ධිමතෙකු, ලේඛකයෙකු, ගත් කතුවරයෙකු වූ එතුමා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු, පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙකු වැනි තනතුරු දැරුවත් ඒ එක තනතුරක් නිසාවත් තම ජීවන රටාව වෙනස් කළේ නැහැ. ඇඳුමෙන් පැළඳුමෙන් වෙන්න පුළුවන්, ක්‍රියාකාරිත්වයෙන් වෙන්න පුළුවන්, හැසිරීමෙන් වෙන්න පුළුවන්, කථාබහෙන් වෙන්න පුළුවන්, ඒ හැම ආකාරයෙන්ම එතුමා සරල ජීවිතයක් ගත කළා. ඒ සරල බව බලපුළුවන්කාරකම් නිසා හෝ නිලතල නිසා හෝ වෙනස් කළේ නැහැ.

මේක අපට විශාල ආදර්ශයක්. මම පෞද්ගලිකව ලබා ගත්තු ආදර්ශය එයයි. විශේෂයෙන්ම මෙවැනි පුද්ගලයින් අද අපේ රටට අවශ්‍ය මොහොතක්. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට මේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙන යන මොහොතකදී මෙවැනි පුද්ගලයින් දහස් සංඛ්‍යාත ප්‍රමාණයක් අවශ්‍ය යුගයක තමයි අපි කවුරුත් බලාපොරොත්තු නොවූ ආකාරයට එතුමා අපි අතරින් වෙන් වුණේ. මිය යන්න දින කිහිපයකට පෙරත් එතුමා පොත් ලියමින් තමයි හිටියේ. මට එතුමාගේ ඒ අවසන් කටයුතුවලට යන්න බැරි වුණා. ඊට දිනකට පසුව මම ඒ නිවසට ගිය අවස්ථාවේදී එතුමා මිය යන්න දින කිහිපයකට පෙර ඒ ලියපු ඒවා මට එම මැතිනිය ඇතුළු ඒ පවුලේ අය පෙන්වූවා.

එතුමාගේ ජීවන රටාවේ, දෛනික ජීවිතයේ එක කොටසක් විධියට තමයි -දෛනික කාලසටහනේ එක කොටසක් විධියට තමයි - පොත් කියවීම, ලිවීම එතුමා කළේ. එය තම ජීවිතයේම

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

කොටසක් විධියට තමයි එතුමා සැලකුවේ. එම නිසා එතුමා මිය ගියත් එතුමා ඒ ලේඛන ගත කරපු ග්‍රන්ථයන් -පොත්පත්- මිය ගියේ නැහැ; ඒ පොත්පත්වල අඩංගු කරුණු මිය ගියේ නැහැ. අපේ රටේ ඉතිහාසය, සංස්කෘතිය පිළිබඳව - විවිධ ආකාරයේ කරුණු පිළිබඳව - එතුමා සිය ලේඛන කලාව තුළින් අපේ රටේ ඉදිරි අනාගත පුරපුරටත් ඒ අවශ්‍ය කරන පණිවුඩය ලබා දීලා තමයි එතුමා අප අතරින් වෙන් වුණේ. එතුමාගේ ඒ ලේඛන කලාව තුළින් එතුමා මේ සංස්කෘතියට තිබුණු දැඩි ලෙන්ගතුකම, ඕනෑකම ප්‍රදර්ශනය කළා. ඒ වාගේම එතුමාගේ ග්‍රන්ථවලින් තවත් දහස් සංඛ්‍යාත පිරිසක් ප්‍රයෝජන ගන්නවා නම් එය තමයි එතුමාට තිබුණු සැබෑ අවශ්‍යතාව. එම නිසා එතුමා අපේ රටට ඒ දායාද කර දුන් ඒ ග්‍රන්ථයන් පිළිබඳව අපේ අනාගත පරපුර අධ්‍යයනය කරලා ඒවායේ තිබෙන කරුණු රටට වැඩදායී විධියට, තමන්ගේ ජීවිතවලට වැඩදායී විධියට යොදවා ගන්නවා නම් එය දිවංගත මහාචාර්ය සුරවීර මැතිතුමාට කරන්න තිබෙන ලොකුම උපහාරය විධියටයි මා පෞද්ගලිකව දකින්නේ.

අපේ දිස්ත්‍රික්කයේ සිටින අපේ ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාත්, අපේ සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් එතුමා ගැන කථා කරයි. එම නිසා අපේ දිස්ත්‍රික් නායක ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඇතුළු ඒ සියලු දෙනාගේත්, සමස්ත ගම්පහ දිස්ත්‍රික් ජනතාවගේත් ශෝකය, කනගාටුව එම ආදරණීය බිරිඳ, ඒ දූදරුවන් ඇතුළු පවුලේ සියලු දෙනා වෙත මේ අවස්ථාවේදී පළ කරමින් ඒ වාගේම මගේ පෞද්ගලික ශෝකයත්, කනගාටුවත් පළ කරමින් එතුමාට නිවන් සුව අත්වේවාය කියා මා ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 3.11]

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිවංගත මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී මටත් ඊට සම්බන්ධ වෙන්න අවස්ථාවක් ලැබීම ගැන මා විශේෂයෙන්ම සතුටු වෙනවා.

ඇත්තටම අපි එතුමාව හඳුනා ගත්තේ දේශපාලන න්‍යාය පත්‍රය තුළයි. ඒ වුණත් එතුමා හඳුනා ගත් දවසේ සිට එතුමාගේ සමාජ රටාව දිහා බලන කොට, එතුමා ගැන අසා තිබෙන විධියට අපට එතුමාගෙන් වැදගත් කරුණු රාශියක් ලබා ගන්න පුළුවන්. වැදගත්, උගත්, බුද්ධිමතකු වූ එතුමා මේ රටට අත්‍යවශ්‍ය කාලයකයි අපෙන් සමු ගත්තේ.

1930 වර්ෂයේදී මීනුවන්ගොඩ මැතිවරණ කොට්ඨාසයේ කොරස බලබෝව ග්‍රාමයේ උත්පත්තිය ලබා, ගම්පහ ඉංග්‍රීසි පාසලෙන් මූලික අධ්‍යාපනය සහ කොළඹ රාජකීය විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය හදාරා 1950 - 1951 කාලය තුළ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ එතුමා විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසුව ජීවිකා වෘත්තිය වශයෙන් තෝරා ගත්තේ මේ රටට ජාතික නායකත්වයක් බිහි කරන්න පුළුවන් ගුරු සේවයයි. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු, ඒ වාගේම සහාය මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු වශයෙන් කටයුතු කළ එතුමා මේ රටේ උගතුන් බිහි කරන්න අතිවිශාල මෙහෙවරයක් කළා. එතුමා විද්‍යෝදය විශ්වවිද්‍යාලය තුළ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන කාලය තුළ කොයි මොහොතකවත් ළමයින් සමඟ ගැටුමක් ඇති කර ගෙන ඒ තුළ රැඳී සිටීමට උත්සාහ කළ කෙනෙක් නොවන බව අපේ වැඩිහිටියන්ගෙන් හා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මැති ඇමතිවරුන්ගෙන් අපට දැන ගන්න ලැබුණා. එතුමාට බොහොම ඉවසීමේ ශක්තියක් තිබුණා. එම නිසාම එතුමාට පුළුවන්කමක් තිබුණා, විශ්වවිද්‍යාලයෙන් පිට වන මොහොත දක්වා හැම කෙනකුගේම ආදරය දිනා ගෙන කටයුතු කරන්න.

එතුමාට අපේ පක්ෂයෙන් හොඳ අවස්ථාවක් ලැබුණා, ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු හැටියට ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණ ඉන්පසු නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියට රටට විශාල වැඩ කොටසක් කරන්න. ඊට පස්සේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග කර අතිවිශාල මනාප සංඛ්‍යාවක් ගන්න තරම් එතුමා නිහතමානි පුද්ගලයකු බවට පත් වුණා. ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි රටේ සෑම ප්‍රදේශයකම එතුමාගේ ඥාතීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. එතුමාට පාර්ලිමේන්තුවේ ඒ තනතුර ලබා දෙන්න තමන්ගේ දේශපාලන පක්ෂයේ ඡන්ද දායකයන් විශාල කැප වීමක් කළා. එතුමාට ලැබුණු වරමින් එතුමා ගම්පහ දිස්ත්‍රික්කයටත්, රටටත් විශාල සේවාවක් කළා.

මට මතකයි, මගේ පියා දිවංගත ලයනල් ගුණවර්ධන හිටපු නියෝජ්‍ය ඇමතිතුමා සමඟ බොහොම සමීපව, අපේ ගෙවල් දොරවල්වලට ඇවිල්ලා අපත් එක්ක කථා බහ කළ බව. එතුමාගේ වයසයි, අපේ වයසයි ගත්තොත් ලොකු පරතරයක් තිබෙනවා. හැබැයි එතුමා තරුණයකු දැක්කත් බොහොම ළඟට ඇවිල්ලා, කට කොනකින් හිනා වෙලා බොහොම නිහතමානිව තමයි කථා කළේ. වැඩිහිටියකු වශයෙන් එතුමා කෙරෙහි ඕනෑවටත් වඩා ගෞරවයක්, ආදරයක් අපට තිබුණා. එතුමා මහාචාර්යවරයකු වුණත් ගමට ඇවිල්ලා, අපත් සමඟ කථා කරලා, ගමේ කුස්සියට ගිහින්, අඟු පිලට ගිහින්, බත් ටිකක්, කෑම ටිකක් බෙදා ගෙන කන්න තරම් නිහතමානි කෙනකු වුණා. මා කියන්නේ එතුමාව අනිකුත් මහාචාර්යවරුන්ට ලොකු ආදර්ශයක් කියලායි.

අනෙක් පුද්ගලයන්ට මෙවැනි චරිත ඉතාම වැදගත්. සුරවීර මැතිඳුන්ගෙන් අප ලබා ගත් දේවල් අනන්තයි, අප්‍රමාණයි. ඒ නිසාම තමයි අපට අවශ්‍ය වෙලා තිබුණේ එතුමා වෙනුවෙන් වචන කිහිපයකින් හෝ ගුණ කථනයක් කිරීමට. සුරවීර මැතිතුමා මිය ගියේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. අපි දන්නවා, එතුමා ලිව්ව පොත්පත් රාශියක් තිබෙනවාය කියලා. අපි ඒවා කියවා තිබෙනවා. එතුමාගේ දේශන අහලා තිබෙනවා. යම් කිසි සාප්පුවකදී, පුස්තකාලයකදී මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමා ලියපු පොතක් දැක්ක ගමන් ඒක අරගෙන බලන තරමට අපි නැඹුරු වෙලා තිබෙනවා. එතුමා විසින් නිර්මාණය කළ පුස්තකාල අනන්තයි, අප්‍රමාණයි. අපේ තරුණයෝ, අපේ වැඩිහිටියෝ, පාසල් යන දරුවෝ පවා මේ නමට ආදරය කරන මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. අපේ පළාත්වල, අපේ පළාත් පාලන ආයතනවල පුස්තකාලවලට පොතක් පතක් ලබා ගන්නා විට අපේ ප්‍රාදේශීය දේශපාලනඥයෝ පවා මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිඳුන්ගේ පොතක් ඉල්ලන්න පැකිළෙන්නේ නැති බව අපි දන්නවා. එතුමාට ඒ වාගේ බොහොම ළෙන්ගතුකමක්, ළබැඳියාවක් තිබෙනවා. සුරවීර මැතිතුමා මේ රටට ඉතා විශාල මෙහෙවරක් කළා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ අපට ලොකු ශක්තියක් ඇති කර දී තිබෙනවා.

අවසාන වශයෙන් එතුමා අපේ දිස්ත්‍රික්කය වෙනුවෙනුත්, විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙක් හැටියට පක්ෂය වෙනුවෙනුත්, වර්තමාන ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙනුත්, පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙනුත් කළ සේවය වෙනුවෙන් එතුමාට අපේ ගෞරවය පුද කරනවා. ඒ.වී. සුරවීර

මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය බිරිඳ, දූ දරුවන් සහ ඥාතීන් සියලු දෙනාටම මගේ පෞද්ගලික ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 3.19]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨතම පුරවැසියකු විධියට, මහාචාර්යවරයෙක් විධියට පොත් පත් විශාල ප්‍රමාණයක් ලියලා, සාහිත්‍යය සහ සංස්කෘතිය පිළිබඳව හොඳ විශ්ලේෂණ කරලා, ජනතාව අතර තිබෙන වර්ගවාදී ආකල්ප නැති කරන්නට සාහිත්‍යය උපයෝගි කර ගන්න පුළුවන් කියන සංකල්පය ඉස්සරහට ගෙනා නායකයෙක් විධියට ඒ.වී. සුරවීර මැතිතුමාව අපි අද සිහිපත් කරන්නට ඕනෑ.

එතුමාට දරුවෝ හතර දෙනෙකු සිටිනවා. එක දුවක් වෛද්‍යවරියක්. ප්‍රියදර්ශිකා දියණිය වෛද්‍යවරියක් වශයෙන් අදටත් කටයුතු කරනවා. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් තමයි වෛද්‍ය උපාධිය ලබාගෙන තිබෙන්නේ. සුරවීර මැතිතුමා ගැන බොහෝ දෙනෙකු කථා කළා. එතුමා 1930 දී ගම්පහ කොරස කියන ගම් ප්‍රදේශයේදී තමයි ඉපදුණේ. එතුමාගේ නම අලංකාරගේ වික්ටර් සුරවීර. "ඒ.වී." කියන්නේ, "අලංකාරගේ වික්ටර්" කියන එකයි. එතුමාගේ චරිතයත් අලංකාර චරිතයක්. එතුමා විකෘති වුණු චරිතයක් නොවෙයි, සුන්දර, නිහතමානී චරිතයක්. එතුමා සාහිත්‍යයටම ඔබින චරිතයක් බවට පත් වුණා.

එතුමාගේ මරණය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා ශෝක පණිවුඩයක් එව්වා. එම ශෝක පණිවුඩයේ, "මහාචාර්ය ඒ.වී. සුරවීර මහත්මා කළ අගනා මෙහෙවර වඩාත් සුවිශේෂ වන්නේ අධ්‍යාපනයේ ගුණාත්මක භාවය රැක ගනිමින් එය තවත් දියුණු කිරීමට තම දැඩි අවධානය වෘත්තීය ජීවිතයේ අවසානය දක්වා යොමු කළ විශිෂ්ටතමයෙකු වීම නිසායි. නියෝජ්‍ය ඇමතිවරයෙකු වුවත්, විද්වතෙකු මෙන්ම විශිෂ්ඨතම සාහිත්‍යධරයෙකු වූ අභාවප්‍රාප්ත ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය පිළිබඳ මගේ ශෝකය ප්‍රකාශ කරනවා" කියා සඳහන් වුණා. දීර්ඝ ශෝක ප්‍රකාශයෙන් කොටසක් පමණයි මම කියෙව්වේ. ඒ වාගේම සුරවීර මැතිතුමා මේ ගරු සභාවේදී කළ පළමුවෙනි කථාව බැලුවා. එතුමා 1994 නොවැම්බර් 23වන දා තමයි මංගල කථාව කළේ. "මේ උත්තරීතර සභාවේ මගේ මංගල කථාව කිරීමට නැඟී සිටි මේ අවස්ථාවේදී, ඊට හේතු කාරක වූ කීප දෙනකුටත්, ඒ වාගේම පිරිස්වලටත් මගේ කෘතඥතාව පළ කිරීම යුතුකමක් වෙනවා. පළමුවෙන්ම අපේ වර්තමාන ජනාධිපතිතුමියටත්, අග්‍රාමාත්‍යතුමියටත් මගේ ස්තුතිය හිමි වෙනවා. ඊට හේතුව, ප්‍රසිද්ධ දේශපාලනයට, ඒ වාගේම මේ උත්තරීතර සභාවට පිවිසීමේ සැලසුමක් හෝ බලාපොරොත්තුවක් නැතිව සිටි අවස්ථාවක ඒ දෙදෙනාගේ මෙහෙයවීම පිට -ඕනෑකම පිට- තමයි මා ඒ සඳහා ඉදිරිපත් වුණේ" යනුවෙන් කියා තිබෙනවා. එතුමා දේශපාලනයට එන්න බලාපොරොත්තු වෙලාත් නැහැ, සැලසුමක් තිබිලාත් නැහැ. නමුත් බලාපොරොත්තුවක් නැති අවස්ථාවක ඒ අවස්ථාව උදා කරලා දුන්නේ ජනාධිපතිතුමිය බව කියමින් එතුමියටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් එතුමා ස්තුති කරලා තිබෙනවා.

එතුමා කියනවා, "...ගම්පහ දිස්ත්‍රික්කයේ ඡන්දදායක හිතවතුන්ටත් මගේ විශේෂ ස්තුතිය හිමි කළ යුතු වෙනවා. ... ගම්පහ දිස්ත්‍රික්කයේ බුද්ධිමත්, ප්‍රබුද්ධ පිරිසටත් මගේ ස්තුතිය හිමි විය යුතු වෙනවා" කියලා. ඒ වාගේම, එතුමා එතුමාගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් ස්තුතිය පිරිනමනවා. අපත් තරුණ කාලයේයි දේශපාලනයට පිවිසුණේ. 1994 දී අපත් පාර්ලිමේන්තුවේ සිටියා. එදා අපි දැක්කා එතුමාගේ ඡන්ද campaign එක කළේ තරුණ තරුණියන් බව. "අපේ මහාචාර්යතුමා දැන් ඔන්න ඇවිල්ලා ඉන්නවා. අපේ මහාචාර්යතුමා ඉදිරියට ගෙන යන්න ඕනෑ" කියන නිගමනයේ ඉඳිමින් තමයි ඒ අය කටයුතු කළේ. අපි මේ පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් කථා අහනවා. නමුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ස්තුති කරපු අවස්ථා විරලයි. එතුමා පාර්ලිමේන්තුවේ කළ පළමු කථාව එවැනි අවස්ථාවක් විධියට අපි දකිනවා. අද අපි මොනවා කිව්වත් එතුමාට ඇහෙන්නේ නැහැ. නමුත් එතුමාගේ ගුණ සිහිපත් කිරීමට අපට යුතුකමක් තිබෙනවා. ලක්ෂ 210ක විතර ජනතාවක් අතුරින් 225 දෙනකුට අවුරුදු හයකට වතාවක් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මේ ගරු සභාවේ ඉඳගන්න වරම් ලැබෙනවා. ඒකත් එක්තරා වරමක්. එතුමන්ලා මිය ගියාට පස්සේ මේ ගරු සභාවේ ගෞරවය හිමි විය යුතුයි. හැන්සාඩ් වාර්තාවට ඒ ශෝක ප්‍රකාශ යෝජනා යා යුතුයි. එවිට එතුමන්ලාගේ දරුවන්ගේ දරුවන්ගේ දරුවන්ටත් එය බැලීමට අවස්ථාවක් ලැබෙනවා. ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය වෙනුවෙනුත් ශෝක ප්‍රකාශ යෝජනාවක් ගෙන ඒම පාර්ලිමේන්තු සම්ප්‍රදායයක් වාගේම අපගේ යුතුකමක්. ඒ වාගේම එය අපගේ විශාල වගකීමක් විධියටත් මම දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඒ.වී. සුරවීර මැතිතුමා කොළඹ රාජකීය විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබුවා. එතුමාට මහාචාර්ය පදවියකුත් ලැබුණා. එතුමාට විනෝදාංශ අතර එකක් තමයි ජ්‍යෝතිශ කටයුතු කිරීම. එතුමාට ජ්‍යෝතිශය පිළිබඳ විශ්වාසයක් තිබුණා. හැබැයි එතුමා එය විනෝදාංශයක් විධියටයි පාවිච්චි කළේ. ජ්‍යෝතිශය පිළිබඳව තිබුණු දැනුම -ඒ විශ්ව දැනුම- එතුමා ආදායමක් බවට පරිවර්තනය කර ගත්තේ නැහැ. හුඟ දෙනෙක් එය ආදායම බවට පරිවර්තනය කර ගන්නවා. අනාගතය ගැන කරුණු කියලා මුදල් හම්බ කිරීමේ චේතනාවෙන් කටයුතු කරනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ. ඒක තමුන්ගේ වෘත්තිය නේ. ඒකත් එක්තරා වෘත්තියක්. නමුත් ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමා එය පාවිච්චි කළේ වෘත්තියක් විධියට නොව විනෝදාංශයක් විධියටයි කියන එක මතක් කරන්න ඕනෑ. එතුමාගේ කාලයේ ජ්‍යෝතිශය ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ විෂයයක් වශයෙන් උගන්වලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා කුඩා කාලයේ පාඩම් කරලා තිබෙන්නේ මේසයක, මිටි පුටුවක සහ භූමි තෙල් ලාම්පුවක ආධාරයෙන්. ඒ අතින් බලද්දී අපේ දරුවන් කොච්චර වාසනාවන්තද? දැන් ලංකාවේ සියයට 97කට විතර electricity දීලා තිබෙනවා. දැන් කුප්පි ලාම්පු නැහැ. කුප්පි ලාම්පු භූමිතෙල්වලින් දැල්වෙද්දී ඒ නැඟෙන කාබන් ටික ආඝ්‍රාණය කරමින් තමයි ළමයින් එදා පාඩම් කළේ. නමුත් අද වාගේ වස විස, මොටෝ බයිසිකල් 25,00,000ක් ආදිය ඒ කාලයේ තිබුණේ නැති නිසා වායු ගෝලයට එය දරා ගන්න පුළුවන් වුණා. මේ වාගේ කාලයක කුප්පි ලාම්පුව තිබුණා නම් මහා ලොකු ප්‍රශ්නයක් වේවි කියලා මට එක වෙලාවකට හිතෙනවා. ඒකත් අපි සිහියට ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය ගම්පහ දිස්ත්‍රික්කයට කනගාටුවක්. එතුමා බොහොම ශාස්ත්‍රීය කථාවක් පාර්ලිමේන්තුවේදී කරලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ කරපු පළමුවැනි කථාවේදී එතුමා කියපු තවත් විශේෂ කාරණයක් තිබෙනවා. අපේ රටේ ආර්ථිකයට උර දෙන එක සිද්ධාන්තයක් තමයි පොත් පත්. පොත් පත් කියවන්න ජනතාව පුරුදු කරන්න ඕනෑ. දැන් නම් facebook තිබෙනවා; laptop තිබෙනවා; internet තිබෙනවා. අපේ පාඨකයන්ට පහසුවෙන් පොත් පත් කියවීමට, පහසු මිලට පොත් පත් ලබා දීම සඳහා තීරු බදු සහන ලබා දී අඩු මිලට පොත් මුද්‍රණය කිරීමට සහ ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදා තිබෙන බව එතුමා එතුමාගේ කථාවේදී කියනවා. 1994 නොවැම්බර් මාසයේ 23 වැනි දා තමයි එතුමා මේ කථාව කළේ. ඒ ක්ෂේත්‍රය සඳහා duty -free දිය යුතුය කියන මතය එතුමාත් දරා තිබෙනවා. අධ්‍යාපනය

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

ආයෝජනයක් විධියටයි එතුමා දැක තිබෙන්නේ. මොකද, එතුමා අධ්‍යාපන විශේෂඥයෙක්. ඒ විතරක් නොවෙයි. සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ගැනත් එතුමා කථා කරලා තිබෙනවා. "... මේ රටේ ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ඉතාම වැදගත් වන කරුණක්. ඒ ගැන සැලකිය යුතු වෙනවා. නමුත් සුළු ජාතීන් වෙනුවෙන් පමණක් ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම ඒ තරම්ම සාධාරණද කියන එක ගැන කල්පනා කළ යුතු වෙනවා." කියා එතුමා ප්‍රකාශ කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පුවත් පත්වලින් දේශපාලන විවරණ සපයන ලේඛකයකු විදේශ ආධාර ලබා ගැනීමේ ක්‍රම දෙකක් ගැන කියා තිබෙන බව එතුමා කියනවා. එකක් තමයි, “Yes, please!” -"ඔව්, අනේ අපට දෙන්න" කියන ක්‍රමය. අනෙක තමයි “Yes, but...” -"ඔව්, විදේශ ආධාර දෙන්න. අපි ලබා ගන්නවා. නමුත් ඒ කියන කියන ආකාරයට විදේශ ආධාර ලබා ගන්න අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ"- කියන ක්‍රමය. විදේශ ආධාර ගනිද්දී “Yes, please!” නොව “Yes, but...” කියන ක්‍රමය හොඳයි කියන මතය එතුමා දැරුවා.

බලන්න, එතුමාගේ දර්ශනය. මොනවා හෝ දෙන්න ගියාම බොහෝ දෙනකු “Yes, please” කියලා ඉල්ලා ගන්නවා. හැබැයි, කොන්දේසි නැහැ. දෙන කෙනාගේ කොන්දේසිවලට අපි යටත් වෙන්න ඕනෑ. නමුත්, අද අපේ රජය නම් මේ කටයුතු කරද්දී ඒ දේපොළ ලියලා දෙන්නේ නැහැ. ආයෝජන කරන්න පුළුවන්; BOT system එකට වැඩ කරන්න පුළුවන්. ආයෝජන කරලා ඒ ගොල්ලන් ඒ දේපොළ දාලා යන්න ඕනෑ. “Yes, but....” කියන ක්‍රමය අද අතිගරු ජනාධිපතිතුමාත් පිළිගෙන තිබෙනවා. සමහර කාලවල -මා කියන්නේ නැහැ, කොයි කාලයේද කියලා- විවෘත ආර්ථිකය ආපු විගසම “Yes, please” කියන system එක තමයි තිබුණේ. ඒකේ අදහස, ඕනෑ දෙයක් දෙන්න, හැබැයි අපි කොන්දේසිවලට යටත් වෙන්න ඕනෑ කියන එකයි. ඒ වාගේම එතුමා කියලා තිබෙනවා, ලෝක බැංකුව තමයි -මේ රටවල් හත තමයි- ඕනෑ තැනකට අණ දෙන්නේ කියලා, අණ දීමේ න්‍යායක් තිබුණේ කියලා. එහෙම තමයි විදේශ ආධාර ගැනීමේ ප්‍රතිපත්තිය ගැන එතුමා අදහස් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මා මේ අවස්ථාවේ ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමා විශේෂයෙන්ම නූතන ශිෂ්‍ය පරපුරට ආදර්ශවත් නායකයෙක්. සාමාන්‍ය පෙළ සමත් වන තුරුම එතුමා තුළ තිබුණේ, සරල ජීවිතයක්. කොතරම් දේවල් තිබුණත් ගරු සුරවීර මැතිතුමා ළඟ තිබුණු ධෛර්යය වර්තමාන කාලයේ ළමයින්ට බොහොම අඩුයි. ඒ ධෛර්යය ගැන අපි මතක් කර ගන්න ඕනෑ. බොහෝ දෙනකු අද කථා කරන්නේ ලැබුණු දේට වඩා නොලැබුණු දේ ගැනයි. ඉතින් මෙවැනි චරිත අපේ ශිෂ්‍ය ප්‍රජාවට ආදර්ශයක් විධියටයි අපි කවුරුත් දකින්නේ.

ගම්පහ දිස්ත්‍රික්කයේදී එතුමා මාවත් හමු වෙන්න ආවා. ඒ, මමත් ඡන්දය ඉල්ලපු වෙලාවේ. එතුමා එද්දී ශිෂ්‍යයෝ 50දෙනකු පමණ එතුමා එක්ක ආවා. එවකට එතුමා මැදි වියේ කෙනෙක් -තරමක් වයස්ගත කෙනෙක්-. ඒ කෙසේ වෙතත්, එතුමා එක්කගෙන සටනට ආවේ තරුණ පිරිස්. හැබැයි, ඒ ගොල්ලන් දරුණු - violent - නැහැ. බොහොම සාමකාමී, ශික්ෂාකාමී විධියට තමයි ඒ ආපු වෙලාවේත් ඒ අය හැසිරුණේ. ආචාරශීලී වෙලා, "අපේ ගුරුතුමාටත් පොඩි සහයෝගයක් දෙන්න, අපි දෙගොල්ලන් එකට වැඩ කරමු." කියලා යෝජනාවක් කළා.

එතුමා අවසාන වශයෙන් මට හමු වුණේ මා ප්‍රවාහන ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ වැඩ කළ නිලධාරිනියකගේ දුවගේ මඟුල් උත්සවය දවසේයි. එදා මා එක්ක පොඩ්ඩක් කථා කරලා කිව්වා, "මට ඔබතුමා එක්ක photo එකක් ගන්න ඕනෑ" යි කියලා. මා කිව්වා, "අනේ! ඔබතුමා එක්ක අපි photo ගන්න හොඳ නැහැ. ඔබතුමා අපට බොහොම ආදර්ශවත් කෙනෙක්. ෆොටෝ හැම තැනම තිබෙනවා නේ" කියලා. එතුමා කිව්වා, "නැහැ, නැහැ, මාත් එක්ක photo එකක් ගන්න ඕනෑමයි" කියලා. එහෙම කියලා photo එකක් ගත්තා. ඒක මතක් වෙද්දීත් මට දුකයි. මොකද දන්නේ නැහැ, එහෙම කිව්වේ. අපිත් කවදා හෝ ඔය ගමන යන්න ඕනෑනේ. ඒ ගමනට ඉක්මනින් අඩගහ ගන්නද දන්නේ නැහැ. කෙසේ වෙතත්, එතුමා එදා බොහොම ආචාරශීලී විධියට ඒ photo එක ගත්තා. මා දැන් එහි copy එකක් හොයනවා, එතුමාගේ ගෙදර අයට යවන්න. ඉතින් මෙවැනි චරිතත් මේ ගම්පහ දිස්ත්‍රික්කයේ තිබුණා. "ගිලී මලෙත් ඇත දත සුද්දෝ" කියලා කියමනක් තිබෙනවා. වර්තමානයේ දේශපාලනය ගැන කථා කරද්දී හුඟක් දෙනකුට චෝදනා තිබෙනවා. දේශපාලනයට බොහෝ දෙනකු එන්නේ සමාජ සේවය කරන්න හිතා ගෙනයි. අන්තිමේදී බොහෝ දෙනකුගේ පොකැට්ටු නම් බොහොම සශ්‍රීක වෙනවා. නමුත් සමාජ සේවය අතින් කිසිම සශ්‍රීකත්වයක් නැහැ. නිසරු වීමේ ප්‍රතිපත්තියක් තමයි තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම සමාජ සේවය කියන්නේ මොකක්ද කියන එක ගරු සුරවීර මැතිතුමා විද්වතකු වශයෙන් ප්‍රකාශ කරලා තිබෙනවා.

ගරු සූරියප්පෙරුම ආචාර්යතුමාත් ගරු සුරවීර මැතිතුමා ගැන කථා කළා. එතුමා ගරු සුරවීර මැතිතුමාගේ සම කාලීන මිත්‍රයෙක්. එතුමා ගැන බොහෝ දේ කිව්වා. බොහොම ප්‍රශංසාත්මක කථාවක් කළා, එතුමාගේ ඒ සම කාලීන ජීවිතයේ අත් දැකීම් ගැන. අද එතුමාගෙනුත් අපි යමක් ඉගෙන ගත්තා. ගරු සූරියප්පෙරුම මැතිතුමාත් කලකදී අපේ ප්‍රදේශයෙන් ඡන්දය ඉල්ලුවා. ගරු සුරවීර මැතිතුමා එතුමාගේ සම කාලීන මිත්‍රයකු බව දැන ගත්තේ අදයි. නමුත් එතුමාගේ කථාවෙන් පස්සේ මටත් හිතුණා මෙතුමා කොතරම් සාර්ථක පුද්ගලයකු ද කියලා. එතුමාගේ දරුවනුත් බොහොම සාමකාමී අයයි. තාත්තා මේ මේ දේවල් කළා, තාත්තා ලොකු කෙනෙක් කියලා දරුවන්වත් කියන්න කැමැති නැහැ. අපේ තාත්තා පාර්ලිමේන්තුවට ගියායි කියන එක විතරයි කියන්නේ. "අපේ තාත්තා අහවලා, අපේ තාත්තා මෙහෙමයි, මම තමයි පුතා" කියලා කියන්නේ නැහැ. ඊළඟට VIP කියලා ඒ ගොල්ලන් කාර්වල ගහගෙන යන්නේ නැහැ.

හොඳ මනුෂ්‍යයෝ විධියට කථා කරන්න පුළුවන්. ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ භාර්යාව, දූදරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාටම -ඒ වෛද්‍යවරයාට, එතුමාගේ දියණියන් විවාහ වී සිටින බෑණාවරුන්ට- ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මගේ ශෝකය පුද කරනවා. මගේ ආගමේ හැටියට එතුමාට මොක්සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

බුද්ධාගමේ සඳහන් කර තිබෙන්නේ ජීවිතය කියන්නේ "තණ අග තිබෙන පිණිබිඳුවක් වාගේ" කියලායි. කතෝලික ආගමේ සඳහන් කර තිබෙන්නේ "දූවිල්ලෙන් ඉපදුණු අය දූවිලි බවට පත් වෙනවා" කියලායි. කෙසේ කිව්වත් අපි මිය යනවා. මිය ගියාට පස්සේ ඉතිරි වන දේ තමයි තමන් කළ දේවල්, තමන් ගත කළ ජීවිතයේ යහපත් බව, ගුණාත්මක බව. එතුමාගේ ගුණාත්මක බව ගැන කථා කරන්නට පුළුවන් චරිතවත් ජීවිතයක් ගත කිරීම ගැන එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. සමහර අපරාධකරුවන් මැරුණාම මිනිය ගෙදරට ගෙනෙන්නවත් දරුවෝ කැමැති නැහැ. දරුවන්ට ලජ්ජයි. එහෙම චරිතත් තිබෙනවා. මිනිය ගෙදරට ගෙනෙන්න කැමැති නැහැ. එහේම වළ දමන්න කියලා තමයි කියන්නේ. පියා නිසා දුකකුත් තිබෙනවා. කඳුළු එනවා. කඳුළුත් තිබෙනවා. නමුත් dead body එක ගෙදරට ගෙනෙන්න කැමැති නැහැ. අකැමැති ඇයි? ඒ මිනිය ජනතාවට ප්‍රදර්ශනය කරලා ජනතාවගේ ආචාරය ගන්න තරම් සුදුසුකම් ඒ පුද්ගලයා සපුරා නැහැයි කියන එක ගත කළ චරිතය තුළින්ම විද්‍යාමාන වෙලා

තිබෙන නිසා තමයි එහෙම වෙන්නේ කියලා විටෙක හිතෙනවා. මෙතුමාගේ චරිතය එහෙම නොවෙයි. ඉතාමත්ම හොඳ, වටිනා, සුන්දර චරිතයක්.

ගම්පහ දිස්ත්‍රික්කයේ නායකයා වශයෙන් කටයුතු කරන ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා අද පැමිණ නැහැ. ඒ නිසා මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ශෝකයත්, ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ සියලු සංවිධාන වෙනුවෙනුත්, පළාත් සභා, ප්‍රාදේශීය සභා, නගර සභා වෙනුවෙනුත්, සියලුම පාක්ෂිකයන් වෙනුවෙනුත් අපේ කනගාටුව සහ ශෝකය ප්‍රකාශ කරනවා. කියන්න තවත් දෙයක් තිබෙනවා. ඒක මම කියන්නේ නැහැ. කවදා හරි මගේ ජීවිත කථාව ලියද්දී ඒක හෙළිදරව් කරනවා. ඒ, සිදු වුණු අකරතැබ්බයක් ගැනයි. ඒකත් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වුණාට කමක් නැහැ. එතැනදී "අශෝක පීරිස්" කියන නම ඇතුළත් කරන්න. එපමණයි මට ඕනෑ වන්නේ.

අවසාන වශයෙන්, බෞද්ධාගමේ විධියට එතුමාට අජරාමර නිවන් සම්පත් ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

[අ.භා. 3.35]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බෞද්ධාගමට අනුව දැක්වෙනවා, "රූපං ජීරති මච්චානං - නාමගොත්තං න ජීරති" කියලා. මෙය ශුද්ධ කුරානයේ තිබෙනවා, "*Kullu nafsin zaikatul maut*" කියලා. මරණය කියන එක ලෝකවාසී සියලුම මනුෂ්‍යයින්ට, සත්වයින්ට පොදුවේ අයිති දෙයක්. මරණයෙන් බේරුණු බුද්ධිමතෙක් නැහැ; ඥානවන්තයෙක් නැහැ; නායකයෙක් නැහැ. නමුත් කලින් කිව්වා වාගේ රූපය දිරනවා. උඩයප්පන් රාජ් කියන ද්‍රවිඩ ගායකයා ඒක සින්දුවක් මඟින් ලස්සනට කියා තිබෙනවා. එය මෙන්න මෙහෙමයි. "රූපය දිරනා, නාමෙ නොදිරනා අරුමෙකි ශෝභා සංසාරේ." අපි මේ සංසාර ගමනේ තවම යනවා. මහාචාර්ය ඒ.වී. සුරවීර විද්වතාණන් අපෙන් සමු ගෙන සංසාර ගමන කෙළවරේ දැන් ගමන් කරන බව අපට ඒකාන්තයි.

අපේ ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමා පැවසූ ආකාරයට 1994 නොවැම්බර් මස 23වැනි දා තමයි සුරවීර මැතිතුමන් පාර්ලිමේන්තුවේ දී තමන්ගේ මංගල කථාව කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් මංගල කථාවක් කරන වෙලාවට ඒ මන්ත්‍රීවරයාට බාධා කිරීම සිරිතක් නොවෙයි.

නමුත් සුපුරුදු පරිදි බාධා කරන්නට මට සිදු වුණා. එතුමා ඒක ඉතා අගය කළා. "මංගල කථාවකට ඇයි බාධා කරන්නේ?" කියලා ඇහුවේ නැහැ. "සාරධර්මය තිබෙන්නේ කොතැනද කියන එක තමයි අද අපටත් තිබෙන ප්‍රශ්නය" කියලා එතුමා එදා ඇහුවා.

1994 නොවැම්බර් 23වෙනි දින හැන්සාඩ් වාර්තාවේ 625 තීරුවේ එතුමා කියූ කථාව වැඩිදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "අද අපට සාරධර්මය සොයා ගන්නට බැහැ. සාරධර්ම අද අප අතරින් නැති වී ගොස් තිබෙනවා. අප් රටේ සංස්කෘතිය ආරම්භ වූ තැන සිට දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රමයෙන් වර්ධනය වූ සාරධර්ම පද්ධතියක් මිනිසුන් තුළ ගොඩනැගී තිබුණා. ඒ සාරධර්ම ක්‍රම ක්‍රමයෙන් - ටිකෙන් ටික- විනාශ වී ගියා. එයට නොයෙකුත් අංශ හේතු වුණා. ආර්ථික ප්‍රශ්න පමණක් නොවෙයි. හැම කරුණක්ම ඒ සාරධර්ම විනාශයට -සෝදා පාළුවට- හේතු වුණා."

මේ බුද්ධිමතාණෝ එදා පාර්ලිමේන්තුවේ දී එතුමාගේ මංගල කථාවේදීම අප අවදි කළා. සාරධර්මය කියන්නේ මොකක්ද කියලා එහි නිර්වචනය පැහැදිලි කරලා දුන්නා.

ඊට පස්සේ එතුමා සඳහන් කළා, රාජ්‍ය සාහිත්‍ය උත්සව පිළිබඳව. එතුමා සංස්කෘතික හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා වශයෙන් පත් වෙලා ඒ අංශයෙන් මේ රටට විශාල සේවාවක් සිදු කළා.

එතුමා 1994 නොවැම්බර් 23 වෙනි දින කළ කථාව එදින හැන්සාඩ් වාර්තාවේ 626 තීරුවේ මෙසේ සඳහන් වෙනවා:

> "රාජ්‍ය සාහිත්‍ය උත්සවය යැයි කියන්නේ සිංහල සාහිත්‍ය පිළිබඳ උත්සවයක් විතරක් නොවෙයි. සිංහල සාහිත්‍යය, දෙමළ සාහිත්‍යය, ඉංග්‍රීසි සාහිත්‍යය යන මේ සියල්ලම එකට එකතුවිය යුතුයි. මේ අවුරුද්දේ සිට රාජ්‍ය සාහිත්‍ය උත්සවය වැනි දේවල් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන හැම භාෂාවකටම, හැම අංශයකටම පොදු විධියට සලකා කටයුතු කරන්නට දැන් අපි පියවර අරගෙන තිබෙනවා."

එතකොටයි මම නැඟිට්ටේ ගරු සූරියප්පෙරුම මැතිතුමනි. අපි අතර මෙවන් දෙබසක් ඇති වෙනවා. එය එදින හැන්සාඩ් වාර්තාවේ 626 තීරුවේ මෙසේ සඳහන් වෙනවා:

> "අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
> (அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
> (Alhaj A.H.M. Azwer)
> 'දෙමළ සාහිත්‍යය' කියන කොට ඉස්ලාම් සාහිත්‍යයත් එයට අඩංගු කරනවා ද?
>
> ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා
> (மாண்புமிகு பேராசிரியர் ஏ.வீ. சுரவீர)
> (The Hon. Prof. A.V. Suraweera)
> 'ඉස්ලාම් සාහිත්‍යය' කියලා වෙනම සාහිත්‍යයක් නැහැ.
>
> අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
> (அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
> (Alhaj A.H.M. Azwer)
> වෙනම සාහිත්‍යයක් තිබෙනවා. 'ඉස්ලාම් ලිටිරචර්' - Islam literature.
>
> ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා
> (மாண்புமிகு பேராசிரியர் ஏ.வீ. சுரவீர)
> (The Hon. Prof. A.V. Suraweera)
> 'ඉස්ලාම් ලිටිරචර්' කියලා තියෙනවා. නමුත් ඒක තිබෙන්නේ දෙමළ භාෂාවෙන්මයි. නමුත් 'ඉස්ලාම් භාෂාව' කියා අමුතු එකක් නැහැ. "

ඒක අපි පිළිගන්නවා. අදත් පිළිගන්නවා. 'ඉස්ලාම් භාෂාව' කියලා එකක් නැහැ. ද්‍රවිඩ භාෂාව තිබෙනවා. සිංහල, ඉංග්‍රීසි සහ ලෝකයේ අනෙක් භාෂා තිබෙනවා.

තවදුරටත් මා කියන කොටස හැන්සාඩ් වාර්තාවේම සඳහන් වන්නේ මෙසේයි:

> "අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
> (அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
> (Alhaj A.H.M. Azwer)
> නැහැ. නැහැ. සිංහලෙනුත් තියෙනවා. ඉංග්‍රීසියෙනුත් තියෙනවා.
>
> ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා
> (மாண்புமிகு பேராசிரியர் ஏ.வீ. சுரவீர)
> (The Hon. Prof. A.V. Suraweera)
> ඔව්. ඒක හරි. මම එය පිළි ගන්නවා... "

එතුමා එම අවස්ථාවේදී මෙසේත් කියනවා. එය එම හැන්සාඩ් වාර්තාවේ සඳහන් වන්නේ මෙසේයි:

> "ගරු මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා
> (மாண்புமிகு பேராசிரியர் ஏ.வீ. சுரவீர)
> (The Hon. Prof. A.V. Suraweera)
> එය අපි පිළිගන්නවා.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

... ජාතික සමඟිය ඇති කිරීම සඳහා  සංස්කෘතික වශයෙන් බොහෝ දේවල් කරන්නට පුළුවන්. මූලික වශයෙන් දැන් ඒ කටයුතු සෑහෙන දුරට කර තිබෙන බව සඳහන් කරමින්, තමුන්නාන්සේලා සියලු දෙනාටම ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය  අවසන් කරනවා."

මහාචාර්ය සුරවීර මැතිතුමා එදා එලෙසින් සාරධර්ම පිළිබඳව අපට හොඳ අවබෝධයක් ලබා දුන්නා.  සාරධර්ම ගැන කථා කරන විට අපට තව දෙයක් මතක් වෙනවා. ඒ තමයි 'තිරුක්කුරල්' ග්‍රන්ථය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේ මූලාසනයේ සිටියදී මෙය උපුටා දැක්වීම ඉතා කාලෝචිතයි. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ සමාගම මුද්‍රණය කර ඇති වජිර ප්‍රභාත් විජයසිංහගේ කෘතියක් වන "ජීවිතය හැඩ වෙන්න තිරුක්කුරල් කියවන්න" නමැති ග්‍රන්ථයේ සාරධර්ම පිළිබඳව 'තිරුවල්ලුවර්' කොහොමද කියන්නේ කියලා සඳහන් වනවා. 'තිරුක්කුරල්' ග්‍රන්ථයේ සඳහන්ව ඇති දේ  දෙමළ භාෂාවෙන්ම "ජීවිතය හැඩ වෙන්න තිරුක්කුරල් කියවන්න" නැමැති මෙම පොතටත් ඇතුළත් කොට තිබෙනවා.

"மறப்பினும் ஒத்துக் கொளலாகும் பார்ப்பான்
பிறப்புஒழுக்கம் குன்றக் கெடும்"

එහි අර්ථය සිංහල භාෂාවෙන් මෙසේයි :

"අමතකව ගියමුත් - වේද මන්තර සිහිකළැක යළි

කඩකළොත් යහ හැසුරුම් - නැවත කිසිදින ලබා ගනු බැරි"

"වේද ගීතිකා අමතක වුවහොත් ඒවා නැවතත් පාඩම් කොට මතක් කර ගත හැකිය. එහෙත් එම වේදය ගායනා කරන්නහු චාරිත්‍ර ධර්ම කඩ කළහොත්, ඒ හේතුවෙන් නැති වන ඔහුගේ කුල ගර්වය ආයෙත් කිසිදිනෙක ලබා ගත නොහැකිය."

මේ සාරධර්ම, චාරිත්‍ර විධික්‍රම කොයි තරම් අපේ පණ මෙන් ආරක්ෂා කළ යුතුද, ඒවා පිළිගත යුතුද, ඒවා පිළිබඳව මොන තරම් නම් අවබෝධයක් ලබාගත යුතුද කියන එක පිළිබඳව තමාගේ මංගල කථාවෙන්ම මේ සභාවට හෙළි කර දුන්නේ අපේ සුරවීර මැතිතුමන්ය කියන එක අපි අද අමතක නොකළ යුතුයි.

එතුමාගේ අභාවයෙන් පස්සේ ඉතා වටිනා ලිපි පෙළක් සියලුම භාෂාවලින් සියලුම පත්තරවල පළ වුණා.

"අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රැක ගැනීමට, වෘත්තීය ජීවිතයම කැප කළ විශිෂ්ඨයෙක්." කවුද මේ කියන්නේ?

මේ කියන්නේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්.

"මහාචාර්ය ඒ.වී. සුරවීර මහතාගේ අගනා මෙහෙවර වඩාත් සුවිශේෂී වන්නේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රැකගනිමින් එය තව තවත් දියුණු කිරීමට තම දැඩි අවධානය වෘත්තීය ජීවිතයේ අවසානය දක්වා යොමු කළ විශිෂ්ඨයකු වීම නිසා යැයි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සඳහන් කරයි."

මා මුස්ලිම් භක්තිකයකු වශයෙන් හැම විටම එතුමා  මුණ ගැසුණා. මොකද, සංස්කෘතික හා ආගමික කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් එතුමා අපට බොහෝ සේ උදවු කළ නිසා. එතුමා අපේ සංස්කෘතිය අගය කළා.

அஹதியா பாடசாலைகளுக்கு அவர் பல வகைகளிலும் உதவி செய்தார். கம்பஹா மாவட்டத்தில் மாத்திரமல்ல, ஏனைய இடங்களிலும் அவற்றின் வளர்ச்சிக்காக அந்தப் பெரியார் சுரவீர அவர்கள் உதவி செய்தார்  என்பதை இந்த வேளையிலே நான் நன்றியுடன் சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனவே, இப்படியான ஒருவரையே நாங்கள் இன்று இழந்துநிற்கின்றோம்.

මේ මස 20වැනි දා ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාවේදී පැවැති යූ.එල්.එම්. ෆාරුක් චරිතාපදානයේදී "යුග පෙරළියක තුන්කෝරළ අභිමානය" නමින් පොතක් එළි දැක්වූවා. ඒ පොතේ  ඒ.වී. සුරවීර මැතිතුමා පිළිබඳව හොඳ සඳහනක් තිබෙනවා.

එම පොතේ  හැන්සාඩ් වාර්තාවලින් කරුණු උපුටාගෙන මේ විධියට සඳහන් කර  තිබෙනවා:

"1991 මුදල් වර්ෂයේ ප්‍රතිපාදනවලින් රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයේ සෑම දහම් පාසලකටම උපකරණ ලබා දීමට ෆාරුක් ඇමතිවරයා පියවර ගත්තේය. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළත්, ඒ සඳහා සුරවීර මැතිතුමාගෙන් ලැබුණු  උදව් උපකාර එතුමා කවදාවත් අමතක කළේ නැහැ..... ආගම් භේදයකින් තොරව එය ඉටු කෙරිණි. දහම් අධ්‍යාපනය විධිමත් කිරීම පිළිබඳව එවකට සංස්කෘතික ඇමතිව සිටි ඒ.වී. සුරවීර මහතා සමඟ ඉතා දීර්ඝ ලෙස පාර්ලිමේන්තුවේදී විවාද කළේය."

ඒ විවාදවලදී ෆාරුක් මැතිතුමා මේ විධියට කරුණු දක්වා තිබෙනවා.

"දහම් පාසල් අධ්‍යාපනය ලබා දීම ඉතා වැදගත්. හැම පාසලකටම දහම් පාසල් පවත්වාගෙන යන්න උපකරණ නැහැ. හැකියාවක් තිබෙනවා නම් කරුණාකර හැම පාසලකටම ඒ උපකරණ ලබා දෙනවා නම් ඉතා වැදගත්. අපේ මැතිවරණ කොට්ඨාසයේ සියයට අනූපහක්ම ඉන්නේ සිංහල බෞද්ධ ජනතාවයි. ඒකයි මම එහෙම කියන්නේ"

මුස්ලිම් ජාතිකයෙකු වුවද සිංහල බෞද්ධ ජනතාව පිළිබඳව ෆාරුක් මැතිතුමා දැක්වූ සහජීවන ප්‍රතිපත්තිය අන්ත ජාතිවාදී හා ආගම්වාදී දේශපාලනඥයන්ට කදිම ආදර්ශයක් නොවන්නේද?" කියලා මේ පොතේ අහලා තිබෙනවා. එදත්  එතුමා ඒ පිළිබඳව ප්‍රශ්න කර තිබෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නව පණක් දීමේ කාර්ය භාරයට උර දුන් නායකයන් සමඟ හැදුණු වැඩුණු, එතුමන්ලා සමඟ සේවය කළ ඒ.වී. සුරවීර නමැති මෙම විද්වතාණන්, ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයාණන්ගේ අභාවය වෙනුවෙන් මේ සභාව තුළදී අපගේ ශෝකය  පළ කරනවා.

එතුමා ඉතා කීර්තිමත් දේශපාලනඥයෙකු වශයෙන් මේ සභාව තුළ හරියටම අවුරුදු 13යි, මාස 11යි, දින 23 ක් සේවය කළා. He was a very distinguished Member of this House for 13 years, 11months and 23 days.

විශේෂයෙන්ම එතුමා උපකාර කළ අයගේ පමණක් නොවෙයි, සියලු දෙනාගේම සංස්කෘතිය අගය කළා. සියලු දෙනාගේම සංස්කෘතික, ආගමික උන්නතිය පිළිබඳව එතුමා ක්‍රියා කළා.  ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ අපේ හිතවත් බෞද්ධ ජනතාව සමඟත්,  ඔබතුමා වැනි ද්‍රවිඩ නායකයන් සමඟත් එකතු වෙලා,  අපේ මුස්ලිම් ජනතාවගේ  ශෝකයත්  මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

අපේ  ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා කළ යෝජනාව මමත් එක සිතින් පිළිගන්නවා.  සුරවීර මැතිතුමා වෙනුවෙන්  අප විසින් ජාතික උපහාර උත්සවයක් පැවැත්විය යුතුයි. එපමණක් නොවෙයි, එතුමා වෙනුවෙන් මුද්දරයක්ද නිකුත් කළ යුතුයි. මොකද,  එතුමා මේ ලංකා පොළෝ තලයේ පහළ වූ,  අප විසින් එතරම් උපහාර දැක් විය යුතු විශාරද කෙනෙක් වන නිසා.  මට මේ දැන් මතක් වෙනවා,  another person who brought glory to

this country, Mahela Jayawardena, a former captain of our cricket team. I think there is a request to issue a stamp in honour of him. I would also recommend that.

සුරවීර මැතිතුමාණන්ට අප නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.49]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා හිටපු අමාත්‍යවරයකු වන ඒ.වී. සුරවීර මැතිඳුන්ගේ අභාවය පිළිබඳව මේ ගරු සභාවට ඉදිරිපත් වී තිබෙන සංවේගය පළ කරන යෝජනාවට මා එකතු වන්නේ, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යවරයා වශයෙන් පමණක් නොවෙයි. වාමාංශික ව්‍යාපාරයේ නියෝජිතයකු හැටියටත් මගේ අදහස් පළ කිරීමට, මගේ පක්ෂය වූ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් මෙම ශෝක යෝජනාවට එකතු වීමට ඔබතුමා මට අවසර දෙන්න.

සියනෑ කෝරළයේ අද වන තුරු අගය කළ හැකි මහා පාණ්ඩිත්‍යක් දැක් වූ සුරවිරු සාහිත්‍යධරයෙක්, මහා විචාරකයෙක්, භාෂා ඥානයෙන් පිරිපුන් අයෙක් යන මේ සියලු ගුණාංගයන් එකතු වූ ඉතා සුළු පිරිසක් සිටියා නම්, ඔවුන් අතර අපේ සුරවීර මැතිඳුන් ඉමහත් සේ ඔපවත්ව පෙනෙන චරිතයක් හා පෞරුෂයක් බව මා පළමුවෙන්ම කිවයුතු වනවා.

මා අවධාරණය කරන්නට යන්නේ, මේ භාෂා ප්‍රශ්නයක් කියලා එකක් මේ රටේ තිබුණු කාලයක් ගැනයි. අදත් ඒ ප්‍රශ්නය අවසන් වෙලා නැහැ. ඒ ප්‍රශ්නය අවසන් කර ගැනීම සඳහා ගරු ජනාධිපතිතුමා යටතේ මේ ආණ්ඩුව විසින් අපේ අමාත්‍යාංශය ඇති කරලා, ඒ සම්බන්ධව ලොකු උත්සාහයක් ගනිමින් සිටිනවා. එහෙත් මේ භාෂා ප්‍රශ්නය දැවී ඇවිළෙමින් තිබෙන කාලයේ වුණත් අපි කවුරුත් වාගේ එතුමාත් සිංහලයට ආදරය කළා. භාෂාවක් හැටියට සිංහල සාහිත්‍යයටත්, ඒ වාගේම සිංහල සංස්කෘතියටත් එතුමාගේ ජීවන බලය තරමට එතුමාත්, අපි කවුරුත් ආදරය කළා. නමුත් අනෙක් භාෂාවන්ට අනාදරයක් කළේ නැහැ. එතුමා අපට ඉගැන් වූ දෘෂ්ටිය එයයි. අපගේ සිංහල භාෂාවට අපි ගැඹුරු ලෙස ආදරය කරන අතර, එම සාහිත්‍යයේ තිබෙන්නා වූ රසය විඳින අතර, අපගේ සිංහල සංස්කෘතිය අප ආරක්ෂා කරනවා. අනෙකුත් භාෂාවන් කෙරෙහිවත්, අනෙකුත් සංස්කෘතීන් කෙරෙහිවත් අනාදරයක්වත්, අඩු ගෞරවයක්වත් නොදැක්වීමේ විශේෂ ගුණාංගය එතුමා තුළ තිබුණා.

ඇත්තටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් විටින් විට ආරාවුල් වියවුල් ඇති වුණා. ඒවා අතර එකක් තමයි වාමාංශිකයන් සමඟ එකතු වී යා යුතුද නැත්නම් වෙනම යා යුතුද කියන කාරණය. ඒක ඒ දවස්වල එක්තරා විවාදයක්ව තිබුණා. වාමාංශිකයන් සමඟ පමණක් නොවෙයි; සියලු ප්‍රගතිශීලීන් සමඟ රටට ආදරය කරන සියලු දේශප්‍රේමීන් සමඟ එකට යා යුතුය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නායකත්වය ගත යුතුය කියා හිතපු කෙනෙක් තමයි එතුමා. ඒ නිසා එතුමා කෙරෙහි මගේ භක්තිමත් බැඳීමක් තිබුණා. එතුමා ප්‍රශ්න දිහා බැලුවේ සමස්ත වශයෙන්. එතුමා එක්තරා විධියක දාර්ශනිකයෙක්. එතුමාගේ දාර්ශනික ගුණය එතුමාගේ විවිධ රචනා තුළින් හා විවිධ කෘතීන් තුළින් අපට පෙනෙනවා. එතුමාට එබඳු දාර්ශනික ප්‍රඥාවක් තිබුණු බව කවදාවත් ඇඟවෙන්නට ඉඩ නොදෙන ආකාරයට එතුමා තමන්ගේ චර්යාව පවත්වා ගත්තා. ඇත්තටම නිරන්තරයෙන් තමන් කැපී පෙනෙන ආකාරයට, තමන් කිසියම් තැනකදී වඩාත් ඉහළින් පෙනෙන්නට සැලැස්වෙන ආකාරයට ඉන්න එතුමා කැමැති වුණේ නැහැ. නිතරම ඉතාම කුඩාවට පෙනෙන ආකාරයට කොනකට වෙලා ඉන්න තමයි එතුමා කැමැති වුණේ. එතුමාගේ ජීවිතය හරිම පුදුම සරල ජීවිතයක්. එතුමාගේ ජීවිත කථාව මම හුඟක් දැන ගත්තේ එතුමාගේ අවමඟුල් අවස්ථාවේදියි. ඒ අවස්ථාවේ ඒ පිළිබඳව තොරතුරු හුඟක් හෙළි වුණා. එතුමා සරල ජීවිතයක්; ගැමි ජීවිතයක් ගත කළා. ඒ ගැමි ජීවිතය තුළ තිබුණා වූ ඒ රසය එතුමා රැක ගත්තා. ගැමි ජීවිතයේත්, සිංහල සංස්කෘතියේත්, සිංහල සාහිත්‍යයේත් තිබුණු සියලු දෙයක්ම මම දකින හැටියට ජාතික අධ්‍යාත්මයේ මහා බලවත් සාධකයක් වුණා.

එතුමාගෙන් අප පෝෂණය වුණා. අප එතුමාගේ දැනුමෙන් පෝෂණය වී භාෂාවෙන් පොහොසත් වුණා. එතුමාගේ විචාර, එතුමාගේ රසාස්වාදනය සියල්ලෙන්ම අපගේ දැනුම, රසය කිහිප ගුණයකින් වැඩි වුණා. එතුමාගේ දාර්ශනික කරුණුවලින් හා දාර්ශනික අදහස්වලින් අපටත් ආලෝකයක් ලැබුණා. එතුමා නිකම්ම බුද්ධිමතෙක් පමණක් නොවෙයි, මහා ප්‍රඥාවන්තයෙක්. මේ ප්‍රඥාවන්තයාගේ ප්‍රඥාව හැම තැනකමටම විහිදෙව්වා. දේශපාලන බලය ගැන කවදාවත් උනන්දුවක් නොතිබුණු කෙනෙක් එතුමා. මගේ පාර්ලිමේන්තු කාලය -1970 සිට අද වන තුරු- තුළ මට මුණ ගැසුණු අය අතර සිටි දේශපාලන තනතුරක්, දේශපාලන බලයක්, දේශපාලන මන්ත්‍රී ධුරයක්, දේශපාලන වශයෙන් ඇමති ධුරයක්, නිලතලයක් යන මේ කිසිවක් ගැන උනන්දුවක් නොතිබුණු කෙනෙක් එතුමා. එතුමාට ආරාධනය කරලා ඒ වගකීම් ඉටු කරන්නය කියා ඒ ඒ කාල පරිච්ඡේදයන්හි අපේ නායකයන් එතුමාගෙන් කළ ඉල්ලීම නිසා තමන්ගෙන් කෙරෙන්න ඕනෑ යුතුකමක් හැටියට හිතාගෙන ඒ කටයුතු ඉටු කරන්න ඒ තනතුරු දැරුවා විනා තනතුරු ගැන කිසිදු තැකීමක් නොතිබුණු කෙනෙක් එතුමා. එය මා කිව යුතුයි. ඒ ගැන පුදුම අගය කිරීමක් කළ යුතුයි. ඇත්තටම එතුමාගේ චරිතය මහා ආදර්ශවත් චරිතයක්. අපේ අනාගත පරපුරට අපට පෙන්වන්නට අපට දක්වන්නට පුළුවන්, ඒ වාගේම ඉදිරි පරපුරට දැන ගන්නට සලස්වන්නට පුළුවන් ආදර්ශවත් චරිතයක් හැටියට සුරවීර මැතිඳුන් අපට අගය කළ හැකි මහත් වස්තුවක් හා සම්පතක්. මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

එතුමා ජීවත්ව සිටි කාලයේ ලබා දුන්නා වූ සියලු දෙය - එතුමා විසින් ලියන ලද ඒ කෘතීන්, ඒ විචාරයන්, ඒ සාහිත්‍ය පොත පත හරහා- එතුමාගේ අභාවයෙන් පසුවත් සදාතනිකව අපේ රටට, අපේ ජනතාවට සම්පතක්, අපේ රටට දායාදයක් හැටියට ඉතිරි කර ගොස් තිබෙනවා. එම නිසා එතුමාගේ නාමයට මගේ ආචාරය පුද කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 3.57]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ විද්වතෙකුගේ අභාවය පිළිබඳව අපේ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ පෞද්ගලිකව මගේත් ඒ වාගේම මා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේත් ශෝකය මේ සභා ගැබේදී එක්තැන් කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1994 වර්ෂයේ මා මේ පාර්ලිමේන්තුවට එනකොට ඒ.වී. සුරවීර මැතිතුමා නියෝජ්‍ය ඇමතිවරයෙක්. එතුමා සංස්කෘතික විෂය භාර නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත්, මා ස්වදේශ කටයුතු භාර නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත් අප දෙන්නා එක ළඟ පුටු දෙකේ හිටියේ. මේ පාර්ලිමේන්තුවේදී මා ඒ.වී. සුරවීර මැතිතුමා හඳුනන්න කලින්

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

එතුමාව මා හඳුනා ගත්තේ විද්‍යෝදය සරසවියේදීයි. විද්‍යෝදය සරසවියේ එතුමා මගේ ගුරුවරයෙක්. සිංහල භාෂාව පිළිබඳව අපට උගන්වපු, සාහිත්‍යකරණය පිළිබඳ, විචාරය පිළිබඳ අපව දැනුවත් කරපු ප්‍රබුද්ධ ආචාර්යවරයෙකු හැටියට තමයි මම ඒ.වී.සුරවීර මැතිතුමා මගේ ශිෂ්‍ය ජීවිතයේදී හඳුනා ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා තුළ තිබුණු ගැඹුරු චින්තනය, එතුමා තුළ තිබුණු ගැඹුරු සාහිත්‍යකරණය, එතුමා තුළ තිබුණු ගැඹුරු විචාරක ශක්තිය, ගැඹුරු ලේඛන කලාව ඇත්තවශයෙන්ම අපට ශිෂ්‍යයෝ හැටියට හඳුනාගන්නට පුළුවන්කම තිබුණා. මගේ මතකයේ හැටියට රටට ඉතාම වැදගත් පොත් පත් 25කට වැඩි සංඛ්‍යාවක් එතුමාගේ අතින් ලියැවුණා. එතුමා පෙර'පර දෙදිග සාහිත්‍ය විචාරයන් හොඳින් අධ්‍යයනය කරමින් ඒවා ශිෂ්‍ය පරපුර වෙනුවෙන් සමාජගත කළා. ඒ වාගේම වියත්, පරිනත ප්‍රබුද්ධ උගතෙකු, දාර්ශනිකයෙකු, සමාජ ප්‍රශ්න නිවැරදිව දකින්න පුළුවන්කම තිබුණු ගැඹුරු සිතුවිලි තිබුණු, මහා ප්‍රාඥයකු අද සමාජයට අහිමිවෙලා තිබෙනවා. එතුමා තුළ තිබුණු ගැඹුරු සිතුවිලි එතුමාගේ ජීවිතය තුළින් පෙනුණාය කියන එක මා කියන්න කැමතියි. ඉතාම සරල පැවතුම් ඇතිව, කලබල නොවී, විචාරශීලිව, යථාර්ථවාදීව ප්‍රශ්නයක් දෙස බලන්න එතුමාට පුළුවන්කම තිබුණා. ඒ පුළුවන්කම තිබුණේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා පොළවේ පය ගහලා හිටපු දේශපාලනඥයකු හැටියටත්, කලාකරුවෙකු හැටියටත් ජීවත් වූ නිසායි. කලාව තුළින් තමයි එතුමා දේශපාලනයට ප්‍රවේශ වුණේ කියා මා හිතනවා. එතුමාගේ කලා හැකියාවන්, එතුමා සමාජයේ ප්‍රශ්න දෙස බලපු ආකාරය, සමහර සමාජමය විෂමතාවන් වෙනස් කරන්න එතුමා තුළ තිබුණු රුචිකත්වය එතුමා දේශපාලන වේදිකාවට ගෙන ගියා. මා ඉගෙන ගන්නා කාලයේත් එතුමා ඉතාම යථාර්ථවාදී විධියට ප්‍රශ්න දෙස බලපු, සමාජයේ තිබෙන විෂමතාවන් පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරමින් ඒවා වෙනස් කරන්න පැන පාවිච්චි කළ කලාකරුවෙක්. එම නිසා ඒ වාගේ විද්වත් කලාකරුවෙක්, විද්වත් ලේඛකයෙක් ප්‍රවීණ ග්‍රන්ථ කතුවරයෙක්, ඇවිදින පුස්තකාලයක් බඳු හැම අංශයක් පිළිබඳව ගැඹුරු ලෙස ප්‍රවේශ වන්නට හැකියාවක් තිබුණු මහාචාර්ය ඒ.වී. සුරවීරයන් වැනි කෙනෙකු මේ යුගයේ රටට අහිමි වීම බලවත් පාඩුවක්. ඒ.වී. සුරවීර මැතිතුමා අභාවයට පත්වන අවසාන කාලයේත් එතුමා ග්‍රන්ථකරණය අතහැරියේ නැහැ. අවසන් දින කිහිපය තුළත් එතුමා යම් ප්‍රකාශනයක් ලියමින් සිටියාය කියන එක තමයි මා දන්නේ.

හැම විටම පැන එතුමා අතේ තිබුණා. සමාජ සුබසිද්ධිය වෙනුවෙන් ඒ පැන පාවිච්චි කළා. අනාගත පරම්පරාවට සාහිත්‍යය හා කලාව වෙනුවෙන් යමක් එතුමා ඉතුරු කළා. මේ පාර්ලිමේන්තුවේ දී එතුමා යම් වේදනාවකින් කථා කරපු අවස්ථා තිබුණා. ඒක තමයි, මේ වර්තමාන මැතිවරණ ක්‍රමයේ හැටි. බුද්ධිමතෙකුට, පඬිවරයෙකුට, කලාකරුවෙකුට, සාහිත්‍යධරයෙකුට, සුචරිතවාදියෙකුට මේ මැතිවරණ ක්‍රමය තුළ පාර්ලිමේන්තුවට එන්න ඉඩක් නැහැ කියන විශ්වාසය එතුමා තුළ තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්න තුරු මේ සමාජයට පැනෙන් කළ හැකි සේවාව, සාහිත්‍ය තුළින් ඉටු කළ හැකි මෙහෙවර, ග්‍රන්ථකරණයෙන් සමාජයට දිය හැකි පණිවුඩය දෙන එක වැදගත්ය කියන එක තමයි මහාචාර්ය ඒ.වී. සුරවීරයන් කල්පනා කළේ. ඒ වාගේම එතුමා සංස්කෘතික හා ආගමික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා හැටියට හිටපු කාලයේ ඇත්ත වශයෙන්ම මගේ ආරාධනයකට මාතරටත් ආවා. දේශපාලනයට වඩා සාහිත්‍ය හා කලාව පිළිබඳව එතුමා තුළ තිබුණු ගැඹුරු විද්වත් දැනුම සහ අවබෝධය තමයි අපි එදා එහිදීත් ප්‍රයෝජනයට ගත්තේ.

සංස්කෘතික හා ආගමික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා හැටියට මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමා සංස්කෘතික මධ්‍යස්ථාන ගණනාවක් මේ රට පුරා ආරම්භ කළා. අපේ වාසුදේව නානායක්කාර ඇමතිතුමා කිව්වා වාගේ හැම ජන කොට්ඨාසයක් කෙරෙහිම මැදහත් සිතින් බලමින්, ජාති, ආගම්, කුල භේදවලින් තොරව, හැම කෙනෙකුම මුහුණ දෙන සමාජ ගැටලු අපි ජීවත් වන කාලය තුළ විසඳන්නට අපේ පැත්තෙන් සහාය ලබා දිය යුතුයි කියන අදිටන ඇතිව එතුමා ඒ චින්තනය සමාජගත කරන්න හැම විටම වෑයම් කළා. ඒ වාගේම ඔහුගේ සාහිත්‍ය කෘති තුළින්, විචාරයන් තුළින්, දේශන තුළින් එය හැම විටම ප්‍රකාශ කරන්නට එතුමා උත්සාහ ගත්තා. ආචාර්යවරු අද අපිට ඕනෑ තරම් හොයා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම මහා ආචාර්යවරයෙකු කිව හැකි විද්වතෙක් තමයි, ඒ.වී. සුරවීර මැතිතුමා. එතුමා නැති පාඩුව මම හිතන්නේ සාහිත්‍ය ක්ෂේත්‍රයට හුහක් දැනෙන දෙයක්. ඒ කෙසේ වෙතත් එතුමා කරපු සාහිත්‍ය මෙහෙවර ඇත්ත වශයෙන් එතුමා ගැන දීර්ඝ කාලයක් කථා කරන්න, එතුමාගේ චින්තනය ගැන දකින්න, එතුමාගේ බලාපොරොත්තු පිළිබඳව හිතන්න අපට අවස්ථාව සලසා දී තිබෙනවා. එතුමා අප හැර ගියත්, එතුමා මේ පාර්ලිමේන්තුවේ අද නැති වුණත් එතුමා පිළිබඳ අනාගතයේ ඒ සටහන් තබා තිබෙන බව මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා. බුදු දහමේ හැටියට මහාචාර්ය ඒ.වී. සුරවීර මැතිතුමන් හට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ පවුලේ සියලු දෙනා සමඟ ඒ ශෝකය බෙදා ගන්නා බවත් මම මේ අවස්ථාවේ මතක් කරමින් නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of Hon. (Prof.) A.V. Suraweera, ex-Member of Parliament. I shall direct the Secretary-General of Parliament to send copies of the Official Report, Hansard, relevant to the Meeting, to the members of the bereaved family.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The Adjournment Motion is to be moved by the Hon. Alhaj A.H.M. Azwer. Before he starts, will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I propose that the Hon. R. Yogarajan do now take the Chair.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* ගරු ආර්. යෝගරාජන් මහතා *මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Alhaj A.H.M. Azwer, you may proceed now.

## උමාඔය බහුකාර්ය යෝජනා ක්‍රමය
உமா ஓயா பன்னோக்குத் திட்டம்
UMA OYA MULTI-PURPOSE SCHEME

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, I am very happy to address the House when you are in the Chair.

I move,

"A mega-development project that is being implemented in the hill country in this era is the Uma Oya Multi-Purpose Scheme. The beginning of this scheme dates back to 1953 and it had not been completed as successive governments had to change the project plans on five occasions.

But, under the Mahinda Chintana Programme of His Excellency the President Mahinda Rajapaksa, the dream of that project is becoming a reality. It is moved that this Assembly be informed of the following:

i. The purpose of the Uma Oya Multi-Purpose Scheme

ii. The areas covered by it

iii. The benefits accrued to the people through this scheme"

Sir, I **table*** the Sinhala and the Tamil versions of this Motion to be included in Hansard.

***සභාමේසය මත තබන ලද යෝජනාවේ සිංහල හා දෙමළ පරිවර්තන:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட பிரேரணையின் சிங்கள மற்றும் தமிழ் மொழிபெயர்ப்புகள்:*
*Sinhala and Tamil versions of Motion tabled.*

"කඳුකරයේ මෑත යුගයේ ක්‍රියාත්මක වෙමින් පවතින අති දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතියක් වන්නේ උමාඔය බහුකාර්ය යෝජනා ක්‍රමයයි.මේ යෝජනා ක්‍රමයේ ආරම්භය 1953 දක්වා දිවෙන අතර, පැවති රජයයන් පස් වතාවක්ම ව්‍යාපෘති සැලසුම් වෙනස් කිරීමට සිදුවීම නිසා මෙය හරිහැටි ඉටු කිරීමට නොහැකි වී ඇත.

එහෙත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහන යටතේ අද එම යෝජනා ක්‍රමයේ සිහිනය සැබෑ වෙමින් පවතී. මේ පිළිබඳව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මෙම සභාව දැනුවත් කිරීම සුදුසු යැයි මම යෝජනා කරමි.

i. උමාඔය බහුකාර්ය යෝජනා ක්‍රමයේ කාර්යයන්.

ii ඉන් ආවරණය වන ප්‍රදේශ.

iii. ජනතාවට එයින් ලැබෙන ප්‍රයෝජන."

*"மலைநாட்டில் சமீப காலத்தில் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்ற மிகப் பாரிய அபிவிருத்திக் கருத்திட்டமாக விளங்குவது உமா ஓயா பன்னோக்குத் திட்டமாகும். 1953ஆம் ஆண்டு இத்திட்டம் ஆரம்பிக்கப்பட்டு இன்றுவரை நீண்டு செல்வதோடு, ஆட்சியிலிருந்த அரசாங்கங்கள் ஐந்து தடவைகள் கருத்திட்டத்தினை மாற்றியமைத்தமையால் இத்திட்டத்தைச் சீராக நிறைவேற்ற முடியவில்லை.*

*எனினும் கனவாகவிருந்த மேற்படி திட்டம், அதிமேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களின் மஹிந்த சிந்தனை நிகழ்ச்சித்திட்டத்தின்கீழ் இன்று நிறைவேற்றப்பட்டு வருகின்றது. இது பற்றிய பின்வரும் விடயங்கள் தொடர்பில் விழிப்புணர்வூட்டல் பொருத்தமென நான் சபையில் பிரேரிக்கின்றேன்.*

*i. உமா ஓயா பன்னோக்குத் திட்டத்தின் பணிகள்*

*ii. இத்திட்டத்தில் உள்ளடக்கப்படும் பிரதேசங்கள்*

*iii. மக்களுக்கு இதன்மூலம் கிடைக்கும் பயன்கள்"*

Sir, this is a very important irrigation scheme that is going to help a large number of people in this country by supplying water and electricity. It will also enable a large number of people to be resettled in the new areas that will be created as a result of this scheme.

Sir, this country is blessed with natural resources: water, forestry, gem, fish and various other natural produces. We should be happy that this Government is taking steps in the right direction in order to complete not only this irrigation scheme but various other schemes as well. These are the praiseworthy irrigational schemes initiated by this Government and carried forward. Of course, we must pay tribute to our able, affable Minister, the Hon. Nimal Siripala de Silva, under whose leadership, - of course, blessed by His Excellency the President - schemes such as Moragahakanda and Kaluganga Reservoir Project, Yan Oya Project, Diversion of Mahaweli Project, Talpitigala Reservoir Project, Dam Safety and Water Resources Planning Project, Lower Malwathu Oya Multisector Development Project, Deduru Oya Reservoir Project, Kivul Oya Reservoir Development Project, Kubukkan Oya Reservoir Project, Welioya Integrated Development Project, Weheragala

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

Reservoir Project, Menikganga Reservoir Project, Mahaweli Consolidation Project, Morana Reservoir Project, Kalugal Oya Project, Digili Oya Reservoir Project and Gal Oya Navodaya Project, have been implemented.

Sir, I should add a personal note because when the Gal Oya Scheme was started by the late Hon. D.S. Senanayake, my father-in-law, the late Mr. M.M.A. Sameem was recruited as the first storekeeper of the Gal Oya Valley Irrigation Project.

I think the family of the Hon. P. Dayaratna - who is still with us in Parliament - knows that our family resided there and helped the project in a great way. Also, at this moment, my mind goes back to several years where we had Mr. M. M. Ismail, one of the greatest engineers, well-versed in the irrigation system, was in charge of the Gal Oya Development Project.

Then, Sir, the Rideemaliyadda Integrated Development Project and Rambakan Oya Multi-purpose Irrigation Project are also major schemes meant to develop the country like the well-integrated highway network, not only from Colombo to Hambantota or from Colombo to Katunayake but throughout the country. Hon. R. Yogarajan, you, as a person coming from the Plantation Sector, would appreciate the work undertaken by the Government to construct a highway from Colombo to Kandy, which would ease the traffic to a great extent.

Now, Sir, what is "Mahinda Chintana"? This is the "Mahinda Chintana.". The development of the country and bringing back the pristine glory to our motherland is really the "Mahinda Chintana". But, sometimes, the Hon. Members of the Opposition ridicule this because they do not want development in this country; they want destruction. Even yesterday, an Hon. Member brought in an Adjournment Motion. He wanted to take it up early. Our Leader of the House and others present at the Party Leaders' Meeting are large-hearted and permitted it to be taken up. Even before such a scheme is drawn up and presented and the relevant sections repealed, they bring in a Motion; they are putting the cart before the horse. But, anyway it was debated. Yesterday, it was told in plain Sinhala language, තමන්ගේ හැඳුනුම් පත - identity card එක- අලුතින් ලබා ගන්න භය වෙන්නේ මොකටද? ගල්කටස් කාරයෝ තමයි භය වෙන්නේ. මිනිස් ඝාතකයෝ තමයි භය වෙන්නේ. කුඩු කාරයෝ තමයි භය වෙන්නේ. රටට හොරා හුභාක් දේවල් කරන අය තමයි බිය විය යුත්තේ. ජේවීපී එක ඒ අංශයේ නිරන්තර සාමාජිකයන් වන බව අපට කියන්නට සිද්ධ වෙනවා.

Coming back to the Uma Oya Multi-purpose Development Project, Sir, Uma Oya which is one of the major tributaries of the Mahaweli River is the major water source of the Rantambe Reservior. The key objective of the Uma Oya Multi-purpose Development Project is to transfer water from this river to the Lunugamwehera Reservoir and provide for development projects in the Hambantota District. This Project was first drafted by the Central Engineering Consultancy Bureau in 1991.

Sir, I must say a word about the Central Engineering Consultancy Bureau. It is one of the best institutions equipped with knowledgeable people. It is a reservoir of brain - I should say - because they have undertaken several projects successfully and without the aid and assistance of any foreign intelligence or expertise they are able to carry out this project progressively so that the country stands to benefit in a large way.

When the Uma Oya Multi-purpose Development Project proposal was submitted to the Asian Development Bank for financial provisions, it was rejected due to violation of water rights of the people by this trans-basin water diversion and technical inadequacies. When you go for this type of help, sometimes they pick holes so that the aid will not be forthcoming. Then, with the involvement of the Government of Iran - that we must remember - an agreement was signed between the existing Governments of the two countries.

The foundation stone of the Uma Oya Multi-purpose Development Project was laid in Alikota-Ara, Wellawaya, at the auspicious time of 10.00 a.m. on 29th April, 2008 under the patronage of the former Prime Minister, the Hon. Ratnasiri Wickramanayaka - who is a Senior Minister in the House today highly respected by not only the Parliamentarians but people of all segments in the country - and Mr. Meer Rasami, Minister of Economic Affairs and Finance of Iran.

There is a salient feature about this project. Its objectives are very much welcome. There are several objectives of the project including generation of hydropower, irrigation, provision of drinking water, and provision of water for industrial activities providing water for the second international airport at the industrial zone in Hambantota.

මේ දවස් ටිකේ කෑ ගැහුවා, "වැස්ස නැහැ, වැස්ස නැහැ" කියලා. දැන් ඒ ගොල්ලන් මේ සභාවේ නැහැ, වැස්ස නවත්වන්න. ලජ්ජාවටම මේ ගරු සභාවෙන් පැනලා ගිහිල්ලා. විරුද්ධ පක්ෂය වෙනුවෙන් එක්කෙනෙක්වත් නැහැ. එක්සත් ජාතික පක්ෂයෙනුත් නැහැ, දෙමළ ජාතික සන්ධානයෙනුත් නැහැ. Hon. Yogarajan, you are in the Chair, I recognize that, but you are not in your seat here. TNA එකත් නැහැ. අපි මේ රටේ ජීවත් වෙන්න ඕනෑ. අපි මේ රටේ ඉපදුණු මිනිස්සු. මේ රටේ ජලය බීලා ජීවත් වෙන මිනිස්සු. මේ රටේ හැදෙන හාල් ටික කාලා වැඩුණු මිනිස්සු. අපේ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා කියනවා වාගේ හෙරලි, දෙල්, මඤ්ඤොක්කා, බතල, ඉන්නල වාගේ මේ රටේ පොළොවේ වැවෙන දේවල් කාලා තමයි අපි පෝෂණය වෙලා තිබෙන්නේ, අපේ ශරීරය හැදිලා තිබෙන්නේ. එහෙම නම් අපි මැරුණාම වළලන්නේ කොහේද? අපි මැරුණාම New Delhi හෝ, මැලේසියාවේ හෝ, රියාඩ්වල හෝ, පාකිස්තානයේ හෝ අපි වළලන්නේ නැහැ. අපේ රටේමයි අපි වැළලෙන්නේ. ඒක තමයි අපි කියන්නේ ජාති හිතෛෂීභාවය ආරක්ෂා කර ගත යුතුයි කියා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்கள் ஒரு தமிழ் மகனாக இருக்கின்றீர்கள். "நாம் பிறந்த நாடு நமது என்பதறிவோம்; யாருக்கும் நாம் அடிமைப்படோம்" என்று அங்கே பாரதியார் அவர்கள் கூறினாலும் அது இலங்கைக்கும் மிகவும் பொருந்தும்.

இன்று நாம் இருபதுக்கு இருபது கிரிக்கெட் போட்டியில் விளையாடுகின்றோம். දැන් අපි විස්සයි20 ගහනවා. ටෙස්ට් ගහනවා. විස්සයි20 ගැහුවාම අපි දිනනවා. ගිය සුමානයේ එංගලන්තය ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායම අන්ත පරාජයට පත් කළා. නමුත් අපි ගිහිල්ලා දිනලා ආවා. අපේ sling-arm fast bowler ලසිත් මාලිංගගේ නායකත්වයෙන් විස්සයි20 තරගයෙන් දිනුවා. අපේ වීරයෝ, ශූරයෝ. ලංකාවේ වීරයෝ අතිදක්ෂයෝ. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ මහේල ජයවර්ධන වෙනුවෙන් මුද්දරයක් නිකුත් කළ යුතුයි කියා. මීට පෙර ලෝක කුසලානය දිනාපු අර්ජුන රණතුංග මැතිතුමා වෙනුවෙනුත් මුද්දරයක් නිකුත් කළා.

The greatest bowler produced in the cricket world, Muttiah Muralitharan, does not consider himself a Tamil, or a Sinhalese or a Muslim. He carries the flag of Sri Lanka whenever he goes all over the world. This is what we should do. This is what the people who have gone to New Delhi also should do. They must learn patriotism from Mrs. Sushma Swaraj and come. The Hon. R. Sampanthan, the Hon. M.A. Sumanthiran, the Hon. Selvam Adaikkalanathan and others must learn that from India. The Indians always say, "We are Indians". When India and Pakistan play in cricket matches, the Indians say "Jai Hind" and the Pakistanis say "Zindabad". Not a single Indian, whether he be a Hindu, a Muslim, a Keralite or a Kannada, will ever say "Zindabad". They would always say "Jai Hind". ඉන්දියාවට තමයි ඒ ගොල්ලන් ප්‍රණාමය පුද කරන්නේ.

What do these Parliamentarians who have gone to India expect Prime Minister Modi to do? That is high level politics; let them decide. But, they can learn something about patriotism: how we should be patriotic to the country that we are born. We drink the water here; we eat rice and other things produced by the Mother Earth of this country and we will die and be buried here. So, why do you have to go internationally?

Sir, I have a book here well-documented by Mr. M.I.M. Mohideen. He is a well-versed surveyor and the Executive Director of Al-Ceylan Muslim Documentation Centre. In a book, he states, "We are quite aware that the internationalization alone will not bring practical solution to the problems faced by the Muslims in Sri Lanka". He has documented many problems faced by the Muslims and the damages caused to certain places. But, still, he emphasizes the fact that internationalization will not bring any practical solution to the problem faced by the Muslims or, for that matter, the Tamils and the others. It is imperative to work out special programmes and negotiations aimed at providing a durable settlement of our grievances with other communities and the Government, based on the principles of equality and natural justice.

Yesterday, there was a news report in the "Sudar Oli" stating that Mr. Gotabaya Rajapaksa has said that some Muslims here are trying to get international support for terrorism. That cannot be allowed. Our great leaders have taught us self-reliance; to rely on the country that you born and the people with whom you are living. We have lived here for centuries in peaceful coexistence with the Sinhalese. Even today, that is happening. Yesterday or the day before, there was a book-launch at the BMICH on the public life of Mr. U.L.M. Farook titled "යුග පෙරළියක තුන්කෝරළ අභිමානය".

එහිදී අපේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් කිව්වා, සිංහල රජවරු එදා මුස්ලිම් අයව ආරක්ෂා කර ගත්තේ කොහොමද කියලා. විජාතික බලවේග නිසා අවුරුදු 250ක් තිස්සේ ඒ අය දුක් වින්දා. එම නිසා උතුරට වතුර ගෙන යන්න ඕනෑ.

පෙරේදා අපේ අතිගරු ජනාධිපතිතුමා සම්මන්ත්‍රණයක් අමතා කියා තිබුණා, "මගේ ව්‍යායාමය මුළු රටටම ජලය දීමයි" කියලා. ඒ අමාත්‍යාංශය භාර ඇමතිවරයා වශයෙන් අද ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් ඒ වෙනුවෙන් බොහෝ දේවල් කරනවා. පල්ලෙකැලේ ජලාශය ආශ්‍රිත විශාල project එකක් අතිගරු ජනාධිපතිතුමාගේ අද අතින් විවෘත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මහා සංවර්ධනය පිළිබඳ ලියා ඇති විස්තරයක් මට ලැබුණා. "ගිනිකොන වියළි කලාපයේ ජල හිඟය සඳහා අන්තර් ද්‍රෝණි ජල හැරවුම් මඟින් ජලය ලබාගෙන උමා ඔය සිට කිරිඳි ඔය දක්වා හරවා යවනු ලැබේ. මෙය හම්බන්තොට කලාපයේ සංවර්ධනය සඳහා මහෝපකාරී වනු ඇත. ගුවන් තොටුපොළ, වරාය සහ තෙල් පිරිපහදුව මෙම සංවර්ධන යෝජනා තුළ අඩංගු වේ. මේ සඳහා ඉල්ලුමක් පවතී. මේ සියලුම අවශ්‍යතා මෙහිදී හඳුනාගෙන ඇත." කියලා එහි කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙයයි එහි විශිෂ්ටත්වය.

ඉරණමඩු ජලාශය ගැන අද කථා කරනවා. මේ ජලය දෙන්න හදන්නේ කාටද? උතුරටයි. මහවැලි ගඟ උතුරට හරවන්න ඕනෑය කියලා 1947 වර්ෂයේ සිට කථා කළා. ඒ අය එපාය කියා කියනවා. යාපනයේ අයට බවුසර් මඟින් වතුර සැපයීමට උතුරේ අපේ මහ ඇමතිතුමාට දැන් සිද්ධ වෙලා තිබෙනවා. දැන් නම් වැස්ස වහිනවා. ඒ නිසා වියළි ගතිය නැති වෙලා, තෙත්බර පොළොවක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා අපේ වී වගාව කරන්නටත්, අනිකුත් බෝග වර්ග සාරවත් ලෙස වගා කිරීමටත් දැන් අවස්ථාව උදා වී තිබෙනවා.

අද චෝදනා කරනවා වාගේම, එදා මහවැලිය ව්‍යාපෘතිය හදන කොට දිවංගත ගාමිණී දිසානායක මහත්මයාටත් චෝදනා කළා. එතුමා ආසියාවේ තුන්වැනි ධනපතියාය කියලා කිව්වා. එතුමාට ඕස්ට්‍රේලියාවේ ඇපල් වතු තිබෙනවාය කිව්වා: "He owns apple orchards" කියලා කිව්වා. අන්තිමට බලන කොට එතුමාට කිසිම දෙයක් තිබුණේ නැහැ. එතුමා මේ රටේ වැවෙන අඹ ගෙඩියේ රස පමණයි බැලුවේ. එම නිසා මතුවට එවැනි දේවල් සිදු නොවිය යුතුයි. මොකද, අප සියලු දෙනාම එකතු වෙලා අපේ රට හදන්න වුවමනා කරනවා. ඒකට ආණ්ඩුව, විරුද්ධ පක්ෂය කියලා වෙනසක් නැහැ. අන්න ඒ මාර්ගයේ යෑමට අප සියලු දෙනාටම බුද්ධිය පහළ වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අස්වර් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ යෝජනාව මා ස්ථිර කරනවා.

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

ශත වර්ෂයකට ආසන්න කාලයක් ලංකාවේ තිබුණු සිහිනය තමයි, මහවැලි ගංගාව උතුරට හරවනු කියන එක. ප්‍රථම වතාවට, "මහවැලි ගංගාවේ ජලය දකුණට හරවමු" කියලා සටන් පාඨයක් ආවේ 2008 වර්ෂයේ දීයි. මහවැලි ගඟ තමයි ලංකාවේ විශාලම ගංගාව. එය සැතපුම් 205කට වඩා දිගයි. නමුත් ලංකාවේ විශාලම ජල කඳ මුහුදට අරගෙන යන්නේ මහවැලිය නොවෙයි, කළු ගඟයි. දැදුරු ඔයේ සිට නිල්වලා ගඟ දක්වා ගංගා 9ක් පමණ තිබෙනවා. බටහිර, නිරිත කලාපයේ ජලය බින්දුවක්වත් වැඩකට ගන්නේ නැතිව මුහුදට ගලා බසිනවා. මේ පිළිබඳව සංවර්ධනය යොමු වීම තමයි 21වන ශත වර්ෂයේ අපේ රටේ ලොකුම වගකීම වන්නේ. මහවැලියට ගලාගිය උමා ඔයේ ජලය කොටසක් සාධාරණව ගලා යන්න දීලා, ඉතිරි කොටස වැලිමඩ ප්‍රදේශයේ බැම්මක් බැඳලා රඳවලා ජලාශයක් ඇති කරනවා.

ඒ ජලාශයේ ජලය විශාල කන්දකට යටින් වැල්ලවාය පැත්තට ගන්නවා. තමුන්නාන්සේලා පුදුම වෙයි, උමා ඔයෙන් හරවන ජල කඳ අඩි 1000කට වඩා මහා පර්වතයකට යටින්, බණ්ඩාරවෙල, බදුල්ල මහා කඳු යායට යටින් අර ගෙන අනෙක් පැත්තට සැතපුම් විශාල ගණනක් දුරට යනවා. එහෙම ගිහිල්ලා වැල්ලවායෙන් මතු වෙන්න ඉස්සරවෙලා ගල් පර්වතය ඇතුළේදීම විදුලිය නිෂ්පාදනය කරන දැවැන්ත විදුලි බලාගාරයක් හදලා තිබෙනවා. උමා ඔයෙන් හරවන ඒ වතුර බෑවුම සහිතව ඒ පැත්තට ගිහිල්ලා විදුලි බලාගාරය ක්‍රියාකාරී කරලා තමයි වැල්ලවායෙන් එළියට එන්නේ. ඒක කිරිදිඔය දිගේ දකුණු පළාතේ ජලාශවලට යනවා. ඇත්ත වශයෙන්ම මම මේ ගැන ඉතා ඕනෑකමින් හැදෑරුවා. මේක තමයි ලංකාවේ ජල හිඟයක් තිබෙන්නා වූ ලුණුගම්වෙහෙර ප්‍රදේශයට බදුලු ඔයේ ජලය, උමා ඔයේ ජලය අර ගෙන ගිහිල්ලා සශ්‍රීක කරන පළමුවැනි පියවර. මේ සඳහා කටයුතු ආරම්භ කිරීම ගැන මේ ජලාශ පිළිබඳව කටයුතු කරන ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට මගේ ප්‍රශංසාව පිරිනමනවා.

බදුලු දිස්ත්‍රික්කයට මම ගියා. ඌව පළාතේ සෑම තැනකටම එතුමා මාව අර ගෙන ගියා. මට ඒවා පෙන්නුවා. මට මතක් වුණේ එදා මම දුටු බදුල්ල නගරය. ඒ බදුල්ල නගරය නොවෙයි අද තිබෙන්නේ. පුදුමාකාර වෙනසක් වෙලා. විශ්වවිද්‍යාලයක් බිහි වෙලා තිබෙනවා. ගොඩනැඟිලි ආදී දේ සම්පූර්ණයෙන්ම වෙනස්. අවුරුදු තිහකට කලින් තිබුණු බදුල්ල නොවෙයි අද තිබෙන්නේ. ඒක වෙනස් කරලා. බදුල්ල අසල වැලිමඩින් උමාඔය හරවලා ඒ ජලය වතුයාය යටින් අර ගෙන ගිහින් විදුලියත් නිෂ්පාදනය කරලා, අතිරේක ජලකඳකුත් කිරිදිඔය හරහා ලුණුගම්වෙහෙරට ගෙන යාම එසේ මෙසේ ව්‍යාපාරයක් නොවෙයි. ගරු අස්වර් මැතිතුමනි, මේකට ප්‍රසිද්ධිය දුන්නා මදියි. දැන් සටන් පාඨය වී ගෙන යන්නේ "මහවැලි ගඟ දකුණටත් හරවනු" කියන එකයි. වතුර ඔක්කොම ඒ පැත්තට ගියාට කමක් නැහැ. අවශ්‍ය ප්‍රමාණයට වඩා අතිරික්තයක් තිබෙන මහවැලි ජලය විශාල ප්‍රමාණයක් තවම මහ මුහුදට යනවා. අන්න ඒ වතුර ටික දකුණු පළාතට හරවන්න කියන එකයි කියන්නේ. ඒ වීරෝදාර ක්‍රියාව, එඩිතර ක්‍රියාව කිරීමේ පුරෝගාමිත්වය අර ගෙන මේ කටයුතු මෙහෙයවීම ගැන මම ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට -තමන්ගේ දිස්ත්‍රික්කයේ, ඌව පළාතේ මේ වාරිමාර්ග කටයුත්ත කරන එතුමාට- මගේ ගෞරවය පිරිනමනවා.

ඒ එක්කම ගරු අස්වර් මන්ත්‍රීතුමාට මම කියනවා මේ පිළිබඳව ජනතාව දැනුවත් කරලා මදියි කියලා. උමා ඔය කියන එක ගැන සිතියමක් ඇසුරින් බලන්න තවම කවුරුවත් දන්නේ නැහැ. ළමයි එහෙම දන්නේ නැහැ. ලංකාවේ උමා ඔය කිව්වාම ඒක කොහේ ද තිබෙන්නේ, මොකක්ද කියලා පෙන්වන්න ඕනෑ. මේවා නිතරම පෙන්වන්න ඕනෑ. ඒක මහවැලි ගඟේ අතු ගංගාවක්. මහවැලි ගඟ පටන් ගන්නේ කොහෙන්ද කියලා කවුරුවත් දන්නේ නැහැ. ඇහුව හැටියේ කියනවා ශ්‍රීපාද කන්දෙන් කියලා. සම්පූර්ණ වැරදි උත්තරයක්. ශ්‍රීපාද කන්දෙන් මහවැලි ගඟ පටන් ගන්නේ නැහැ. මහවැලි ගංගාව පටන් ගන්නේ කොහෙන්ද? මේකට නිසි පිළිතුර ළමයින්ට උගන්වන්න ඕනෑ. කවි හැදුවාට කමක් නැහැ. "මහවැලි, කැලණි, වලවේ, කළු යන ගංගා, සමනල කන්ද මුදුනේ සිට පැන නැංගා" කියන ඒවා විහිළුවට, කවියට කිව්ව ඒවා. නමුත් භූගෝල විද්‍යාවට ඒක අයිති නැහැ. මහවැලි ගංගාව පටන් ගත්තේ එහෙන් නොවෙයි. ඒ නිසා අපි භූගෝලය උගන්වලා පෙන්වන්න ඕනෑ. මේ ගඟකින් ගලන ජල කඳේ ප්‍රමාණයෙන් කොපමණ ප්‍රමාණයක් මුහුදට යනවාද, කොපමණ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගන්නවාද?

විශාලම ජල කඳ කළු ගඟෙන් මුහුදට ගලාගෙන යනවා. බින්දු කාලක් ප්‍රයෝජනයට ගන්නේ නැතිව ඒ කළු ගඟේ ජල කඳ මුහුදට ගලාගෙන යනවා. මේක ඛේදවාචකයක්. කළු ගඟේ මිරිදිය ජලය නැවක් තෙල් නැවකට මාරු කරන තත්ත්වයක් තව අවුරුදු 10ක් ඇතුළත දී උදා වනවා. පෙට්‍රල් හිඟ වුණාම ඒගොල්ලන් මෙහාට එනවා. මැද පෙරදිග කිසිම ගංගාවක් නැහැ, අතිරික්ත ජල ධාරාවක් තිබෙන. ලංකාවේ අතිරික්ත ජල ධාරාවක් තිබෙන එකම ගඟ තමයි, කළු ගංගාව. ඒ නිසා මේ ගංගා පිළිබඳව අපි අලුත් දර්ශනයකින් හිතන්න ඕනෑ. නමුත් මේ කටයුත්ත කළේ නැහැ. මේක මහා කනගාටුදායක සිද්ධියක්.

මේකේ මොකුත් නැහැ. මේ ගොල්ලන් ඔක්කොම සුද්දෝ වාගෙයි හැසිරුණේ. පළමු වතාවට මහවැලි ගඟේ වතුර දකුණට හරවලා, කොන්ක්‍රීට් වැනි, කඳුකරයේ මහා ගල් පර්වත යටින් ඒ ජල දහරාව අරගෙන ගිහින් එහා පැත්තෙන් වැල්ලවායට යොමු කරලා, එතැන මහා ජල විදුලිබල නිෂ්පාදනාගාරයක් හදලා, විදුලිය නිෂ්පාදනය කරලා දීලා, ලුණුගම්වෙහෙරට නිබඳව ගලන ජල දහරාවක් ලබා දීම විශිෂ්ට ජයග්‍රහණයක්, ගරු අස්වර් මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේ ඉදිරිපත් කළ මේ යෝජනාව බොහොම කාලෝචිතයි. ගරු ඇමතිතුමාගෙන් හා තමුන්නාන්සේගෙන් මා ඉල්ලා සිටිනවා, මෙය ජනප්‍රිය කරන්නය කියා. මොකද, මිනිස්සු මේ ගැන දන්නවා මදියි. ඒ නිසා මේ අවස්ථාවේදී මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන එතුමාට මගේ ප්‍රශංසාව පිරිනමමින් මේ යෝජනාව අනුමත කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදුල්ල ගැන දන්නා, උඩරට ගැන දන්නා ඔබතුමා වැනි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් මූලාසනයේ සිටින අවස්ථාවේ වචනයක් කථා කරන්න ලැබීම සතුටක්. අද අස්වර් මන්ත්‍රීතුමා සුපුරුදු විධියට, ඉතා වටිනා සාරගර්භ අදහස් කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කළා. එතුමාගේ යෝජනාව තුළින් යම් යම් කරුණු කියන්න අපටත් අවස්ථාවක් ලැබුණා. එතුමා උමාඔයෙන් පටන් අරගෙන, අධිවේග මාර්ග හරහා, දුම්රිය මාර්ගය හරහා, නව දිල්ලියට ගිහිල්ලා, එතැනින් ඇමෙරිකාවට, ජිනීවාවලට ගිහින් යනාදී වශයෙන් සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය කළා. විශේෂයෙන් එතුමාට තිබෙන පුළුල් දැනුමත් පළපුරුද්දත් එක්ක, යෝජනාව මොකක් වුණත් එතුමා ලෝකයේ තිබෙන සෑම ප්‍රශ්නයක්ම මේ ගරු සභාවේ අවධානයට යොමු කළා. එතුමා වාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකුගේ කථාවකින් ඉගෙන ගත හැකි යමක් තිබෙනවා නම් අපත් ඉගෙන ගත යුතුයි.

මෙම යෝජනාව තුළින් මතු වන වැදගත් කරුණක් තමයි බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු ඌව ප්‍රදේශයේ තිබෙන මේ ප්‍රශ්න. ඇත්ත වශයෙන්ම මුලින් මේ රටේ මිනිස්සු බොහෝ විට බදුල්ලට ගියේ දුම්රියෙන්. ඒ මිනිසුන්ගේ ජීවිතයේ පණ නල තමයි බදුලු කෝච්චිය. සාපේක්ෂව බලන විට මාර්ග පද්ධතිය නොදියුණු කාලයේත් විශ්වාසයෙන් යුතුව, ආරක්ෂා සහිතව බදුල්ලට යන්න දුම්රිය පාවිච්චි කළා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳින් දන්නවා, මේ රටේ උඩ රට දුම්රිය මාර්ගයේ, -

ප්‍රධාන දුම්රිය මාර්ගයේ- වාගේම පහත රට දුම්රිය මාර්ගයේත් දැන් තිබෙන තත්ත්වය මොකක්ද කියන කාරණය. අද කොළඹ සිට බදුල්ලට ආරක්ෂා සහිතව, විශ්වාසයෙන් යුතුව දුම්රිය ගමනක් යන්නට නොහැකි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. මොකද, ප්‍රධාන දුම්රිය මාර්ගය -උඩ රට දුම්රිය මාර්ගය- සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් නොකළ නිසා නිරතුරුව දුම්රිය පීලි පනිනවා. ඒ වාගේම විශාල වශයෙන් අනතුරු සිද්ධ වනවා. ඒ දුම්රිය මාර්ගයේ වේගයත් සැහෙන්න අඩාළව තිබෙනවා. ඒක ලොකු ප්‍රශ්නයක්. කොළඹ - මාතර මාර්ගයේ සුළු කොටසකට පමණක් යම් ආයෝජනයන් කරලා තිබණත්, අතිවිශාල ජනතාවක් පාවිච්චි කරන කොළඹ - මාතර දුම්රිය සමස්ත දුම්රිය මාර්ගයටම ප්‍රමාණවත් ආයෝජනයක් නොමැතිකම නිසා අද විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අවධානයට ලක් නොවුණු, නමුත් මේ රටේ අනාගතය වෙනුවෙන් අවධානය යොමු කළ යුතුවම ඇති ප්‍රධානතම, වැදගත්ම දුම්රිය මාර්ගයක් තමයි කැලණිවැලි දුම්රිය මාර්ගය. අද මේ රටේ ජනගහනය ව්‍යාප්ත වීම අනුව කැලණිවැලි මිටියාවතෙන් ඔබ්බට හොරණ, කිරිඇල්ල, මතුගම, කලවාන, රත්නපුර දිස්ත්‍රික්කය දක්වාත්, එතැන් සිට දකුණ පළාත දක්වාත් ඇති ප්‍රදේශවල තමයි ඉඩම් තිබෙන්නේ. අද බස්නාහිර පළාතේ ජනතාවට, විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට ගැළපෙන මිලකට ඉඩම් ගන්න බැරි තත්ත්වයක් තුළ ඔවුන් පදිංචිය සඳහා තෝරා ගන්නේ කළුතර දිස්ත්‍රික්කය සහ රත්නපුරය දිස්ත්‍රික්කයයි. නමුත් කැලණිවැලි දුම්රිය මාර්ගයට ඉතාම අඩු අවධානයක් තමයි තිබෙන්නේ. කැලණිවැලි දුම්රිය මාර්ගයේ වේගය ඉතාම අඩුයි. එය වංගු සහිත දුම්රිය මාර්ගයක්. හැබැයි අධිවේගී මාර්ගවලට දක්වන උනන්දුව ඒ දුම්රිය මාර්ගයට යොදන්නේ නැහැ. ලෝකයේ රටක් දියුණු වීමේ ශක්තිය එකට බැඳෙන්නේ දුම්රිය මාර්ග හරහායි. ඉන්දියාව ගත්තොත්, විශේෂයෙන්ම අද ඉන්දියාවේ භාණ්ඩ ප්‍රවාහනය සහ මඟී ප්‍රවාහනය යන දෙකම සඳහා දුම්රියට තමයි බර තබා තිබෙන්නේ. සුව පහසු, ලාභදායක සහ ආරක්ෂාව අතින් ඉහළම ප්‍රවාහන ක්‍රමය තමයි දුම්රිය. අපි බදුල්ලට ගියත් ඒ තත්ත්වයමයි. අපි මාතරයට ගියත් ඒ තත්ත්වයමයි. නමුත් අද වන කොට අවිස්සාවේල්ලෙන් එහාට කැලණිවැලි දුම්රිය මාර්ගය ක්‍රියාත්මක වන්නේ නැහැ. අද එ මාර්ගයේ උදේ වරුවේ දුම්රියක් නැහැ. උදේ වරුවේ පැය කීපයකටවත් කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා දුම්රියක් නැහැ. උදේ වරුවටත්, සවස් වරුවටත් තිබෙන්නේ දුම්රිය කිහිපයක් පමණයි.

අපි දන්නවා, කැලණිවැලි දුම්රිය මාර්ගය කොට්ටාවෙන් හරවා හොරණ හරහා, කිරිඇල්ල හරහා, කලවාන හරහා දකුණ දෙසට ව්‍යාප්ත කරන්න යෝජනාවක් තිබෙන බව. එය ඉතාම විශිෂ්ට, ශ්‍රේෂ්ඨ යෝජනාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ "ගවේෂණ චාරිකා" වැඩසටහන යටතේ අපේ මන්ත්‍රී කණ්ඩායම දුම්රිය දෙපාර්තමේන්තුවට ගියා. එහිදී පැවැති සාකච්ඡාවේදී ඒ නිලධාරින් අපට ප්‍රකාශ කළේ, "කැලණිවැලි දුම්රිය මාර්ගය කොට්ටාව, හොරණ, කිරිඇල්ල, කලවාන ඔස්සේ දීර්ඝ කිරීම පිළිබඳ ඔවුන්ගේ යෝජනාව ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන තිබුණත්, ඒ සඳහා ප්‍රමුඛත්වයක් ලැබෙන්නේ නැහැ, ආයෝජනයක් කෙරෙන්නේ නැහැ" කියලායි. මම හිතන හැටියට ඌව පළාතේ දියුණුව සනාථ කරන්න පුළුවන් හොඳම ක්‍රමය තමයි මේ දුම්රිය මාර්ගය ව්‍යාප්ත කිරීම. උඩරට දුම්රිය මාර්ගය ශක්තිමත් කරලා, අවශ්‍ය පහසුකම් ඇති දුම්රිය මැදිරි සහ නවීන එන්ජින් මේ රටට ගෙන්වලා, දුම්රියේ වේගය වැඩි කළොත් ඌව පළාතේ ජනතාවට ආරක්ෂා සහිතව, අඩු මිලකට තමන්ගේ ගමනා ගමනය සලසා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම යෝජනා වෙලා තිබෙන පරිදි කැලණිවැලි දුම්රිය මාර්ගය දීර්ඝ කර ගන්න ලැබෙනවා නම්, අපට ඒ හරහා මොනරාගල දක්වාම විකල්ප දුම්රිය මාර්ගයක් ඉදි කරන්න පුළුවන්කම ලැබෙනවා. එහෙම වුණොත් මුහුදු බඩ දුම්රිය මාර්ගයේ තිබෙන තදබදය අඩු වනවා. අපට දැන ගන්න ලැබුණා, මුහුදු බඩ දුම්රිය මාර්ගයට තව දුම්රිය යොදන්න අවශ්‍ය නම් දුම්රිය එන්ජින් ඕනෑ, පහසුකම් තිබෙන දුම්රිය මැදිරි ඕනෑ, ඊට අමතරව තව දුම්රිය මාර්ගයක් -තුන්වැනි මාර්ගයක්- අවශ්‍යයි කියලා. හැබැයි පහත රට දුම්රිය මාර්ගයේ -මුහුදු බඩ මාර්ගයේ- තුන්වෙනි මාර්ගයක් ඉදි කිරීමේදී ප්‍රායෝගික අසීරුතා තිබෙනවා. ඒ තත්ත්වය තුළ, ඌව පළාත දියුණු කරන්න උමා ඔය වාගේ වාරිමාර්ග යෝජනා ක්‍රම ගෙනෙනවා වාගේම, මාර්ග පද්ධතිය ශක්තිමත් කරන්න විශේෂයෙන්ම යෝජිත දුම්රිය මාර්ගය ඉදි කිරීම තමයි ඉතාම සුදුසු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්රිය සේවය තමයි මේ රටට අත්‍යවශ්‍යම ප්‍රවාහන පද්ධතිය. මොකද, ඒක ලාභයි; ආරක්ෂිතයි. ඒ වාගේම රටක ප්‍රවාහනය පිළිබඳ බර තියන්න පුළුවන් තැන. ඉස්සර දුම්රිය මත ජනතාව විශ්වාසය තැබුවා. අපි ඉස්සර නුවරඑළියෙන් මල් ටික ගෙන්වා ගත්තේ දුම්රියෙන්. භාණ්ඩ ප්‍රවාහනය විශාල වශයෙන් සිදු වුයේ දුම්රියෙන්. නමුත් අද දුම්රිය මත විශ්වාසය තැබීම නතර වෙලා. ඒ නිසා ඌව පළාත දියුණු කිරීම සඳහා ඒ පළාතේ දුම්රිය සේවය දියුණු කිරීම අත්‍යවශ්‍යයි. ඒ වාගේම මුළු රටේම ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම සඳහා දුම්රිය සේවය සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් අවශ්‍යයි.

අද වන කොට ප්‍රංශයෙන් ගෙන්වපු දුම්රිය එන්ජින් දහයක් සම්පූර්ණයෙන් නතර වෙලා තිබෙනවා. අවුරුදු පනහක්, හැටක් පැරණි දුම්රිය එන්ජින් දුම්රිය දෙපාර්තමේන්තුවේ තිබෙනවා. දුම්රිය සේවයේ ඉන්න දක්ෂ සේවකයෝ ඒවා ප්‍රතිසංස්කරණය කරලා තවම ධාවන තත්ත්වයේ තියාගෙන ඉන්නවා. හැබැයි, ප්‍රංශයෙන් ගෙන්වපු දුම්රිය එන්ජින් දහයම අද ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අද වටිනා දුම්රිය මැදිරි යකඩවලට විකුණනවා. අද ඒ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදී බරපතළ ලෙස දූෂණ හා අක්‍රමිකතා තිබෙනවා. ඒ වාගේම අනෙක් ආයතනවලට සාපේක්ෂව අවශ්‍ය කරන ප්‍රමුඛතාව නොලැබීම නිසා සේවකයෝ පහසුකම් නොමැතිව ඉතාම දුර්වල තත්ත්වයක ඉන්නවා. ඒ අඩු පාඩු අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්රිය සේවයේ ආරක්ෂාව පිළිබඳව වැදගත්ම කාරණයක් තමයි සංඥා පද්ධතිය. අපේ දුම්රිය සේවයේ තිබෙන සංඥා පද්ධතිය හුඟක් යල් පැනපු එකක්. ඒ සංඥා පද්ධතිය නවීකරණය කිරීමට රජය ප්‍රමුඛතාව දිය යුතුයි. විශේෂයෙන්ම උඩරට දුම්රිය මාර්ගයේ. ඒක ඌව පළාතේ ජනතාවට බොහොම වැදගත්. හැබැයි, එහෙම උනන්දුවක් රජයට නැහැ. මෙතරම් හෝ මට්ටමකින් මේ දුම්රිය සේවය පවත්වා ගෙන යන්නේ අපේ සේවකයන්ගේ තිබෙන කැපවීම නිසායි. හැබැයි, මේ රටේ දුම්රිය සේවය දියුණු කිරීම පිළිබඳව රජයට තිබෙන උනන්දුව ඉතාම අඩුයි. මට හිතෙන හැටියට නම් මේ ආණ්ඩුවට දුම්රිය එපා වෙලා. නැත්නම් දුම්රිය සේවය ගැන තැකීමක් නැහැ. "කමක් නැහැ, අවුලක් නැහැ, ඔහොම තිබුණාවේ, ඒක පස්සෙ බලමු" වැනි හැඟීමක් තමයි ඒ ගැන තිබෙන්නේ. එහෙම නැත්නම්, දුම්රිය සේවය දියුණු කිරීමෙන් ඡන්ද ලැබෙන්නේ නැහැ කියලා හිතනවා වෙන්නත් පුළුවන්. මම දන්නේ නැහැ ඒකේ තේරුම මොකක්ද කියලා. හැබැයි, උඩරට පළාතේ දුම්රිය සේවය දියුණු කරනවා කියන්නේ, ඌව පළාතේ දියුණුව. මේ රටේ දුම්රිය සේවය දියුණු කරනවා කියන්නේ, මුළු රටේම දියුණුව. මේ රටේ දුම්රිය සේවය දියුණු කරනවා කියන්නේ, මඟී ප්‍රවාහනයයි, භාණ්ඩ ප්‍රවාහනයයි යන දෙකම අඩු මිලට, කාර්යක්ෂමව කර ගන්න අවස්ථාව ලැබීම සහ මේ මුළු රටම එකම ජාලයක් විධියට සම්බන්ධ වීමයි.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අස්වර් මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී පුළුල් ලෙස මෙම මාතෘකාව විවරණය කරපු ආකාරයට, එයින් තෝරා ගත් එක් ක්ෂේත්‍රයක් වන මාර්ග පද්ධතියට ඇතුළත් වන අධිවේගී මාර්ගවලට අමතරව දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම කෙරෙහිත් ප්‍රමුඛතාව දැක්විය යුතුයි; ප්‍රමුඛ ආයෝජනයක් කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට දියුණු වනවා කියන්නේ, හැම මිනිහාටම මෝටර් රථයක් තිබෙන දවස නොවෙයි. මේ රට දියුණු වනවා කියලා කියන්නේ, පොහොසත් මිනිසුන් පොදු ප්‍රවාහන පද්ධතියේ ගමන් කරන දවසටයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එංගලන්තයේ වාගේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එංගලන්තයේ වාගේ. එංගලන්තයේ පමණක් නොවෙයි, ලෝකයේ සෑම දියුණු රටකම එහෙමයි. පොහොසත් මිනිසුන් දුම්රියේ යනවා, රටේ අගමැතිවරයා දුම්රියේ යනවා, දුම්රිය පාවිච්චි කරනවා, දුම්රිය විශ්වාසයි, දුම්රිය ලාභයි, දුම්රිය ආරක්ෂිතයි. ඒ නිසා මේ රට දියුණුයි කියන්නේ, පරිසරය ආරක්ෂා වුණු, මිනිසුන්ගේ ජීවන වියදම අඩු වුණු, රටේ මිනිසුන්ගේ කාර්යක්ෂමතාව ඉහළ දැමූ, මේ රටේ දුම්රිය මාර්ග පද්ධතිය ඇතුළු පොදු ප්‍රවාහන පද්ධතිය දියුණු වුණු දවසටයි. ඒ නිසා මේ රටේ දුප්පත්, පොහොසත් සියලු දෙනා පොදු ප්‍රවාහන පද්ධතිය පාවිච්චි කරන දවසක් උදා වුණොත්, රටත් දියුණු වනවා, ඌව පළාතත් දියුණු වනවා. බොහොම ස්තුතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගරු අස්වර් මන්ත්‍රීතුමා විසින් උමාඔය බහුකාර්ය යෝජනා ක්‍රමය පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමා මේ යෝජනාව තුළින් බලාපොරොත්තු වන්නේ, උමාඔය බහුකාර්ය යෝජනා ක්‍රමය සම්බන්ධ ව්‍යාපෘතියේ ස්වභාවයත්, එයින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභත්, ඒ වාගේම මේ ව්‍යාපෘතිය නිසා ජනතාව අවතැන් වනවා නම්, ඔවුන්ට යම් හානියක් සිදු වනවා නම්, ඒ පිළිබඳව රජය ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳවත් පැහැදිලි කිරීමක් ලබා ගැනීමටයි. මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ අස්වර් මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වනවා. උමාඔය බහුකාර්ය යෝජනා ක්‍රමය කියන්නේ, මේ දිනවල බදුල්ල දිස්ත්‍රික්කය තුළත්, ඒ වාගේම මොනරාගල දිස්ත්‍රික්කය තුළත් විශේෂ කථා බහට ලක්වන ව්‍යාපෘතියක්. මොකද, අද අපට විශාල චෝදනාවක් තිබෙනවා, බදුල්ලේ වතුර මොනරාගලට ගෙන යනවා කියලා. ඒ චෝදනාව කෙරෙන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේදී පමණයි. හැබැයි, මොනරාගලදී ඒ ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. මොකද, බදුල්ල සහ මොනරාගල කියන දිස්ත්‍රික්ක දෙකේම මෙවර ඌව පළාත් සභා මැතිවරණය පවත්වනවා. බදුල්ලේ තිබෙන ජලය මොනරාගලට ගෙනියලා මේ පැත්ත නියඟයකට ලක් කරනවා කියලා එක් පැත්තක ඡන්ද දායකයින්ව බිය ගන්වනවා. අනෙක් පැත්තට ගිහිල්ලා ඒ ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒ ව්‍යාපෘතිය තුළින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව කිසිම දෙයක් කියන්නේත් නැහැ. ඒ අතින් බලන කොට මේ අවස්ථාවේදී මේ කාරණය දේශපාලනික වශයෙනුත් ජනතාවට වැදගත් කාරණයක්. ඒ නිසා මේ සභා ගර්භය තුළදී මේ පිළිබඳව විස්තරාත්මක පිළිතුරක් ලබා දීමට මම කල්පනා කළා. මොකද, "මහින්ද චින්තනය" හා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" යටතේ අප කරනු ලබන ව්‍යාපෘතිවලින් විශාල සේවාවක් ජනතාවට සිදු වනවා. දීර්ඝ කාලීනව ජනතාවට මුහුණ පාන්න වන විවිධ දුක් ගැහැටවලට පිළියම් එකී ව්‍යාපෘති තුළ ගැබ් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම යම් ව්‍යාපෘතියක් සංවර්ධනය කරන විට ජනතාව අවතැන්වීම, ජනතාව යම් යම් අසීරුතාවන්ට පත් වීම අනිවාර්යයෙන්ම සිදු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාමිණී දිසානායක මැතිතුමා මහවැලි ව්‍යාපාරය පටන් ගන්නා අවස්ථාවේදී කොත්මලේ, ගම්පොල වැනි ප්‍රදේශවල ජනතාව ගම් පිටින්, පවුල් පිටින් දහස් ගණනක් තමන්ගේ පෞරාණික ගම්බිම්වලින් ඉවත් කළ බව ඔබතුමාත් දන්නවා ඇති.

ඉවත් කරලා ඉතාම කර්කශ දේශ ගුණයක් තිබුණු මහඔය, දෙහිඅත්තකණ්ඩිය වැනි ඉතා දුෂ්කර ප්‍රදේශවලට ගම් පිටින් ගෙන ගිහිල්ලා පදිංචි කරවූවා. නමුත් මහවැලි ව්‍යාපාරයෙන් මේ රටට සිදු වූ සේවාව අප කවුරුත් අද අගය කරනවා. එමඟින් සේවාවක් වුණේ නැහැයි කියා කවුරුවත් කියන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂ රජයෙන් කරපු නිසා ඒක වැරැදියි කියලා අප කියන්නේ නැහැ. එමඟින් ජනතාව අවතැන් වුණා කියා අප කියන්නේ නැහැ. ඒ ජනතාවට නැවත අලුත් ගම් බිම් ලබා දීලා, ඔවුන්ගේ ජීවිත සුඛිත මුදිත කරලා, ජාතික ආර්ථිකය ශක්තිමත් කරලා, තමන් හිටපු ගම් බිම්වලට වඩා හොඳ පරිසරයක් ලබා දුන්නා. දැන් ඒ අයගේ දෙවැනි හා තුන්වැනි පරම්පරාවනුත් ඒ භූමිය තුළ සිටිනවා. ඔවුන් ආර්ථික අතින් විශාල වශයෙන් ශක්තිමත් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ, මා ඉතිහාසයෙන් ගෙන හැර පෑවේ එක් උදාහරණයක් පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප දැදුරු ඔය ව්‍යාපෘතිය ආරම්භ කළ අවස්ථාවේදී කථානායක අපේ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා තමයි වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා වශයෙන් සිටියේ. එතුමා එම ව්‍යාපෘතියට මුල් ගල් තබන්නට ගිය අවස්ථාවේ, ඒ ඉඩම් යට වෙනවා, එමඟින් ජනතාවට ලොකු අහේනියක් ඇති වෙනවා කියලා ගල් මුල්වලින් පවා ගැහුවා; වාහන වට කළා; විශාල විරෝධතා ඇති කළා. නමුත් අප ඒ ව්‍යාපෘතිය නිසි ලෙස ක්‍රියාත්මක කළා. දැන් අප එහි ජල කඳ මුදා හැරීමට යන කොට ඒ ප්‍රදේශයේ ජනතාව ප්‍රශංසා කරනවා, ඒ ව්‍යාපෘතිය කිරීම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව බොහෝ විට ක්ෂණිකව යම් යම් කාරණාවලට ප්‍රතිචාර දැක්වූවත් ඒ පිළිබඳව ඔවුන්ට අත් දැකීමෙන්ම යම් යම් දේවල් අවබෝධ වුණායින් පස්සේ තමයි එහි තිබෙන නියම ස්වභාවය දැනගන්න ඔවුනට පුළුවන් වන්නේ. නියම ස්වභාවය දැනගෙන එයින් අත් වන ප්‍රතිලාභ දැනගත්තාට පස්සේ ඔවුන් ඉතාම සතුටට පත් වෙනවා. ඒ නිසා රටේ සංවර්ධනය පිළිබඳව තීන්දු තීරණ ගැනීමේදී එය කොතෙක් දුරට රටේ අනාගත සංවර්ධනය සඳහා උපකාරී වනවාද කියන කාරණය පිළිබඳව අප නිරතුරුව සිතා බලන්න ඕනෑ; අප ඒ ගැන තක්සේරු කරන්න ඕනෑ. විවිධ දේශපාලන හේතූන් මත, පෞද්ගලික හේතූන් මත විරෝධතා එනවා නම් ඒ විරෝධතා ගැන සොයා බලා, ඒවායේ යම් සත්‍යයක් තිබෙනවා නම් ඒවාට පිළියම් සපයලා තමයි අප ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න ඕනෑ. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ මෙන්න මේ කියන ප්‍රතිපත්තිය මුල් කරගෙනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට උදාහරණයක් වශයෙන් ඒ කිව්වේ දැදුරුඔය ව්‍යාපෘතියෙන් අප ලබපු අත් දැකීම් පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ ඒ ප්‍රදේශයට ජලය ලබා ගැනීමට තිබෙන අපහසුතාවයි. ඒ නිසා මොනරාගල දිස්ත්‍රික්කයටත්, බදුල්ල දිස්ත්‍රික්කයටත් වැටෙන වර්ෂාපතනය පිළිබඳව දීර්ඝ වශයෙන් දත්ත විශ්ලේෂණය කරමින්, ඒ සඳහා සුදුසු වූ ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස අතිගරු ජනාධිපතිතුමා අපට නියෝග කළා. ඒ අනුව මේ පිළිබඳව වාරි මාර්ග දෙපාර්තමේන්තුවත්, මහවැලි සංවර්ධන අධිකාරියත් දීර්ඝ කාලයක් තිස්සේ දත්ත විශ්ලේෂණය කළා. ආවාට ගියාට නොව ඉතාම විද්‍යාත්මක ලෙස - in a scientific way - දත්ත විශ්ලේෂණය කරලා අපි උමාඔය ව්‍යාපෘතිය සකස් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ව්‍යාපෘතියක් සකස් කිරීමේදී අපට ඕනෑ විධියටම ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ පාරිසරික නීති පද්ධතියක් තිබෙනවා. මේ රටේ තිබෙන ඒ නීති රීතිවලට යටත්ව තමයි අප ඒ ව්‍යාපෘතිය කරන්න ඕනෑ. අප විශේෂයෙන් පරිසර ඇගයීම් වාර්තාවක් අනිවාර්යයෙන් ලබාගත යුතු වෙනවා.

මේ පරිසර ඇගයීම් වාර්තාව ලබා ගැනීම සඳහා සෑහෙන කාලයක් ගත වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලංකාවේ පරිසරයට අදාළව තිබෙන නීතියේ සුවිශේෂී තත්ත්වයක් තමයි, ඒ පරිසර වාර්තාව පරිසරවේදීන් හා නිලධාරින් විසින්, අති පුළුල් වූ මණ්ඩලයක් විසින් අනුමත කිරීමට පෙර විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල ජනතාවට හා ලංකාවේ ඕනෑම පුද්ගලයකුට එම වාර්තාව පරීක්ෂා කර බලා, එහි තිබෙන කරුණුවල සැක සහිත දෙයක් තිබෙනවා නම්, පරිසරයට හානියක් වෙනවා නම්, ගොවි ජනතාවට හානියක් වෙනවා නම් ඒ සියලු හානි පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කරන්නට, ඒ පිළිබඳව කරුණු දක්වන්නට දවස් 30ක කාලයක් ලබා දීම.

ඒ වාර්තාව සියලු ජනමාධ්‍ය මඟින් අපි ප්‍රසිද්ධ කරලා ඒ වාර්තාවට ලැබෙන ප්‍රතිචාර පිළිබඳව ඔවුන් සමඟ සාකච්ඡා කරලා, ඔවුන් කියන කරුණුවල යම් සත්‍යතාවක් තිබෙනවා නම්, සෑම විටම ඒ පරිසර වාර්තාව අපි වෙනස් කරනවා. පරිසර වාර්තාව අනුව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරවේදීන් විසින් හැම වෙලාවේම කොන්දේසි දමනවා. ඒ නිසා ඒ කොන්දේසිවලට යටත්ව පමණයි, මේ ව්‍යාපෘතියත් ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ. කළු ගඟ ව්‍යාපෘතිය ගත්තත්, මොරගහකන්ද ව්‍යාපෘතිය ගත්තත් එහෙමයි. විශේෂයෙන්ම මොරගහකන්ද ව්‍යාපෘතිය සඳහා විශාල කාලපරාසයක් ගත වුණා. මොකද, මේ පරිසරය පිළිබඳව, එහි තිබෙන ඛනිජ ද්‍රව්‍ය පිළිබඳව, වන ජීවීන් පිළිබඳව, ඒ කැලයේ ජීවත් වුණු කුරුල්ලන් පිළිබඳව පමණක් නොවෙයි, ගඟේ ඉන්න පුංචි මාළුවන් පිළිබඳවත් ඔවුන් සංරක්ෂණය කිරීමේ කටයුතු මොන ආකාරයෙන් කරන්නේද යන කාරණය පිළිබඳවත් දීර්ඝ විශ්ලේෂණයක් කරලා එයින් සිදු වන හානිය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ඒ පරිසර සංරක්ෂණ වාර්තාවේ සඳහන් වුණා.

විශේෂයෙන්ම ජලාශයට යට වන ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා නම්, ඒ ඉඩම් ප්‍රමාණයේ, කැලෑ ප්‍රමාණයේ ගස් පන්ලක්ෂයක් තිබුණා නම්, පරිසර වාර්තාවේ කියා සිටියා, අපි අලුතින් ගස් ලක්ෂ 5ක් ඇළ මාර්ග දිගේ සහ ඒ ප්‍රදේශයේ අනෙකුත් තැන්වල වවන්නට ඕනෑ, ඒ වැවීම සඳහා අවශ්‍ය මුදල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අපි ගෙවන්න ඕනෑ කියලා. විශේෂයෙන්ම දැන් අපි බදුල්ලේ මහියංගනය, නාගදීපය කියන ප්‍රදේශවල ඉන්න ජනතාවට දෙ කන්නයට ජලය ලබා දීම සඳහා ලොග්ගල්ලා ඔය හරස් කරලා විශාල වාරි ව්‍යාපෘතියක් "මොරාන ව්‍යාපෘතිය" නමින් ක්‍රියාත්මක කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි එක කොන්දේසියක් විධියට මොරාන ව්‍යාපාරයේදී යට වන ඒ කැලෑ ප්‍රමාණයේ තිබෙන ගස් ගණන ගණන් කරලා අපට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නියම කළා, මෙන්න මෙච්චර ගස් ප්‍රමාණයක් අලුතින් වගා කරන්නට ඕනෑය කියලා. ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මිලියන මෙච්චර ප්‍රමාණයක් ගෙවන්න ඕනෑය කියලා නියම කළා. එය සහතික කරමින් අපි ඒ අයට ඒ මුදල් ප්‍රමාණය වෙන් කරලා තමයි අපේ ව්‍යාපෘතිය පටන් ගත්තේ. අපේ ව්‍යාපෘතියේ වියදම් අංශයක් හැටියට ඒ ලබා දුන් මුදලත් අපි ඇතුළත් කළා.

මා මේ ගැන දීර්ඝ වශයෙන් කියන්නේ ජනතාව තුළ ඇති කරනු ලබන අනිසි භිය නැති කිරීම සඳහායි. පරිසරය විනාශ කරමින්, කැලෑවල් විනාශ කරමින් අපට මේ කටයුත්ත කරන්න බැහැ. විශේෂයෙන්ම අපේ මහවැලි "එල්" කලාපයේ සම්පත් නුවර, ජනකපුර වාගේ ප්‍රදේශ ඉතා කර්කශ දේශගුණයක් තිබෙන ප්‍රදේශ. ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවට ජලය සැපයීම සඳහා කිවුල් ඔය ජලාශය හදන්නට දැන් අපි පරිසර අනුමැතිය ඉල්ලා තිබෙනවා. මාස ගණනක් තිස්සේ ඒක අපට ලැබෙන්නේ නැහැ. මොකද, මේ යට වන කැලෑ ප්‍රමාණය, මේ ජලාශයෙන් අපිට වගා කරන්න පුළුවන් අක්කර ප්‍රමාණය මේ වාගේ දේවල් පිළිබඳ කුමන සමතුලිතතාවක් ඇති වෙනවාද කියන ප්‍රශ්නය පිළිබඳව ඔවුන් ඉතාම ගැඹුරින් කල්පනා කරලා, විශ්ලේෂණය කරලා තමයි අපට පරිසර අනුමැතිය දෙන්නේ. ළඟදී අපි ආරම්භ කරන ලද මැදවච්චියේ යාන් ඔය ව්‍යාපාරයේදීත් අපට සෑහෙන කාලයක් ගත වුණා, අවශ්‍ය පරිසර වාර්තාව ලබා ගන්න. විශේෂයෙන් ඒ ව්‍යාපෘතිය තුළින් යට වන, අවතැන් වන ජනතාවගේ ප්‍රමාණය වැඩියි කියලා, ඒ යාන් ඔය බැම්මේ උස තිබුණු ප්‍රමාණය අපට අඩු කරන්න කියලා කිව්වා පරිසර වාර්තාව අනුව. එහෙම අඩු කරලා අවතැන් වන ප්‍රමාණය අඩු කරන්න කිව්වා. ඒ අනුව 2,000ක් විතර අවතැන් වෙන්න තිබුණු ප්‍රමාණය ඒ උපදෙස අනුව අපි දෙසිය ගණනකට අඩු කර ගත්තා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යාපෘති සියල්ල සැලසුම් කිරීමේදී අපි අතීතයේදීත්, වර්තමානයේදීත් කරනු ලබන්නේ මෙන්න මෙවැනි ක්‍රමවේදයක්. ඒ ක්‍රමවේදයෙන් අපි කවදාවත් බැහැර වෙන්නේ නැහැ.

ඒ නිසා මේ උමා ඔය ව්‍යාපෘතිය අපි ආරම්භ කරපු දවසේ සිටම වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය විසින් කාලාන්තරයක් තිස්සේ අනුගමනය කරගෙන එන පරිදි, මේ රටේ නීති පද්ධතියට වාගේම පරිසර සුරක්ෂිතතාවට, වන සුරක්ෂිතතාවට එකඟ වෙලා, ඒ කොන්දේසිවලට යටත් වෙලා තමයි මේ කියන කටයුත්ත ඉෂ්ට කළේ. මෙතරම් දීර්ඝ වශයෙන් කථා නොකර, "මේවා සුරකිනවා" කියලා නිකම්ම කිව්වොත් ඒක පිළිගන්න එකක් නැහැ. මේ පරිසර ඇගයීම් පිළිබඳව අපි විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ කාර්ය භාරය අපි මේ උමා ඔය ව්‍යාපෘතියේදීත් සියයට සියයක්ම පිළිපැදලා තිබෙනවා.

මේ ව්‍යාපෘතිය පිළිබඳව කථා කිරීමේදී අපට තිබෙන ප්‍රධාන චෝදනාවක් තමයි බදුල්ලේ ජලය, උමා ඔයේ ජලය අපි වැල්ලවායට ගෙන යනවා කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ගාමිණී දිසානායක මැතිතුමා මහවැලි ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේදී, ඉහළ කොත්මලේ ජලාශයේ තිබුණු ජලය, ඊළඟට මහනුවර ප්‍රදේශයට පතිත වන වැස්ස එහෙම නැත්නම් මහවැලි ගඟේ ජලය තමයි අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කවලට ගෙන ගියේ. ඒ නිසා මේක අමුතු දෙයක් නොවෙයි. අහසින් පතිත වන සෑම ජල බින්දුවක්ම ප්‍රයෝජනයට ගන්න මේ රටේ සෑම ප්‍රදේශයකම ඉන්න ජනතාවට අයිතියක් තිබෙනවා.

ඒ ජල බිංදු පතිත වන ස්ථානයේ සිටින අයට පමණක් නොවෙයි, එයින් පිටත සිටින අයටත් ඒවායේ අයිතියක් තිබෙනවා. නමුත් ඒ ජල බිංදු පතිත වන ස්ථානයේ සිටින අයටත් එහි ප්‍රතිලාභයක් ලැබෙන්නට ඕනෑ. මේ ව්‍යාපෘතිය සකස් කිරීමේදී අපි ඒ ප්‍රතිලාභය ලබා දීලා තිබෙනවා. ඔබතුමා දන්නවා,

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කයේ ඇටැම්පිටිය, හාලිඇල, බණ්ඩාරවෙල, පට්ටියගෙදර, ධයර්බා වාගේ ප්‍රදේශවල ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ ක්‍රමයක් නැති බව. ඒ කඳුකර ප්‍රදේශවලට අපි ජලය ලබා දෙන්නේ කොහොමද? අපි මේ ව්‍යාපෘතිය මඟින් හුදෙක් ඒ ප්‍රදේශයට ජලය ගෙන යනවා විතරක් නොව පානීය ජල ව්‍යාපෘති ගණනාවක් සඳහා ජලය ලබා ගන්නවා. අපි පළමුවෙන්ම කිව්වේ මේ ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සම්පූර්ණ පානීය ජලය දීලා ඉවර වෙලා ඉතිරි යම් ජලයක් වේ නම් ඒවා ඒ පැත්තට ගෙන යන බවයි. එම නිසා මේ ප්‍රදේශයේ ජනතාවට විශාල ප්‍රතිලාභයක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. ඔබතුමා ගියා නම් පෙනෙයි, අපි ජලාශ හදපු තැන්වල weather pattern එක -පාරිසරික ක්‍රමවේදය- හුඟාක් වෙනස් වෙලා තිබෙන බව. විශාල ජලාශයක් තිබෙන විට ඒ අවට ගම්මානවල තිබෙන ළිංවල භූගත ජල මට්ටම ඉහළට එනවා. ජලාශයේ විශාල වශයෙන් වතුර පිරී තිබෙන විට එසේ සිදු වනවා. ඒ වාගේම, පාරිසරික වශයෙන් අලංකාර වෙනවා. සංචාරක ව්‍යාපාරයට අත්වැලක් වෙනවා. ඒ වාගේම, මත්ස්‍ය නිෂ්පාදනය සඳහා එය විශාල වශයෙන් උපකාර වෙනවා. ධයර්බා සහ පුහුල්වත්ත දැවැන්ත ජලාශ දෙකක් සෑදීම තුළින් බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට මා සඳහන් කළ ප්‍රතිලාභ සියල්ලම ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. අපි විශේෂයෙන්ම උමාඔය ධාරා ප්‍රදේශය තුළ මෙතෙක් කල් වැහිලා ගිහින් තිබුණු, පාවිච්චි නොකළ වැව් සියයක් පමණ මේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කර ගෙන යනවා. එම නිසා ඒ ප්‍රදේශවල ගොවීන්ට ගොවිතැන් කිරීමට සහ බිමට ජලය ලබා ගැනීමට අවස්ථාව ලැබෙනවා. උදාහරණයක් වශයෙන් පස්සර ප්‍රදේශය ගනිමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා පස්සර නගරයට ජලය නැති බව. ඒ ප්‍රදේශයට ජල යෝජනා ක්‍රමයක් තිබුණේ නැහැ. අපි මේ උමාඔය ධාරා ප්‍රදේශය යටතේ පස්සරට පුහුල්වත්ත ජලාශය හැදුවා. පුහුල්වත්ත ජලාශය තුළින් අපි දැන් විශාල ජල ධාරාවක් එකතු කරගෙන තිබෙනවා. එම නිසා ජල පිපාසයෙන් පෙළෙන පස්සර ජනතාව සඳහා ජලය ලබා දීමේ අවස්ථාව අපට ලැබෙනවා. ඒ නිසා මේ ව්‍යාපෘතියත් එක්ක සම්බන්ධ වුණු මේ වැඩ කටයුතු තුළින් විශාල ප්‍රතිලාභයක් ඒ ජනතාවට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන ඊළඟ චෝදනාව මෙයයි. උමා ඔය හරස් කරලා මේ විධියට bund එකක් බැඳලා, මේ විධියේ ජලාශ දෙකක් හදලා එහි ජලය - ධයර්බා සහ පුහුල්වත්ත කියන ජලාශවල ජලය- ලංකාවේ ප්‍රථම වරට underground tunnel එකක් හරහා, -භූගත ගුහාවක් වාගේ විශාල tunnel එකකින්- මොනරාගල දිස්ත්‍රික්කයේ අලිකොටආර දක්වා අනෙක් පැත්තට ගෙන යන්නේ. සියලු දෙනාම වැරදි මතයක් දීලා තිබෙනවා, අපි උමා ඔයේ ජලය සියල්ලම ගෙන යනවාය කියලා. එහෙම කරන්නේ නැහැ. ඔබතුමා දන්නවා, පරිසර වාර්තාවේ ඉතා පැහැදිලිව environmental flow කියලා තිබෙන බව. පසු ගිය අවුරුදු 50 තුළ cubic මීටර් කීයක්, එහෙම නැත්නම් average එක කොපමණ ප්‍රමාණයක් පුහුල්වත්ත ජලාශයේ ඉඳන් පහළට ගලාගෙන ගියාද කියලා කියන්න අපි ළඟ එකතු කරන ලද දත්තයන් තිබෙනවා. අපි මේ ජලාශය තැනීමේදී යටින්ම සොරොව්වක් හදලා තිබෙනවා, to ensure that the environmental flow is kept intact - ස්වාභාවිකව හැමදාම ගලා ගෙන ගිය ජල ප්‍රමාණය ඒ ආකාරයෙන්ම ගලාගෙන යාමට ඉඩ දීම සඳහා. ඒක දීලා ඉවරවෙලා තමයි ජලාශයට වතුර එකතු කරන්නේ. ඒ නිසා උමා ඔයේ යම් ජල දහරාවක් බත්මැඩිල්ල, බඳුලුඔය වැනි අනිකුත් ප්‍රදේශවලට ගලා ගියාද, ඒ ජල දහරාව මේ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුවත් ඒ විධියටම ගලා යනවා. ඒ නිසා උමා ඔය ඒ ව්‍යාපෘතිය තුළින් බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට ලැබෙන ජලය කිසිසේත්ම අඩු වෙන්නේ නැහැ. ඒක වැඩි වෙනවා. එහෙම වැඩි වෙන හැටි මා කියා දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - ඔබතුමා දන්නවා ඇති - අපි ඒ පිළිබඳව ගණන් බැලුවා. අවසානයේදී කිසිදු ප්‍රයෝජනයක් ගන්නේ නැතිව උමා ඔයෙන් අති දැවැන්ත ජල ප්‍රමාණයක් මුහුදට ගලා යනවා. ඒ විශාල ජල ප්‍රමාණය අපි පාවිච්චි කරන ජල ප්‍රමාණය වාගේ හතර ගුණයක් වෙනවා. Uma Oya drains 217.6 million cubic metres - mcm - of water annually at the dam site, out of which 145 mcm will be diverted to the Kirindi Oya Basin. මෙතැනදී ද්‍රෝණි දෙකක් අතර - උමා ඔය ද්‍රෝණිය සහ කිරිඳි ඔය ද්‍රෝණිය අතර - විශාල පරතරයක් තිබෙනවා. උමා ඔය ද්‍රෝණිය තිබෙන්නේ ඉහළ මට්ටමක. කිරිඳි ඔය ද්‍රෝණිය තිබෙන්නේ පහළ මට්ටමක. ඉහළ මට්ටමේ සිට පහළ මට්ටමට ගෙන යන කොට සාමාන්‍යයෙන් යන ජල දහරාවට යන්න දීලා කිලෝ මීටර් 20ක පමණ භූමිය ඇතුළෙන් හදන භූගත tunnel එකෙන් mcm145ක පමණ වතුර ප්‍රමාණයක් අපි අලිකොටආරට ගෙන යනවා. එතකොට වැසි කාලයේදී එකතු වන විශාල අතිරික්ත ජල ප්‍රමාණයත් තවදුරටත් මේ වැව්වල රැඳී පවතිනවා. එතකොට වෙනදාට වඩා ජල ප්‍රමාණයක් අපට බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවටත් මුදා හරින්න පුළුවන්. ඒ නිසා මේ දිස්ත්‍රික් දෙකටම විශාල ප්‍රතිලාභයක් ලැබෙන අයුරින් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ව්‍යාපෘතිය සකස් කරලා තිබෙන්නේ.

එපමණක් නොවෙයි. For the first time in Sri Lanka, we are building an underground power station. පොළොවෙන් හැතැක්මක් යට භූගත power station එකක් හදනවා. මේ තුළින් ජාතික ජල විදුලි පද්ධතියට විශාල විදුලිය ධාරිතාවක් අපි එකතු කරනවා. The figure is here. So, I will read it out. ඒ වාගේම මේ විදුලි ජනනය තුළින් ලබා ගනු ලබන මුදලත් අපි ඒ ණය ගෙවීම සඳහා වියදම් කරනවා. It will generate 231 gigawatts - GW - annually. වර්ෂයකට ගිගා වොට්ස් 231ක විදුලි බලයක් අපි නිපදවනවා. ඒ විදුලිය ප්‍රමාණය විදුලිබල මණ්ඩලයට විකුණුවාම ඒ ලැබෙන ආදායමෙන් අපට අපි ලබා ගත් ණයෙන් කොටසක් ගෙවන්න පුළුවන්. අපි කළු ගඟ සහ මොරගහකන්ද ජලාශවල ඒ ව්‍යාපෘති දෙකත් සකස් කරලා තිබෙන්නේත් ඒ විධියටම එයින් උත්පාදනය වන විදුලියෙන් ලැබෙන ආදායමෙන් ණය මුදලෙන් කොටසක් ගෙවීමට හැකි වන පරිදියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම දීර්ඝකාලීනව කල්පනා කරලා, ඉතාම සැලසුම් සහගත ලෙස අපි මෙය සකස් කර තිබෙනවා.

එපමණක් නොවෙයි. විශේෂයෙන්ම ඔබතුමා දන්නවා, පුහුල්වත්ත සිට බඳුලුඔය දක්වා තවත් කිලෝ මීටර් 50ක විතර විශාල පරාසයක් තිබෙන බව. වැසි කාලයේදී විශාල ජල ප්‍රමාණයක් එතැනිනුත් උමා ඔයට එකතු වෙනවා. එතකොට ඒ ජලයට මොකද කරන්නේ? ජනතාව ඉල්ලා සිටියා, තල්පිටිගල යන ස්ථානයේත් රණල්ල කියන ස්ථානයේත් පල්ලෙහායින් තවත් ජලාශ දෙකක් සාදා දෙන්නය කියලා. ජනතාව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ගැන එකඟ වුණේ මේ ජලාශ දෙක සාදා දෙනවාය කියන කොන්දේසිය මතයි. අපි විදේශ ආධාර අරගෙන ඒ ජලාශ දෙක නිර්මාණය කිරීමට කටයුතු කර තිබෙනවා. දැන් ඒ පරිසර වාර්තා අනුමත වෙලා තිබෙනවා. ඉදිරියේදී ඉතා ඉක්මනින්, එනම් ලබන ජනවාරි මාසය වන විට තල්පිටිගල ජලාශයේ ඒ වැඩ කටයුතු ආරම්භ කරනවා. ඒ නිසා බත්මැඩිල්ල සහ කන්දකැටිය යන ප්‍රදේශවල ගොවි ජනතාවට කන්න දෙකම වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් උමා ඔය ව්‍යාපෘතිය යටතේ ලැබෙන බවත් මම ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂයෙන්ම වියළි කලාපයක් වන මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාව සඳහා අලිකොට ආර ජලාශය, කුඩාඔය ජලාශය, හඳපානාගල ජලාශය වශයෙන් ජලය ගබඩා කිරීම සඳහා විශාල ජලාශ තුනක් හදනවා. කිලෝමීටර් 78ක් දිග ඇළ මාර්ග පද්ධතියක් ඉදි කරනවා. කුඩා වැව්, ඇළ මාර්ග සහ ඉඩම් සංවර්ධනය වෙනවා. අනෙකුත් යටිතල පහසුකම් දියුණු වෙනවා. ඒ වාගේම දැනට පවතින වැව් 120 යටතේ ඒවාට වැඩිපුර ජල ධාරිතාවක් ලබා දීලා ඉඩම් අක්කර 3,200කට වාරි ජලය සපයනවා. නව ඉඩම් අක්කර 11,000කට වාරි ජලය සැපයෙනවා. ඒ නිසා මොණරාගල දිස්ත්‍රික්කයේ දුප්පත්කම පිළිබඳව - දිළිඳුභාවය පිළිබඳව; දරිද්‍රතාව පිළිබඳව- පෝස්ටර් ගහලා වැඩක් නැහැ, කථා කරලා වැඩක් නැහැ. ඒ ජනතාව ප්‍රායෝගිකව දරිද්‍රතාවෙන් ගොඩ ගැනීම සඳහා අපි යමක් කරන්න ඕනෑ. මහින්ද චින්තනය හා අපේ රජයේ වැඩ පිළිවෙළ කියන්නේ ඒ ජනතාව දරිද්‍රතාවෙන් ගොඩ ගැනීම සඳහා සක්‍රිය දායකත්වයක් ලබා දීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණාට පස්සේ ඒ කියන සක්‍රිය දායකත්වය මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාවටත් ලැබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

අපට මේ තුළින් ඒ ප්‍රදේශවල විශාල වශයෙන් රැකී රක්ෂා අවස්ථා ඇති කරන්න පුළුවන් වෙලා තිබෙනවා. පුහුල්පොළ, වැලිමඩ වාගේ ප්‍රදේශවල දෙතුන්දහසක පිරිසකට රැකී රක්ෂා ලැබිලා තිබෙනවා. අලිකොට ආර සහ තවත් ප්‍රදේශවලට අවුරුදු 5ක කාල සීමාවක් තුළ දෙතුන්දහසක රැකී රක්ෂා අවස්ථා උත්පාදනය වෙලා තිබෙනවා. වෙළෙඳ ව්‍යාපාර ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටේ විරැකියාව තුරන් කිරීම සඳහාත් මේ ව්‍යාපෘතිය සුවිශේෂී වශයෙන් අපට උපකාරී වෙනවා. අතිගරු ජනාධිපතිතුමාට දක්වන විශේෂ අනුග්‍රහයක් හැටියට ඉතාම සහනදායී කොන්දේසි මත සියයට දශම 5ක පොලියක් මත ඉරාන රජය මඟින් තමයි මේ ණය මුදල් අපට ලබා දුන්නේ.

මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමා විසින් මේ ව්‍යාපෘතිය ලබා ගැනීම සඳහා කරන ලද මෙහෙය මතක් නොකළොත් ඒක මදිකමක් කියා මා හිතනවා. අපට මෙම ව්‍යාපෘතිය ලබා දීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. අපේ දිස්ත්‍රික්කයේ මැතිවරණ ව්‍යාපාරයේත් මේ දිනවල නිතර කථා බහට ලක් වන මේ කාරණය පිළිබඳව ප්‍රශ්න නඟලා බදුල්ල දිස්ත්‍රික්කයේ හා මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවේම ජනතාවට මාගේ නායකත්වය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන මේ ව්‍යාපෘතිය පිළිබඳව හොඳ අවබෝධයක් ලබා දීමට අවස්ථාවක් ලබා දීම ගැන මම අස්වර් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, ඒ පිළිබඳව මගේ සතුට ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.19 ට, 2014 සැප්තැම්බර් 09 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 5.19 மணிக்கு பாராளுமன்றம், 2014 செப்ரெம்பர் 09, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 5.19 p.m. until 1.00 p.m. on Tuesday, 09th September, 2014.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.